1964, நவம்பர் 20, வெள்ளிக்கிழமை

*Friday, 20th November 1964*

---

ප්‍රකාශනයට අනුකූලව පූ. භා. 9.43 ට මන්ත්‍රී මණ්ඩලය රැස්විය. කථානායක තුමා [ගරු හියු ප්‍රනාන්දු] මූලාසනාරූඪ විය.

பிரகடனத்தின்படி சபை, மு. ப. 9.43 மணிக்குக் கூடியது. சபாநாயகர் அவர்கள் [கௌரவ ஹியூ பெர்ணண்டோ] தலைமை தாங்கினர்.

*Pursuant to Proclamation the House met at 9.43 a.m.,* MR. SPEAKER [THE HON. HUGH FERNANDO] *in the Chair.*

---

**කථානායකතුමා**

*(சபாநாயகர்)*

(Mr. Speaker)

ගරු මන්ත්‍රීන් දූන් පාර්ලිමේන්තු ශාලාවට යා යුතුයි.

ගරු මන්ත්‍රීන් පාර්ලිමේන්තු ශාලාවට ගොස්, ආපසු පැමිණ—

රැස්වීම අ. භා. 2 වන තෙක් තාවකාලිකව අත් සිටුවා නැවත පවත්වන ලදී.

அமர்வு பி.ப. 2 மணிவரை இடைநிறுத்திவைக்கப் பெற்று, மீளக்கூடியது.

*The Sitting was suspended until 2* P.M. *and then resumed.*

## අග්‍රාණ්ඩුකාර තුමාගෙන් ලත් සංදේශය

மகா தேசாதிபதியிடமிருந்து வந்த செய்தி

MESSAGE FROM THE GOVERNOR-GENERAL

**කථානායකතුමා**

*(சபாநாயகர்)*

(Mr. Speaker)

අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ ගෙන් ලැබී තිබෙන සන්දේශයක් මම දූන් කියනව:

" යොමුව : 1964 නොවැම්බර් 12.

අංක සී. 21/1964.

මහත් මයාණනි,

1946 යේ ලංකා (ආණ්ඩුක්‍රම) රාජඥාවේ 36 (2) වැනි වගන්තිය ප්‍රකාර, පහත සඳහන් ආකාරයට නම් කරන ලද ව්‍යවස්ථා කෙටුම්පත් වලට මහා රාජිනීන් වහන්සේගේ ශ්‍රී නාමයෙන් මම අද දින අනුඥාව දුන් බව ගෞරව පූර්වකව ඔබට දන්වමි.

1. An Act to amend the Co-operative Societies Ordinance.
2. An Act to amend the Land Acquisition Act and to provide for the dismissal of certain appeals preferred under that Act.
3. An Act to provide for the establishment of a Water Resources Board, and to make provision for matters connected therewith or incidental thereto.
4. An Act to amend and consolidate the law relating to trade marks.
5. An Act to amend the Salt Ordinance.
6. An Act to amend the Agricultural and Industrial Credit Corporation Ordinance.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

7. An Act to amend the Bank Debits Tax Act, No. 42 of 1957.
8. An Act to amend the School Teachers Pension Act.
9. An Act to amend the Public Service Provident Fund Ordinance.
10. An Act to validate certain assessments of profits tax made upon executors in respect of profits tax payable by deceased persons prior to the date of their death and to validate payments and recoveries of such tax by or from such executors.
11. An Act to amend the Heavy Oil Motor Vehicles Taxation Ordinance.
12. An Act to provide for the establishment of the Bureau of Ceylon Standards and to provide for matters connected therewith or incidental thereto.
13. An Act to amend the Motor Traffic Act.
14. An Act to amend the Motor Traffic Act.
15. An Act to amend the Port (Cargo) Corporation Act, No. 13 of 1958.
16. An Act to amend the Air Navigation Act.
17. An Act to amend the Employment of Women, Young Persons and Children Act, No. 47 of 1956.
18. An Act to amend the Fauna and Flora Protection Ordinance.

මේ වගට,

ඔබගේ කීකරු සේවක,

ඩබ්ලිව්. ගොපල්ලව,

අග්‍රාණ්ඩුකාර.

නියෝජිත මන්ත්‍රණ සභාවේ ගරු කථානායකතුමා."

## ලිපිලේඛනාදිය පිළිගැන්වීම

*சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்*

## Papers Presented

ගම්සභා ආඥාපනතේ (257 වන අධිකාරය) 5 සහ 5 (i) (ii) යන වගන්ති යටතේ පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමති විසින් පනවන ලද ආඥා දෙකක්.—[පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම් වෙනුවට ඞී. ඊ. පස්කුවල් මයා.]

**සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරනලදී.**

*பாபீடத்திருக்க வேண்டுமென ஆணையிடப்பட்டது.*

*Ordered to lie upon the Table.*



## මන්ත්‍රී මණ්ඩලයේ රැස්වීම

*சபை அமர்வு*

## Sitting of the House

**ගරු සි. පි. ද සිල්වා (ඉඩම්, වාරිමාර්ග හා විදුලි බලය පිළිබඳ ඇමති හා සභානායක)**

*(கௌரவ சி. பி. டி சில்வா—காணி, நீர்ப் பாசன, மின்விசை அமைச்சரும் சபை முதல்வரும்)*

(The Hon. C. P. de Silva—Minister of Land, Irrigation and Power and Leader of the House)

"අද දින විසිර යැමේදී මන්ත්‍රී මණ්ඩලය 1964 නොවැම්බර් 26 වන බ්‍රහස්පතින්දා අ. භා. 2 වන තෙක් කල් තැබිය යුතුය" යි මම යෝජනා කරමි.

**ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදි.**

*வினா எடுத்தியம்பப்பெற்றது.*

*Question proposed.*

**ආචාර්ය ඩබ්ලිව්. දහනායක (ගාල්ල)**

*(கலாநிதி டப்ளியு. தகநாயக்க—காலி)*

(Dr. W. Dahanayake—Galle)

Will you please tell us what the time-table of our work would be for the coming weeks? How many days will we be allotted for the Debate on the Throne Speech, and thereafter, what would be the programme of the House?

**ගරු සි. පි. ද සිල්වා**

*(கௌரவ சி. பி. டி சில்வா)*

(The Hon. C. P. de Silva)

Mr. Speaker, I am prepared to discuss the matter with you.

**කථානායකතුමා**

*(சபாநாயகர்)*

(Mr. Speaker)

Shall we discuss the matter with Party Leaders?

**ආචාර්ය ඩබ්ලිව්. දහනායක**

*(கலாநிதி டப்ளியு. தகநாயக்க)*

(Dr. W. Dahanayake)

At what time?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**කථානායකතුමා**
*(சபாநாயகர்)*
(Mr. Speaker)

Soon after today's Sitting.

**ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.**
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
*Question put, and agreed to.*

## අග්‍රාණ්ඩුකාරතුමාගේ කථාව

### மகாதேசாதிபதியினது உரை

### GOVERNOR-GENERAL'S SPEECH

**කථානායකතුමා**
*(சபாநாயகர்)*
(Mr. Speaker)

I have to acquaint the House that this House has this day attended His Excellency the Governor-General in Parliament Hall and His Excellency was pleased to make a Most Gracious Speech to both Houses of Parliament of which, for greater accuracy, I have obtained a copy.

කථාව කරන ලද්දේ මතු පළ වන ප්‍රකාරයටය :

**" සෙනේට් සභාවේ සභාපතිතුමනි, සෙනේට් සභිකවරුනි,**

**කථානායකතුමනි, නියෝජිත මන්ත්‍රණ සභාවේ මන්ත්‍රීවරුනි,**

පාර්ලිමේන්තුවේ පසුගිය සැසිවාරය ආරම්භයේදී මේ රට තව දුරටත් ප්‍රජාතන්ත්‍රවාදී හා සමාජවාදී මාර්ගයන් ඔස්සේ ගමන් කරවීමට අවශ්‍ය නීතිමය හා පාලනමය ක්‍රියාමාර්ගයන් ඇතුළත් පූර්ණ වැඩසටහනක් ඔබ හමුවේ තැබුවෙමි.

එම වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී, එහිම කොටසක්වූ ලංකාවේ පදිංචිව සිටින ඉන්දියානුන්ගෙන් පැවතඑන් නත් සම්බන්ධ ප්‍රශ්නය, ඉන්දියාවේ අගමැතිතුමා සමග සාකච්ඡා කොට, ලක්වැසියන්ට පිළිගත හැකි පරිදි සාර්ථක අන්දමේ ගිවිසුමකට එළඹීමට මාගේ අගමැතිනිය සමර්ථ වූවාය. එම ගිවිසුමේ කොන්දේසි ඔබ හමුවේ තබා ඇත.

බහුතර ජනතාවගේ ආගම වූ බෞද්ධාගමට මේ රටේ හිමි තත්ත්වය සලසා දෙන අතර, සෑම ආගමක්ම ඇදහීම පිළිබඳ නිදහස සහතික කරමින් 1956 යේ දිවංගත ඇස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක අගමැතිතුමාගේ රජයෙන් හා වත්මන් රජයෙන් ගනුලැබූ පියවරවලට අමතරව, බෞද්ධාගමට යෝග්‍ය මෙම තත්ත්වය සහතික වශයෙන් ලබාදෙන ව්‍යවස්ථාවන් ඔබ හමුවේ තැබීමට මාගේ ආණ්ඩුව අදහස් කරයි.

පසුගිය සැසිවාරයේ මාගේ කථාවෙන් සඳහන් කෙරුණු නීතිමය හා පාලනමය වූ වැඩසටහන, මෙම සැසිවාරය තුළදී ද කරගෙන යෑමට මාගේ ආණ්ඩුව අදහස් කරයි.

එම අදහස් පෙරදැරි කොට, පසුගිය සැසිවාරයේදී අහෝසි වූ ව්‍යවස්ථා කෙටුම්පත් සහ අවශ්‍ය අනිකුත් ප්‍රගතිශීලී වැඩසටහන් ඔබ හමුවේ තබනු ඇත.

මේ කරුණු සියල්ලම ඔබේ සැලකිල්ලට භාජන කරන අතර, ඒ ගැන සුපරීක්ෂකාරීව කල්පනා කරනු ඇතැයි මම උදක්ම විශ්වාස කරමි. "

**එස්. එම්. රාසමානික්කම් මයා.**
(පද්දිරිප්පු)
*(திரு. எஸ். எம். இராசமாணிக்கம்—பட்டிருப்பு)*
(Mr. S. M. Rasamanickam—Paddiruppu)

Will you also publish the Tamil and English translations of the Throne Speech ?

**කථානායකතුමා**
*(சபாநாயகர்)*
(Mr. Speaker)

They are available, and will be circulated.

*[மகா தேசாதிபதி அவர்களது பேச்சின் தமிழாக்கம்]*

**செனெற்றுச் சபைத்தலைவர் அவர்களே! செனெற்றுச்சபை அங்கத்தினர்களே! சபாநாயகர் அவர்களே! பிரதிநிதிகள் சபை அங்கத்தினர்களே!**

பாராளுமன்றத்தின் கடைசிக் கூட்டத் தொடரின் ஆரம்பத்தின்போது, இந்நாட்டை ஜனநாயக, சோஷலிஸ பாதையில் மேலும்


Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

முன்னேற்றுதற்குச் சட்ட, நிர்வாக நடவடிக்கைக்கான பூரண நிகழ்ச்சித் திட்டம் ஒன்றை உங்கள் முன்னிலையில் சமர்ப்பித்தேன்.

இந் நிகழ்ச்சித் திட்டத்தைச் செயற்படுத்துவதில் ஓர் அம்சமாக, எனது பிரதமர் இந்தியப் பிரதமருடன் பேச்சு வார்த்தைகள் நடாத்தி, இலங்கை வாழ் இந்திய வம்சாவளியினர் சம்பந்தமாக இலங்கை மக்கள் ஏற்றுக் கொள்ளக்கூடிய ஓர் உடன்படிக்கையினை வெற்றிகரமாக நிறைவேற்றியுள்ளார். இந்த உடன்படிக்கையின் நியதிகள் உங்கள் முன்னிலையில் சமர்ப்பிக்கப்பட்டுள்ளன.

பெரும்பாலரின் சமயமான பௌத்த மதத்திற்கு இந்நாட்டிலே அதற்குரிய தகுந்த இடத்தை அளித்தற்கும், அதே சமயத்தில் சகல மதங்களுக்கும் பூரண வழிபாட்டுச் சுதந்திரத்திற்கு உத்தரவாதம் அளித்தற்கும், 1956 ஆம் ஆண்டினது காலஞ்சென்ற திரு. எஸ். டப்ளியு. ஆர். டி. பண்டாரநாயக்க அரசாங்கமும், இப்போதுள்ள அரசாங்கமும் மேற்கொண்டுள்ள நடவடிக்கைகளுடன், பௌத்தத்திற்குரிய இத்தகுந்த இடத்தை உத்தரவாதப்படுத்தும் சட்டத்தை எனது அரசாங்கம் உங்கள் முன்னிலையில் சமர்ப்பிக்க உத்தேசிக்கிறது.

இந்தக் கூட்டத் தொடரின்போது, கடந்த கூட்டத் தொடருக்காக என்னுல் சுருக்கமாகக் குறிப்பிடப்பட்ட சட்ட, நிர்வாக நிகழ்ச்சித் திட்டத்தை தொடர்ந்து செயற்படுத்தற்கு எனது அரசாங்கம் உத்தேசிக்கிறது.

இதன் பொருட்டு, கடந்த கூட்டத் தொடரின் காலாவதியான மசோதாக்களும், இதர அவசியமான முன்னேற்ற நடவடிக்கைகளும் உங்கள் முன்னிலையில் சமர்ப்பிக்கப்படும்.

இந்த நடவடிக்கைகளை உங்கள் ஆலோசனைக்குச் சமர்ப்பிக்கிறேன். அவற்றை நீங்கள் மிகவும் கவனமாகப் பரிசீலனை செய்வீர்கள் என்று நான் நம்புகிறேன்.

[*English Translation of Governor-General's Speech*]

**Mr. President and Members of the Senate,**

**Mr. Speaker and Members of the House of Representatives.**

*At the commencement of the last Session of Parliament, I placed before you a full programme of legislative and administrative action to take this country further along democratic and socialist lines.*

*As part of the implementation of this programme, My Prime Minister has had discussions with the Prime Minister of India and has been successful in concluding an agreement acceptable to the people of Ceylon in regard to the persons of Indian origin resident in Ceylon. The terms of the agreement have been placed before you.*

*In addition to steps taken by the late Mr. S. W. R. D. Bandaranaike's Government of 1956, and by the present Government to give Buddhism its proper place in the country as the religion of the majority and at the same time guaranteeing complete freedom of worship to all religions, My Government proposes to place before you legislation which will guarantee this proper place to Buddhism.*

*During this Session, My Government proposes to continue with the implementation of the legislative and administrative programme outlined by me for the last Session.*

*For this purpose, the lapsed Bills of the previous Session and other necessary progressive measures will be placed before you.*

*I commend these measures to you for your deliberation and I trust they will receive your most careful consideration.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ස්තුති යෝජනාව පිළිබඳ විවාදය

# ස්තුති යෝජනාව පිළිබඳ විවාදය
## [පළමුවන දිනය]

*உரை மீதான விவாதம் [முதல் நாள்]*

# DEBATE ON THE ADDRESS
## [*FIRST DAY*]

අ. භා. 2.6

**ටී. විලියම් ප්‍රනාන්දු මයා.** (නුවරඑළිය)
*(திரு. ரி. விலியம் பெர்ணாண்டோ—நுவரெலிய)*
(Mr. T. William Fernando—Nuwara Eliya)

ගරු කථානායකතුමනි, පස්වැනි පාර්ලිමේන්තුවේ හයවැනි රාජාසන කථාවට ස්තුති යෝජනාවක් ඉදිරිපත් කිරීම සඳහා මා තෝරා ගැනීම සම්බන්ධයෙන් පළමුවෙන්ම ඊට මගේ නම ඉදිරිපත් කළ අපේ නායකතුමන්ලාට මගේ ස්තුතිය පිරිනමනව. මේවැනි වැදගත් රාජාසන කථාවකට ස්තුති යෝජනාවක් ඉදිරිපත් කිරීමට නුවරඑළි ප්‍රදේශයෙන් තේරී පත් වූ කම්කරුවකු වූ, සාමාන්‍ය මිනිහෙකුට අවසථාව ලැබුණු පළමුවෙනි අවස්ථාව මෙය බව මතක් කරන්ට සතුටුයි. එය කම්කරු සහෝදර ජනතාවට ආඩම්බරයක් වශයෙන් සලකන්ට පුළුවන්.

ගරු කථානායකතුමනි, අති ගරු අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් පවත් වන ලද කථාවට පිළිතුරු වශයෙන් මෙම මන්ත්‍රී මණ්ඩලය වෙනුවෙන් පහත දැක්වෙන ස්තුති යෝජනාව ඉදිරිපත් කළ යුතුයි :

> "අතිගරු උතුමාණනි, පාර්ලිමේන්තුව විවෘත කිරීමේදී ඔබතුමාණන් විසින් පවත්වන්නට යෙදුණු කථාව වෙනුවෙන් නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ සාමාජිකයන් වන අපි ඔබතුමාණන්ට ස්තුති කරමු. අප වෙත ඉදිරිපත් කරන ලද සියලුම කරුණුවලට අපගේ අවධානය යොමු කරන බව අපි ඔබතුමාට සථිර ලෙස ප්‍රකාශ කරමු."

ගරු කථානායකතුමනි, අද පෙරවරුවේදී ගරු උතුමාණන් වහන්සේ පාර්ලිමේන්තුව ඉදිරියේ තබන ලද ඒ අගනා අදහස්වලින් මා ඉතා ප්‍රීතියට පත් වුණා. කන්දඋඩරට ඉන්දියානු ජනතාව විශාල වශයෙන් සිටින ප්‍රදේශයක් නියෝජනය කරන මන්ත්‍රීවරයකු වශයෙන් මා පිට පැවරී තිබෙන්නේ ඉතා භාරදූර වගකීමක්. මා කාලයක සිටම මේ ගරු සභාවේ ගෙන හැර දැක්වූ ඉන්දියානු ප්‍රශ්නය තරමක් දුරට විසඳීමට අපේ ගරු අගමැතිනිය ගෙන තිබෙන පියවර මා ඉතා උසස් කොට සලකනව. ඉන්දියානු ප්‍රශ්නය මේ රටට කාලයක් තිස්සේ බරක්ව තිබුණු බව තමුන්නාන්සේලා පිළිගන්නව. එය ඉසිලිය නොහැකි බරක් වශයෙන් පසුගිය කාලයේ පැවතුණා. ගත වූ කාලයේදී ආණ්ඩු කීපයක් හා අගමැතිවරුන් කීප දෙනකු මේ ප්‍රශ්නය විසඳීමට නොයෙක් අයුරින් උත්සාහ ගත්තේ වී නමුත් එය විසඳුණේ නැහැ. ප්‍රශ්නය කල් තැබීම පමණයි, සිදුවුණේ. මෙම ප්‍රශ්නය දවසින් දවස උග්‍ර වී මේ රටේ ආර්ථික තත්ත්වයට එයින් බලවත් පහරක් වැදුණා. අපේ සෑම පහසුකමක්ම අස්ථිර ජනතාවක් වෙනුවෙනුත් යොදවන්ට සිද්ධ වීමෙන් මේ රටේ උපදින විශාල ධනයක් ඔවුන් සඳහා වැය කරන්ට සිදු වුණා. දෙරටටම බරක්ව සිටි ඒ පිරිස ගැන මානුසික වශයෙන් කල්පනා කර බලා යම් වැදගත් තීරණයකට එළඹීමට අපේ අගමැතිනියට පුළුවන්කම ලැබුණ. අපේ මැතිවරණ ප්‍රකාශනයේ ඇතුළත් කළ අයුරින්ම ඒ ප්‍රශ්නය විසඳීමට ගරු අගමැතිනිය ක්‍රියා කළා. ඇත්ත වශයෙන්ම අපේ ගරු අගමැතිනිය ඒ අවසථාවේදී මේ බැරෑරුම් ජාතික ප්‍රශ්නය විසඳීම සඳහා විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා ඇතුළු විපක්ෂවල නායකයින්ගේ සහයෝගය ඉල්ලා සිටියා. එහෙත්, විරුද්ධ පාර්ශ්වයේ සහයෝගය එයට ලැබුණාද නැද්ද කියා අපි දන්නව. ඒ බව තමුන්නාන්සේලා පිළිගන්න ඕනෑ.

ඇතැම් අයට වුවමනා වී තිබෙන්නේ මැතිවරණ අවස්ථාවලදී පමණක් මේ ඉන්දියානු ප්‍රශ්නය නමැති මිණීගෙඩිය සෙලවීමටයි. ඒ නායකයින්ට වුවමනා වී තිබෙන්නේ, මෙය දේශපාලන කටයුතුවලට පමණක් නැත්නම් මැතිවරණවලට පමණක් සීමා කරගෙන මෙය කවදාවත් නොවිසඳා හැමදාමත් මැතිවරණ කාලයට පමණක් හොල්ලන්නට නැත්නම් නාද කරන්නටයි. ඇත්ත වශයෙන්ම එවැනි ප්‍රශ්නයක් නිරායාසයෙන්ම විසඳන්නට ඉඩකඩ තිබියදීත් මේ ගරු අගමැතිනිය ගත් උත්සාහයට විරුද්ධ පාර්ශ්වයත් සහභාගි වී මෙයට සහයෝගය දුන්නා නම් මේ ප්‍රශ්නය මීට වඩා තවත් පියවරක් සැහැල්ලු විධියට ඉදිරියට තබන්නට තිබුණා. මෙය ආගමට ජාතියට භාෂාවට සම්බන්ධ කරුණක් හැටියට සලකා එසේ

4——ආර් 2126 (64/11)
Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[විලියම් ප්‍රනාන්දු මයා.]

කළා නම් තවත් ඉදිරියට පියවරක් තබන්නට තිබුණා. නමුත් ඔවුන්ට ඕනෑ වී තිබුණේ මේ ප්‍රශ්නය විසඳන්නට නොවෙයි. ඒ නායකයින් එදා මේ ප්‍රශ්නය විසඳීම පිණිස එහි ගිය අවස්ථාවලදී ඒ රටවල තිබුණු තත්ත්වය අපි දන්නව. මේ රටින් ගිය නායකයින් මොකක්ද කළේ ? ඔව්, ඔවුන් සාමාන්‍යයෙන් විනෝදයක් ලබා ගත්තා. ඇත්ත වශයෙන්ම කාලය සීමා කරගෙනයි ඔවුන් කටයුතු කළේ. ඇතැම් අවස්ථාවලදී ඒ රටේ දර්ශන නර ඹන්නට ගියා. එහෙත්, දහවල් දොළොස් පැයත් රාත්‍රි කාලයත් ඒ සඳහා කැප කර මින් මේ ගරු අගමැතිනිය සපිර වශ යෙන්ම මේ ප්‍රශ්නය විසඳීමට යෑමේදී මේ අනික් පක්‍ෂවල නායකයින්ය කියන අය කළේ මොකක්ද ? ඔවුන් කිව්වේ මොකක්ද ? කවදාවත් මේ ප්‍රශ්නය විස දන්නේ නැත, මේ කථාවෙන්ම අවසාන වෙනවාය, තීරණයක් ගන්නේ නැත කියා අවසාන මොහොතේ කියාවිය කියායි. ඒ අන්දමින් නොයෙක් විධියෙන් විරුද්ධ පාර්ශ්වයේ උපහාසයන් ලක් කළා. ඒ අනුව කල්පනා කරන විට, මේ රටේ ජාතිය ආගම භාෂාව ගැන කථා කරන්නට ඔවුන්ට අයිතියක් නැහැ. ඔවුන් හැමදාමත් මහ ජනයා රවටන්නට තැත් කළා.

එපමණක් නොවෙයි. මෙවැනි බැරෑරුම් කටයුත්තක් විසඳන්නට ඉන්දියානු ආණ්ඩුව සූදානම් වූ අවස්ථාවේ ඒ රටේ ප්‍රවෘත්ති පත්‍ර එක හඩින් කියා හිටියා ඉන්දියානු ජනතාවගේ අයිතිවාසිකම් රැක දෙන්න ඕනෑය කියා. ඔවුන්ගේ අයිති වාසිකම් ඒ පත්තර මගින් පෙන්වා දුන්නා. ඒ පත්තර රජයට රුකුල් දෙමින් නොයෙක් විධියෙන් ආධාර කළා. නමුත් ලංකාවේ ඉංග්‍රීසි පුවත් පත් ඒ අවස්ථාවේදී කටයුතු කළ ආකාරය ජාතියක් හැටියට රටකට ඉතාම නින්දිතය කියා කියන්න පුළුවන්. රජයට ආධාර වශයෙන් ඉංග්‍රීසි ප්‍රවෘත්ති පත්‍රවලින් මොන කරුණුද කියා හිටියෙ ? මේ සම්බන්ධව තත්ත්වය මොන අන්දමින්ද පෙන්වා දුන්නෙ ? මේ රටේ නැති තත්ත්වයක් ඇති කරගෙන බොරුවෙන් මහජනයා මුලාකරගෙන වෙනත් පියවරක් ගෙන මේ රටේ වෙනත් විප්ලවයක් ඇති කිරීමටයි ඔවුන් බලාපොරොත්තු වුණේ. මේ රටේ පත්තර මුළු පත්තර සම්ප්‍රදායටම නින්දා සහගත විධියෙන් කටයුතු කර තිබෙන බව පසුගිය කාලයේ පුවත්පත් අරගෙන බලන විට කුඩා දරුවකුට වුවත් පෙනී යනවා. නමුත් ඉන්දියාවේ හින්දි, දෙමළ, ඉංග්‍රීසි ආදී පත්තරවලින් කීවේ ලංකාවේ සිටින ද්‍රවිඩ ජනතාවට සම්පූර්ණයෙන්ම අයිති වාසිකම් ලබා දිය යුතුයි, ඔවුන් මේ මේ විධියට වැඩ කළා, මේ මේ විධියෙන් ආර්ථික තත්ත්වයට ආධාර කළා, කියායි. ඒ අන් දමට නොයෙක් විධියෙන් ඓතිහාසික කරුණු පෙන්වමින් ඔවුන් ඉන්දියාවේ රජයට ආධාර දුන්නා. ඒ අනුව බලන විට මේ රටේ ප්‍රවෘත්ති පත්‍ර මේ ඉන්දියානු ප්‍රශ්නය පිළිබඳව අපට සාපයක් හැටියට පසුගිය කාලයේ කටයුතු කර තිබෙනව. මේ ඉන්දියානු ප්‍රශ්නය විසඳීම සම්බන්ධ යෙන් මේ රටේ ප්‍රවෘත්ති පත්‍ර ගෙන ගිය ක්‍රියා කලාපය ඉතාමත්ම ලජ්ජා සහගතයි. ඒ බව මේ පත්‍ර කොමිෂන් සභා වර්තාවෙත් කියා තිබෙනව.

එදා සිටම ඉන්දියානු ප්‍රශ්නය ගැන මේ රටේ ඉංග්‍රීසි පත්‍රකාරයින් කටයුතු කළේ කොහොමද ? ගරු කථානායකතුමනි, මේ බලන්න. පුවත්පත් කොමිසමේ අවසාන වාර්තාවේ 17 වන පිටුවේ මේ විධියටයි තිබෙන්න :

"—පුවත් පත් කෙරෙහිද අන් හැමව වැඩියෙන් තිබිය යුතු ගුණය වනුයේ දේශ මාමකත්වයයි. එහෙත් අපේ පුවත් පත්, විශේෂයෙන්ම ඉංග්‍රීසි භාෂාමය පුවත්පත් කෙරෙහි එම ගුණය දක්නට ලැබෙන්නේ අල්ප වශයෙනි. අප මෙයින් අදහස් කරන්නේ කිසියම් පුවත්පතක් රටේ පවත්නා නීත්‍යනුකූල ආණ්ඩුවත් එරට මහජනයාත් ගැන වැරදි අදහස් ලෝකයා ඉදිරියේ නොතැබිය යුතු බව මිස රටට තිබෙන ආදරය නිසා සාධාරණයේ මූලධර්ම සියල්ලත්, යුක්තිගරුක බවත් පළවා හළ යුතු බවක් නොවේ. මෙරට සුබ සිද්ධියට අදාළවන කරුණුත් විදේශීය රටවල යහපතට තුඩු දෙන කරුණුත් අතර ගැටුම් සිදුවූ අවස්ථා අපට නිරතුරුව දක්නට ලැබී ඇත. එබඳු සෑම අවස්ථාවන්හිදීම පාහේ අප රටේ ඉංග්‍රීසි භාෂාමය පුවත් පත් කළේ, විදේශයන්ගේ පැත්ත ගෙන ක්‍රියා කිරීමය. අපේ මේ චෝදනාව සනාථ කෙරෙන නිදර්ශන සුදුසු තන්හිදී ගෙන හැර පෑමට අදහස් කරමු. ලේක් හවුස් සමාගමයේත් එසේම ටයිම්ස් සමාගමයේත් පුවත්පත් ඉන්දු ලංකා රටවැසි ප්‍රශ්නයේදී ලංකාවට අහිතවත් වන අන්දමේ පිළිවෙතක් අනුගමනය කළ බව පමණක් මෙහිලා සාමාන්‍යයෙන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සඳහන් කරනු කැමැත්තෙමු. බොහෝ අවස්ථාවන්හිද සිලෝන් ඩේලිනිව්ස් පත්‍රය එම ප්‍රශ්නය සම්බන්ධයෙන් ඉන්දියානු පුවත්පත්වල පළවූ, මෙරටට අහිතකරවූත්, එසේම සාවද්‍ය කරුණුවලින් ගහනවූත් ලිපි උපුටා පළ කෙළේය. එසේ එම ලිපි උපුටා ගෙන ඩේලි නිව්ස් පත්‍රයෙහි පළ නොකළ යුතුව තිබුණු බවක් හෝ, "මගේ රට නම්, හරිවුවත් වැරදි වුවත් කම් නැත" යන දරදඬු උද්‍යෝග පාඨය පිළිගන්නා බවක් අපි මෙයින් කිසිසේත්, අදහස් නොකරමු. එහෙත් එසේ එම ලිපි උපුටා පළ කිරීමේදී, එහි සඳහන් වන සාවද්‍ය කරුණුත් ලංකාව ඒ සම්බන්ධයෙන් දරණ මතයත් දක්වමින් කතුවරයා විසින් කිසියම් සටහනක් ලිවිය යුතුව තිබුණු බව පෙන්වා දීමට කැමැත්තෙමු. එහෙත් එබන්දක් ඔවුන් අතින් ඉටු නොවීය."

ගරු කථානායකතුමනි, ඉන්දියානු ප්‍රශ්නය ගැන සාකච්ඡා කරන්නට පෙර එවැනි තත්ත්වයකුයි තිබුණේ. ලංකාවේ ඉංග්‍රීසි පත්‍රවල පළවුණේ සම්පූර්ණයෙන්ම ඉන්දියානු පත්‍රවලින් උපුටා ගත් කර්තෘ වාක්‍යවල පරිවර්තන පමණයි. ඇත්ත වශයෙන්ම මේ ගැන බැලුවාම කෙටියෙන් මෙසේ කියන්න පුලුවනි. "ඉන්ඩියන් එක්ස්ප්‍රෙස්" පත්‍රයෙන් අනික් ඉන්දියානු පත්‍රවලත් මේ ප්‍රශ්නය සම්බන්ධයෙන් පළවුණු කර්තෘ වාක්‍යවල පරිවර්තන පමණයි ලංකාවේ "ඩේලි නිව්ස්" පත්‍රයෙ පළ කර තිබෙන්නෙ. ඒවා සම්බන්ධයෙන් පැහැදිලි වශයෙනුත් සම්පූර්ණ විස්තර සහිතවත් මේ පුවත්පත් කොමිසමේ අවසාන වාර්තාවේ සඳහන් කර තිබෙනව:

"—එබඳු පිළිවෙතක් අනුගමනය කළේ ඉන්දු-ලංකා සම්බන්ධතාව තවතවත් නරක අතට හැරෙනු දැකීම සිලෝන් ඩේලි නිව්ස් පත්‍රයේ අභිප්‍රායවූ නිසාද? ලංකාවේ පැත්ත ගැනීමෙන් ඉන්දියානු ව්‍යාපාරික අධිපතීන් අමනාප කර ගැනීමට ඩේලි නිව්ස් පත්‍රය අකැමැති වූ නිසා එසේ කළේ යයි සැලකීමට ද ඉඩ නැත්තේ නොවේ. ඉන්දු-ලංකා ප්‍රශ්නයෙහිලා ආණ්ඩුවට සහයෝගයක් දැක්වීමට ඩේලි නිව්ස් පත්‍රය නොකැමැතිවූ නිසා එබඳු පිළිවෙතක් අනුගමනය කෙළේයයි සැලකීමට ද හැකිය."

ගරු කථානායකතුමනි, ඉන්දියානු ප්‍රශ්නය සම්බන්ධයෙන් මේ විධියේ ක්‍රියා මාර්ගයකුයි අපේ පත්‍ර අනුගමනය කළේ. "ලංකාදීප", "දවස" පත්‍ර මේ ප්‍රශ්නය විසඳීම සම්බන්ධයෙන් සාමාන්‍ය වශයෙන් ක්‍රියා කළාය කියා අප පිළිගන්නවා. නමුත් ඉංග්‍රීසි පත්‍ර, බේරෙ ගෙදර පත්‍ර මේ ප්‍රශ්නය විසඳනවාට විරුද්ධවයි එදා සිටම වැඩ කර තිබෙන්නෙ. ජාති ආලයක් තිබෙනවා නම් මේ ප්‍රශ්න සම්බන්ධයෙන් බොරුවෙන් කියා පෑම නොවෙයි ඕනැ කරන්නෙ. මේක ආර්ථික ප්‍රශ්නයක්ය, මේක ජාතික ප්‍රශ්නයක්ය, මානුෂික අන්දමට මේ ප්‍රශ්නය විසඳන්න ඕනෑය ආදී වශයෙන් ප්‍රශ්නය සම්බන්ධයෙන් නියම තත්ත්වය අවබෝධ වන අන්දමට පත්‍ර කටයුතු කළා නම් මොකක්ද සිද්ධ වන්නෙ? එසේ කටයුතු කළා නම් අගමැතිතුමියට ඒ තීරණ ගැනීමේදී එය විශාල රුකුලක් වෙනව. නමුත් පත්‍රවලින් ඒ විධියෙ කිසිම ආධාර යක් දුන්නෙ නැහැ. දවල් හීනයක් වගේ මේ ඉන්දියන් ප්‍රශ්නය විසඳීම අවසාන වේවිය කියා දේශපාලන පක්ෂත් ඒ විධියටම කිසිම ආධාරයක් නොදී ඔහේ පැත්තකට වී බලාගෙන සිටියා. ප්‍රශ්නය අවුල් කර දමා අපි බලය ලබා ගනිමුය යන හැඟීමෙන් ඒ අවස්ථාවේදී ලංකාවේ දේශපාලන පක්ෂ ක්‍රියා කළාය කියා මා මේ අවස්ථාවේදී කණගාටුවෙන් කියනව.

ඒ වගේම විරුද්ධ පක්ෂයේ නායකතුමාගේ ක්‍රියා කලාපය කෙරෙහිත් මගේ කණගාටුව ප්‍රකාශ කරනවා. අගමැතිනිය ආරාධනා කර තිබියදීත් මෙ ප්‍රශ්නය විසඳීමට ඉන්දියාවට නොගොස් පිටපැනීම ගැන එතුමාට මේ සභාවේම බලවත් කණගාටුව ප්‍රකාශ කළයුතුව තිබෙනවා. නමුන්නාන්සේලා වේදිකාවලට ගොස් ඉන්දියානු ප්‍රශ්නය ගැන අද මොන විධියට කථා කරනවාද කියා මා ප්‍රශ්න කරනව. මොන විධියටද නමුන්නාන්සේලා කථා කරන්නෙ? ඒ නිසා ඉන්දියානු ප්‍රශ්නය විසඳීම ආරම්භ කළ අවස්ථාවේදී අපේ ඇතැම් දේශපාලන පක්ෂ නායකයින් ක්‍රියා කළ ආකාරය සම්බන්ධයෙන් අප ඉතාමත් කණගාටු වෙනව. මුලු ජනතාවම මේ ගැන සොයා බලන්න ඕනැ. මේ ප්‍රශ්නයේදී ඇතැම් දේශපාලන පක්ෂ නායකයින් ගත් තීරණ මොනවාද, ඔවුන් ප්‍රශ්නය විසඳනවාද, අවුල් කරනවාද යන කරුණු ගැන මේ රටේ ජනතාව සැලකිල්ල යොමු කර බලන්න ඕනැ. ඇත්ත වශයෙන්ම ප්‍රශ්නය අවුල් කිරීමට නම් මහ සූර අය ඔය පුටුවල සිටින බව අපට පැහැදිලිව පෙනෙනවා. මේ ප්‍රශ්නය ගැන කථා කරන කොට අපේ විරුද්ධ පාර්ශ්වය ගැන සඳහන් කරන්නට තිබෙන්නේ නම් ඉතාමත්ම කනගාටුවෙන් යුක්තවයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[විලියම් ප්‍රනාන්දු මයා.]

අවිස්සාවෙල්ලේ ගරු මන්ත්‍රීතුමාත් ජාතික ඌරුවක් ඇතිව වැඩ කරනවා යයි කියන නිසා මේ ප්‍රශ්නය ගැන සාකච්ඡා කිරීම පිණිස ගරු අගමැතිනිය ඒ ගරු මන්ත්‍රීතුමාටත් ආරාධනය කළා. නමුත් ඒ ගරු මන්ත්‍රීතුමා පත්තරේට ප්‍රකාශයක් කළා මිස මේ ප්‍රශ්නය සම්බන්ධයෙන් අගමැතිනිය සමඟ සාකච්ඡා කරන්නට ගියේ නැහැ. එදා ඒ විධියට ක්‍රියා කොට දැන් නම් එතුමා වේදිකාවලට ගොස් නොයෙක් විධියට කෑගහනව. නමුත් එතුමාට මේ සම්බන්ධයෙන් කථා කරන්නට අයිතියක් තිබෙන වාද කියා මා අහනවා. උපදෙස් ඉල්ලූ අවස්ථාවේදී ඊට ඇහුම්කන් නොදී දැන් ඔය අන්දමට කථා කරන්නට ලජ්ජා නැද්ද? තව දුරටත් ඔය විධියට මහජනයා රවටන්නට ඉඩ ලැබේද කියන එක සැක සහිතයි. නිසි අවස්ථාවේදි ඔය ප්‍රකාශ ගැන මහජනයාගෙන් පිළිතුරු ලැබෙනවා ඇති. මේ භාරදූර ප්‍රශ්නය විසඳීමේදී ඊට සහාය දුන් නිලධාරීන් පිරිසකුත්, ඇමති වරුන් දෙදෙනකුත් සිටි බව අප පිළිගන්න ඕනෑ. ඒ අයගේ සහයෝගය නොලැබුණා නම් මේ ප්‍රශ්නය නොවිසඳෙන්නට ඉඩ තිබුණා.

ගරු කථානායකතුමනි, ඉන්දියානු ප්‍රශ්නය සම්බන්ධයෙන් ලංකා අගමැතිනියත් ඉන්දියා අගමැතිවරයාත් අතර ඇති කර ගන්නා ලද ගිවිසුම මා මේ අවස්ථාවේදී මේ ගරු සභාව ඉදිරියේ කියවන්නට කැමතියි :

"ලංකාවේ සිටින ඉන්දියානුවන්ගෙන් පැවත එන්නන්ගේ තත්වය සහ අනාගතය පිළිබඳව 1964 ඔක්තෝබර් මස 24 වැනිදා සිට 30 වැනිදා දක්වා අප පැවැත්වූ සාකච්ඡාවන් කෙරෙහිත් අප එළඹුණු සම්මුතියේ පහත දැක්වෙන ප්‍රධාන ශීර්ෂයන් කෙරෙහිත් ඔබතුමන්ගේ අවධානය යොමු කරනු කැමැත්තෙමි.

(1) මෙම සම්මුතියේ ස්ථිර පරමාර්ථය වන්නේ ලංකාවේ හෝ ඉන්දියාවේ හෝ පුරවැසියන් වශයෙන් පිළිගනු නොලැබ ලංකාවේ සිටින සියළුම ඉන්දියානුවන්ගෙන් පැවැත එන්නන් ලංකාවේ හෝ ඉන්දියාවේ හෝ පුරවැසියන් විය යුතු බවය.

(2) මේ අයගේ ගණන අද දළ වශයෙන් 9,75,000 කි. මේ සංඛ්‍යාවට හොරෙන් සංක්‍රමණය වූවෝත් ඉන්දියානු ගමන් බල පත්‍ර දරන අයත් ඇතුළත් නොවෙති.

(3) මෙයින් 3,00,000ට සහ ඔවුන්ගෙන් බිහි වන්නන්ටද ලංකා පුරවැසිභාවය ලංකාණ්ඩුව විසින් පිරිනමනු ලැබේ. මෙයින් 5,25,000ක් සහ ඔවුන්ගෙන් බිහිවන්නන් ආපසු ඉන්දියාවට කැඳවා ගැනීම ඉන්දියා ආණ්ඩුව භාරගනු ලැබේ. ඔවුන්ට ඉන්දියාණ්ඩුව පුරවැසිභාවය පිරිනමනු ඇත.

(4) මේ සංඛ්‍යාවෙහි ඉතිරි 1,50,000 ගේ තත්වය හා අනාගතය දෙරට ආණ්ඩු අතර වෙනම ම ඇති කරගන්නා ගිවිසුමකට ඇතුළත් වේ.

(5) මේ ගිවිසුමේ දින සිට අවුරුදු 15 ක කාලයක් ඇතුළත හැකි තරම් දුරට සමව පැතිර යන සේ පිළියෙල කළ සැලැස්මක් අනුව ඉන්දියාවට යැවීමට ඇති සංඛ්‍යාව ඉන්දියාණ්ඩුව විසින් භාර ගැනීමට බැඳී සිටී.

(6) තුන්වැනි ඡේදය අනුව ලංකාවේ පුරවැසි භාවය ප්‍රදානය කිරීමත් පස්වැනි ඡේදය අනුව ඉන්දියාවට ආපසු කැඳවා ගන්නා අයවළුන් එසේ කැඳවා ගැනීමත් යන මේ කරුණු දෙකම සමසේ පැතිර යන ලෙස ඉටු කළ යුතු අතර හැකිතරම් දුරට මේ දෙකොට සේ සංඛ්‍යා, එනම් ලංකා පුරවැසි භාවය ලබන අය සහ ආපසු යවන අයවළුන්ගේ සංඛ්‍යා එකිනෙකට අනුපාතව සමාන විය යුතුය.

(7) ඉන්දියාවට ආපසු යවන අයට මෙහි පදිංචි කාලය තුළදී වෙනත් රටවල අයට දෙන පහසුකම්වලට සමාන පහසුකම් (මුදල් යැවීමේ පහසුකම් හැර) හා විසා පහසුකම් ඇතුළුව ඔවුන්ට තව දුරටත් මෙහි පදිංචි වී සිටීමට අවශ්‍ය සිරිත් පරිදි දෙන පහසුකම් ලංකාණ්ඩුව දෙනවා ඇත. මේ ගිවිසුමේ දින යේදී ආර්ථික ලාභ ලැබෙන රක්ෂාවක යෙදී සිටින අයට ඔවුන් කොටස් වශයෙන් පිටත් කර හැරීමේ වැඩ පිළිවෙල යටතේ පිටත් කර හරින තුරු හෝ ඊට පෙර වයස අවුරුදු 55 වේ නම් අවුරුදු 55 වයස් වන තෙක් පමණක් එම රක්ෂා කරගෙන යාමට ඉඩ දීමට එකඟ වනු ලැබේ.

(8) එකලට වලංගු විනිමය පාලන නීති අනුව ඒ නයින් ඔවුනට වෙනස්කම් නොකර අර්ථ සාධක අරමුදල් හා ප්‍රසාද දීමනා ඇතුළුව ඔවුන් සතු වත්කම් ඔවුන් අන්තිමට පිට වී යන විට ගෙන යාමට ඉඩ දීමට ලංකාණ්ඩුව එකඟ වෙයි. ඔවුන්ගෙන් එක පවුලකට ගෙන යාමට ඉඩදෙන වැඩිම වත්කම් ප්‍රමාණය රු. 4,000 කට වඩා අඩු නොකළ යුතු යයි ලංකාණ්ඩුව පිළිගනී.

(9) ලංකා පුරවැසි භාවය ප්‍රදානය කරනු ලබන අයවළුන්ගේ නම් ඇතුළත් එක් ලේඛනයක් ද, ඉන්දියාවට ආපසු යැවිය යුතු තැනැත්තන්ගේ නම් ඇතුළත් තවත් ලේඛනයක් ද යනුවෙන් ලේඛන දෙකක් හැකි පමණ ඉක්මනින් පිළියෙල කරනු ලැබේ. මෙමනාම ලේඛන සම්පූර්ණ කිරීම ලාංකික පුරවැසි භාවය දීම හා ආපසු පිටත් කිරීම පටන් ගැනීම සඳහා මූලික අවශ්‍යතාවයක් නොවන්නේ ය.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ස්තුති යෝජනාව පිළිබඳ විවාදය

(10) මෙහි සඳහන් දින සිට මේ ගිවිසුම බලපවත් වන්නේ ය. ගිවිසුම ක්‍රියාත්මක කිරීම පිණිස දෙරට ආණ්ඩු ඉතා ඉක්මණින් ක්‍රියා කරනු ඇත. ඒ සඳහා ඒකාබද්ධ වැඩ පිළිවෙළක් යෙදීමට හා ගිවිසුම ක්‍රියාත්මක කිරීම සඳහා සුදුසු ක්‍රම ඇති කිරීමට දෙරටේ නිලධාරීන් හැකි පමණ ඉක්මණින් හමු වනු ඇත.

අත්සන් කළේ/
සිරිමාවෝ ආර්. බණ්ඩාරනායක.

ඉන්දියානු අගමැති ශ්‍රී ලාල් බහදූර් ශාස්ත්‍රී උතුමාණන් වෙතය."

ඔකයි, සම්මුතිය. යම් පිරිසක් මෙරටින් පිටත් කර යැවීම සඳහා ඉතා කෙටි කාලයක් තුළදී මෙම සම්මුතියට එලඹී තිබෙනව. මෙය ක්‍රියාත්මක කිරීමට සියල් ලෝම සහාය දෙන්න ඕනැ. එතකොටයි, මෙම ප්‍රශ්නය ඉතා ඉක්මනින් විසඳන්න පුළුවන්කම ලැබෙන්නේ. එසේ නැතිව ඔය පැත්තෙ ඉඳගෙන ජාතියේ නාමයෙන් බොරු කිය කියා සිටියොත් මෙම ප්‍රශ්නය විසඳන්න ලැබෙන්නෙ නැහැ.

කන්ද උඩරට සිටින අයට පමණක් නොවෙයි, අගනුවර සිටින අයට පවා පේනව, ඉන්දියානු ප්‍රශ්නයෙ තියෙන භාරදූරකම. මේ රටේ වෙළඳ ව්‍යාපාර ආදී සෑම ධනෝපායන මාර්ගයක් ම ඉන්දියානුන් උදුරාගෙන තිබෙනව. ඔවුන්ගෙන් මේ රට බේරා ගැනීම සඳහා සුළු වශයෙන් හෝ එකට එකතු වී අපි ක්‍රියා කරන්න ඕන.

මෙම ප්‍රශ්නය විසඳීම සඳහා පිළිපැදිය යුතු තවත් කරුණු කීපයක් තියෙනව. මෙරටින් පිටව යන අයගෙ දේපොළ විකිණීමේදී ඒවා ලබා ගැනීම හඳහා යම් කිසි රජයේ සංස්ථාවක් ඇති කරන්න ඕනැ. එසේ නොකළොත් වෙනත් යම් යම් අයගෙ අත්වලට ඒවා යට වන විධියෙ වැඩ කෙරෙන්න පුළුවනි. ඒ ගැන සැලකිල්ලක් දක්වන ලෙස මා ඉල්ලනව.

ඉන්දියානු ප්‍රශ්නය විසඳන්න තිබුණේ මීට අවුරුදු කීපයකට පෙරයි. නමුත් මෙම ප්‍රශ්නය විසඳන්න ගිය සෑම විටෙකම වාගෙ යම් යම් කඩා වැටීම් සිදු වුණු බව අපි දන්නව. ඒවා ගැන නැවත නැවත කියන්න, මා කාලය මිඩංගු කරන්නෙ නැහැ. මෙම ප්‍රශ්නය විසඳීම සම්පූර්ණයෙන් ම වාගෙ අසාර්ථක වී ගොස් තිබුණා. මෙම ප්‍රශ්නය ක්‍රම ක්‍රමයෙන් ඉතා උග්‍ර තත්ත්වය දක්වා මෝරා අවසානයේදී විසඳීමට බැරි උභතෝකෝටික ප්‍රශ්නයක් බවට පෙරළුණා. එවැනි තත්ත්වයක තිබුණු ප්‍රශ්නයක් තමයි, මෙම සභාග ආණ්ඩුවෙ ගරු අගමැතිණිය විසින් විසඳන්ට යෙදුණේ. ඒ හේතුවෙන් එතුමියට මුළු ජනතාවගෙම ගෞරවය හිමි වෙන්ට ඕනැ. මෙම සිද්ධිය ලංකා ඉතිහාසයෙහි රන් අකුරින් ලියැවී සදාකාලිකව පවතිනවා ඒකාන්තයි.

මේ ප්‍රශ්නය විසඳීම ගැන මුළු ජාතියම එතුමීට ප්‍රශංසා කළ යුතුයි. අනාගතයේදී බිහි වී මේ රටට උරුමකම් කියන්නට සිටින දරු පිරිසත්, අද සිටින දරු පිරිසත් ඔවුන්ගේ අනාගතය ආරක්ෂා කර තැබීම ගැන ගරු අගමැතිනියට ප්‍රශංසා කළ යුතුයි. මේ ප්‍රශ්නය නිරාකරණය කර ගැනීමට ඉන්දියානු අගමැති ලාල් බහදූර් ශාස්ත්‍රී මහතා සම්පූර්ණයෙන්ම අවංකවම උත්සාහ දරා තිබෙනව. ඒ රටේ නොයෙකුත් පිරිස්, නොයෙකුත් පත්‍ර මොනවා කීවත් විශේෂයෙන්ම මදුරාසියේ පත්‍ර ඉන්දියානු අගමැතිතුමාට පහර ගසමින් නොයෙක් විධියෙන් කරදර කරමින් කටයුතු කළත්, මේ ප්‍රශ්නය විසඳිය යුතුය කියන අධිෂ්ඨානය ඇතිවම—ගරු අගමැතිනිය තමා පිටට ගෙන තිබූ බරින් එතුමිය නිදහස් කිරීමේ අදහස ඇතිවම—ඉන්දියානු අගමැතිතුමා කටයුතු කළ බව ගරු අගමැතිනිය සමග ගිය ගරු ඇමතිතුමන්ලාගෙන් අපට දැන ගන්න ලැබුනා. ප්‍රශ්නයේ විසඳීමක් නැතිව ගරු අගමැතිනිය පොට්ටනි බැඳගෙන ආපසු එන්න ලෑස්ති වන අවස්ථාවේදී එතුමිය තවත් දවසක් නවත්වාගෙන අවුරුදු 2,500 ක කාලයක් මුළුල්ලේ ලංකාවත් ඉන්දියාවත් අතර තිබූ මිත්‍රත්වය සහ සම්බන්ධය තවදුරටත් ආරක්ෂා කර ගැනීමේ අදහස ඇතිව, මේ ප්‍රශ්නය විසඳීමට එතුමා කටයුතු කළා. ඔබ තුමීට තිබෙන කරදරය මම දන්නවය, කෙසේ හෝ මගේ අනික් ඇමතිවරුන්ගෙන් සහය ලබා ගෙන මේ ප්‍රශ්නය සාධාරණ ලෙස විසඳන්නට මම උත්සාහ කරනවය, ඊට අවකාශ දී තව දවසක් නවතින්නය කියා ඉන්දියාවේ ගරු අගමැතිතුමා අපේ ගරු අගමැතිනියව තව දවසක් නවත්වා ගත් බව තමුන්නාන්සෙලා හොඳින් දන්නව. එසේ තවත් දවසක් සාකච්ඡා කරලා අවසානයේ දී මේ තත්ත්වයෙන් මේ ප්‍රශ්නය විසඳා ගත්තා.


Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ස්තුති යෝජනාව පිළිබඳ විවාදය

[විලියම් ප්‍රනාන්දු මයා.]

දැන් නම් සමහර අය නොයෙක් තර්ක ඉදිරිපත් කරනව. නොයෙක් විධියට ගණන් හදල නොයෙක් විධියට ප්‍රකාශ කරනව. නටන්නට බැරි වුණාම පොළව ඇදය කියන නැට්ටුක්කාරයො ඉන්නව. ඒ වගේ ම නොයෙක් නොයෙක් අයට දැන් නොයෙක් නොයෙක් විධියට කරුණු කියන්න පුළුවන්. ප්‍රශ්නයක් විසඳන්නට කිසි ආධාරයක් නොදී ඒ විධියට නොයෙක් නොයෙක් දේ කියන්නට පුළුවන් ශූර, දක්ෂ මහා විශාරද බුද්ධිමතුන් ඉන්නව. එවැනි දේශපාලන නායකයන් තමයි, මේ රටට ශාපයක් වෙලා තියෙන්නෙ. ඔවුන්ගෙන් තමයි, මේ රට බේරා ගත යුතුව තිබෙන්නෙ. දැන් ඉන්දියානු ප්‍රශ්නය විසඳා තිබෙන නිසා මීට පසු බොරු තර්ක ඉදිරිපත් කර මහජනයා මුළා කරන්න බැරි වේය කියා සිතාගෙන දැන් ඊර්ෂ්‍යාවෙන් යුක්තව දේශපාලන වශයෙන් නොයෙක් විධියට පහර ගහන්න උත්සාහ කරනව. මේ ප්‍රශ්නය උපකාර කරගෙන මීට පසු දේශපාලන වාසියක් ලබා ගන්න බැරි නිසා ගරු අගමැතිනියට පහර ගහන්න උත්සාහ කරනව.

ගරු කථානායකතුමනි, ගරු අගමැතිනිය මේ ප්‍රශ්නය විසඳීම සඳහා මේ රටින් පිට වී ගියේ ඉතා පිරිසිදු අදහසින් යුක්තවයි. මෙය සාර්ථක වන බව අපි කලින්ම දැන සිටියා. එතුමී මැදහත් ජාතීන්ගේ සම්මේලනයට ගියේ ලෝක සාමය පතා කථා කිරීමටයි. එහිදී එතුමිය ඉතා එඩිතර ලෙස කථා කළ නමුත් ඒ පිළිබඳව කිසිම දෙයක් ලංකාවේ පත්‍රවල පළ වුණේ නැහැ. ෂොම්බෙගෙ ගමන ගැනයි, ලංකාවේ පත්‍රවල ලොකුවට දමා තිබුනෙ. මැදහත් ජාතීන්ගේ සම්මේලනයේදී අපේ අගමැතිනිය ඉතා එඩිතර ලෙස කථා කළ නමුත් ලංකාවේ පත්‍ර මෙහෙ ෂොම්බෙ, ෂොම්බෙ, ෂොම්බෙ කියන් කෑගැසුවා. මේ විධියේ පත්‍රයි, අපේ රටේ ජාතික පත්‍රය කියා බේරා ගන්නට උත්සාහ කරන්නෙ. මේවා තමයි, පුදුම කථා.

අපේ ගරු අගමැතිණිය මැදහත් ජාතීන්ගේ සම්මේලනය සඳහා මහා බ්‍රිතාන්‍යයට ගියේ නිකම්ම නොවෙයි. බෞද්ධ උපාසිකාවක් හැටියට සර්වඥ ධාතුන් වහන්සේලා වැඩමවාගෙනයි, එතුමී මහා බ්‍රිතාන්‍යයට ගියේ. ඒ වගේම එතුමී ඉන්දියාවට ගියේත් සංඝමිත්තා මෙහෙණීන් වහන්සේ ලංකාවට පැමිණියා වගේ ලංකාවේ ශ්‍රී මහා බෝධීන් වහන්සේගෙන් බෝ පැළයක් අරගෙනයි.

ඒ බෝ පැළය ජම්බුද්වීප භූමියේ රෝපනය කර, බෞද්ධ උපසිකාවක් වශයෙන් මේ භාරදූර ප්‍රශ්නය නිරාකරණය කිරීම සඳහා ඉදිරිපත් වුණා. ඉතා දූර දර්ශනයක් හා දරු සෙනෙහක් ඇති මවක මෙන් රටේත් ජාතියේත් අනාගත දරු පිරිසේ සුභ සිද්ධිය සඳහා තම ශීල ගුණධර්මතාවයන් පෙරදැරි කරගෙන මේ ප්‍රශ්නය විසඳීමට ගරු අගමැතිනිය අධිෂ්ඨාන කර ගත්තා. සිංහල භාෂාව ගැන වේදිකාවලදී බොහොම කථා කරන අපේ අවිස්සාවේල්ලේ ගරු මන්ත්‍රීතුමා (ඩී. පී. ආර්. ගුණවර්ධන මයා.) නිතරම වාගේ මේ සභාවේදි කථා කරන්නේ ඉංග්‍රීසියෙනුයි. ඒ වාගේම ගාල්ලේ ගරු මන්ත්‍රීතුමාත් (ආචාර්ය ඩබ්ලිව්. දහනායක) නිතරම මෙහි කථා කරන්නේ ඉංග්‍රීසියෙනුයි. නමුත් වේදිකාවලදි නම් බොහොම ලොකු සිංහලයින්. අපේ ගරු අගමැතිනිය දඹදිවට පා තැබූ හැටියේම එතුමියගේ ඇමතිවරුන්ට හා නිලධාරීන්ට දුන් නියෝගය කුමක්ද? කිසිවකුත් තම තමන් සමඟ කථා කිරීමේදී ඉංග්‍රීසියෙන් කථා නොකළ යුතුය, තම මව් භාෂාවෙන්ම කථා කළ යුතුය කියායි. ඒ අනුව ඒ සියලුම දෙනා භාරතයට පා තැබූ අවස්ථාවේ පටන්ම කථා කළේ සිංහලෙන්. ඒ රටත් සමඟ කළ යුතු වූ රාජකාරි කටයුතුවලදී පමණයි, ඉංග්‍රීසියෙන් කථා කළේ. එවැනි තීක්ෂණ බුද්ධියක් ඇතිව වැඩ කළ එතුමිය ඇති කරගත් මේ ගිවිසුම ඉතා සුළු කොට සලකා සමච්චලයට භාජන කරන පිරිසකුත් සිටිනවා.

ජාත්‍යන්තර වශයෙන් කරන ලද සේවය සඳහා අපේ අගමැතිනියට අනාගතයේදි "නොබෙල්" ත්‍යාගය හිමි වීමේ භාග්‍යය පවා ලැබෙන්නට පුළුවන් බව අපේ විශ්වාසයයි. එය සකල ලංකාවටම ලැබෙන ගෞරවයක් වෙනවා. චීනය හා ඉන්දියාව අතර ඇති වූ අර්බුදයේදී එතුමිය අනික් රටවල් සමඟ සාකච්ඡා පවත්වා සාමයේ චිරස්ථිතිය සඳහා යම් යම්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තීරණ ඇති කරගෙන ඒ සාමයේ පණිවුඩය ඒ දෙරටට ගෙන ගිය අයුරු ලෝකයා හොඳින් දන්නවා. ඒ වාගේම මැදහත් ජාතීන්ගේ සම්මේලනයේදී සාමය උදෙසා නොයෙක් තීරණ ගැනීමට එතුමිය මහත් පරිශ්‍රමයක් දැරුවා. ඒ නිසා කවදා හෝ එතුමියට ඒ කළ ජාත්‍යන්තර සේවය සඳහා නොබෙල් ත්‍යාගය ලැබෙනවාට කිසිම සැකයක් නැහැ. එවැනි ත්‍යාගයක් ලැබීම පවා අවහිර කරන්නේ අපේ පත්‍රයි. ඇයි, මා එසේ කියන්නේ? අපේ අගමැතිනිය විසින් කරන ලද ඒ උතුම් සේවය පිළිබඳව ලංකාවේ ඉංග්‍රීසි පත්‍රවලින් කිසිත් සඳහනක් කර නැහැ. මේ රටේ පත්‍රවලින් ඒ උතුම් ජාත්‍යන්තර සේවය ගැන සුදුසු පරිදි සඳහන් නොකිරීමෙන් ඒ පත්‍ර ඔවුන්ගේ යුතුකමක් ඉටු නොකළ බව අපට නොපැකිළ කියන්න පුළුවනි. ඔවුන් දේශපාලන වශයෙන් කථා කළා මිස තම යුතුකම් ඉටු කළේ නැහැ. ඔවුන්ගේ යුතුකම් ඉටු කළා නම් ඉන්දියානු ප්‍රශ්නය විසඳීමේදී මෙන්ම අනික් අවස්ථාවලදීත් මීට වඩා ඉදිරියට ගොස් ජාත්‍යන්තර වශයෙන් මහත් කීර්තියක් ලංකාවට ලබාගන්න තිබුණා. නමුත් ඔවුන් ඊර්ෂ්‍යා සහගතව එතුමිය කරන හොඳ දේත් නරක අතට පෙරළා පත්‍රවල ලොකු අකුරින් පළ කිරීමටයි, කටයුතු කළේ.

ඉන්දියානු ප්‍රශ්නය නිරාකරණය කිරීමේදී ගරු අගමැතිනියට මෙන්ම එතුමියට සහාය දුන් ඇමතිවරුන්ටත් නිලධාරි මහතුන්ටත් අපේ අවංක ස්තුතිය පිරිනමනවා. ඒ පිළිබඳව අනාගත පරම්පරාව ඔවුන්ට ගරු කරනවා ඇති. ඒ වාගේම ඉන්දියාවේ ගරු අගමැතිතුමාටත් එතුමාට ආධාර කළ අනිකුත් සියලු දෙනාටත් අපි අපේ අවංක ස්තුතිය පිරිනමනවා, සුහද සිතින් මේ ප්‍රශ්නය විසඳීම ගැන. දැන් ඒ පිළිබඳව එක්තරා සම්මතයකට එළඹ තිබෙනවා. ඒ සම්මුතිය ක්‍රියාත්මක කිරීමටයි, කවුරුත් දැන් උත්සාහ දැරිය යුත්තේ. එය ක්‍රියාත්මක කිරීමට අකුල් හෙළන යම් පිරිස් දැන් සිටින බව අපි දන්නවා. ඒ සඳහා ඔවුන් දැන් කුමන්ත්‍රණ වැඩ පිළිවෙළක් ගෙන යනවා. ළඟදීම ඒ බලවේග සියල්ලක්ම එකතු වී කුමන්ත්‍රණයක් කරන්න පුළුවනි. ඒ කුමන්ත්‍රණය ගැන මම කල් ඇතිවම මේ අනාවැකිය කියනවා. මේ පිළිබඳව කල්පනා සහගතව බුද්ධිය මෙහෙයවා කටයුතු කළ යුතුව තිබෙනවා. මේ ප්‍රශ්නය මේ විදියට විසඳෙනවාට අකැමති, මෙය කෙටියෙන් අවසන් කරන්නට බලාපොරොත්තු නැති, ඇතැම් කපටි පුද්ගලයින් අද නොයෙකුත් කුමන්ත්‍රණ කරනවා. ඒ නොයෙකුත් බලවේග—මේ පාර්ලිමේන්තුව තුළත්, ඉන් පිටතත් ඇති බලවේග—දැන් එකතු වෙන්න යනවා. මේ ප්‍රශ්නයේදි පමණක් නොවෙයි, තෙල් සංස්ථාවන් ගැනීමේදීත් රක්ෂණ කටයුතු ගැනීමේදීත් පහර වැදුනු ඇතැම් අය—විශේෂයෙන්ම අධිරාජ්‍යවාදී අය—ඔවුන්ට වැදුනු පහරේ වේදනාවෙන් පිදි පිදී දැන් අවස්ථාව හරියයි හිතාගෙන කෙදිරි ගාමින් ඉදිරියට එනවා.

පාසල් රජයට ගැනීමේදීත් එක්තරා කොටසක් විරුද්ධ වූ බව තමුන්නාන්සේට මතක ඇති. එයින් වේදනාවට පත් වූ උදවියත් දැන් කෙදිරිගාමින් ඉදිරියට එනවා. එපමණක් නොවෙයි, දේශපාලන බංකොලොත් භාවය ලබා, මහජන අප්‍රසාදයට ලක් වී සිටින නායකයිනුත් දැන් ඉදිරියට එනවා. ඇතැම් අයගේ පිල්වලින් දැන් තම පාක්ෂිකයින් පවා පැන යනවා. අවිස්සාවේල්ලෙ ගරු මන්ත්‍රීතුමාගෙ අග්‍ර පුරෝහිතයන් වගේ හිටපු ඔක්කොම දැන් එතුමගෙන් ඉවත් වෙලා ගිහිල්ල බව අපි දන්නවා. ඒක පුදුමයට කාරණයක් නම් නොවෙයි. ඇයි ඒ උදවිය එහෙම ඒ විධියට ඉවත් වෙලා යන්නෙ? මේ විධියෙ තීරණවලදි—ජාතික ප්‍රශ්නවලදි—පසු බහින අය ගැන විශ්වාසයක් තබන්න බැරි නිසයි. කාලයක් තිස්සෙ එකට කටයුතු කරමින් හිටපු විලියම් සිල්වා මහත්මයත්, රෙජී පෙරේරා මහත්මයත් ඇතුළු විශාල පිරිසක් අද එතුමගෙන් ඉවත් වෙලා ගිහිල්ලයි ඉන්නෙ. ඇයි? රටට බොරුව ගෙන යද්දි තව දුරටත් එකට වැඩ කරගෙන යාම බැරි දෙයක් නිසයි.

පාර්ලිමේන්තුව ඇතුළතත්, ඉන් පිටතත් තිබෙන බලවේග ඔක්කොම දැන් එකතු වෙනවා. කවුරුත් දන්නවා දැන් ඉන්දියානු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[විලියම් ප්‍රනාන්දු මයා.]

ප්‍රශ්නය වැනි ප්‍රශ්නත් විසඳීමේ වැඩ කටයුතු ක්‍රියාත්මක වෙන්න යන වෙලාව බව. මේවා හරියට සිද්ධ වුණොත් මීට පස්සෙ මෙතෙක් කල් පාවිච්චි කළ දේශපාලන ආයුධයක්, ඡන්ද ගැනීමේ ආයුධයක් නැති වෙනවය කියන බියක් ඇතැම් අය තුළ ඇති වේගන එනවා. ඒ කල්පනාවෙන් දූන් එවැනි සෑම බලවේග යක්ම එකතු කරගෙන අමුතු ආදරයක් දක්වමින් ඇතැම් අය අධිරාජ්‍යවාදීන්ගේ සහයෝගයත් ලබා ගන්න වැඩ කරගෙන යනවා. මට මේ වෙලාවෙ එකක් මතක් වෙනව. නැවක් ගිලෙන්න යන අවසථාවක නැත්නම් එවැනි අනතුරකට භාජන වෙන්න යන අවසථාවක අර මොකක්දෝ නාදයක් නිකුත් කරන්නෙ, අන්න ඒ නාදය මට මතක් වෙනවා. හදිසි අවසථාවල එස්. ඕ. එස්. ද මොකක්ද කියන ඉංග්‍රීසි අකුරු තුනක් හඬ නංවනවා. ඒක මොකක්ද කියන්න මා දන්නෙ නැහැ. අන්න ඒ වගේ තමයි ඇතැම් උදවිය අපේ ආත්ම බේරා ගන්න කියමින් නාද කරන්නෙත්. බේරේ ගෙදර ගිලෙන්න යනව. එයින් ඇතැම් උදවිය අමාරුවෙ වැටෙනව. නැව ගිලෙන්න යන විට බේරා ගන්නෙයි කියල කෑ ගහන්නා වගේ මේ බලවේග සියල්ලම එකතු වෙලා බේරේ ගෙදර බේරා ගන්නෙයි කියනවා. එහි මුවාවෙන් මේ රටේ බලය අල්ලා ගන්න ඇතැම් උදවිය ක්‍රියා කරනවා. පත්තරේ පොටෝ දමාගෙන නොයෙක් විධියෙන් වීරයන් වෙන්න හදනවා. බලවේග ඔක්කොම සම්පූර්ණයෙන් එකට එකතු වෙලා ඉන්න බව අපි දන්නවා.

මොකද මේ බලවේග ඔක්කොම එකතු වෙලා කරන්න යන්නෙ? දැනටමත් ලොකු කුමන්ත්‍රණයක් තිබෙනවා. ඒ අය සටනක් ගෙන යනවා ඇති. ගැටවරයන් තුන් සියයක් පමණ සූදානම් කරගෙන යනවලු. ලේවලින් දෙන්න යනවලු. ඒ ගැටවරයො ජීවිත පරිත්‍යාගයෙන්—ලේවලින්—කටයුතු කරන්න යනවය කියනවා, මේ නායකයෝ. ඒ ගැටවරයින්ගෙ හිස් මුඩු කරලා, කහ සිවුරු පොරවලා, ඉදිරියට යවන්නයි හදන්නෙ. එතකොට අර චීවර—සිවුරු—ඇඳගත් පිරිස යන විට ඉදිරියට නිල් කමිස ඇඳපු ඔවුන්ගෙ අනුගාමිකයන් එනව.

**ජේ. ආර්. ජයවර්ධන මයා.** (දකුණු කොළඹ පළමුවන මන්ත්‍රී)

*(திரு. ஜே. ஆர். ஜயவர்தன—கொழும்புத் தெற்கு முதலாம் அங்கத்தவர்)*

(Mr. J. R. Jayewardene—First Colombo South)

කොහෙද ?

**විලියම් ප්‍රනාන්දු මයා.**

*(திரு. வில்லியம் பெர்ணண்டோ)*

(Mr. William Fernando)

ඒ විධියට සිදු වුණාම අර්බුදයක් ඇති වෙනව. එතකොට මෙන්න මේ අය මේ රටේ භික්ෂූන් වහන්සේලාට ගල් ගැහැව්වය කියමින් ජනතාව විරෝධය පළ කරමින් නැඟී සිටිනව. අන්න එහෙම රටවාසීන් අවුස්සලා දකුණු වියට්නාමයේ තත්ත්වයට සමාන තත්ත්වයකට මේ රටත් ගෙන එන්න උත්සාහ කරනව.

**ජේ. ආර්. ජයවර්ධන මයා.**

*(திரு. ஜே. ஆர். ஜயவர்தன)*

(Mr. J. R. Jayewardene)

කොහෙද ? කොහොමද ? කවුද ?

**විලියම් ප්‍රනාන්දු මයා.**

*(திரு. வில்லியம் பெர்ணண்டோ)*

(Mr. William Fernando)

ඒ නිසා ගරුතර සංඝරත්නයට නමස්කාර කර, දෙපා වැඳ ඉල්ලා සිටින්නෙ මේ විධියෙ උපායවල් රාශියකට මැදි වෙලා අප ඉන්න බව කල්පනා කරන ලෙසයි. අද සංඝයා වහන්සේගේ ඇතැම් කොටස් ක්‍රියා කරන්නේ එවැනි තත්ත්වයකට මැදි වෙලයි. එද සම්පූර්ණ යෙන්ම 65,000ක් පමණ යුද්ධ තුවක්කු සහ පතරොම් ආදිය ලෑස්ති කර ගත්තෙ වෙන කාටවත් විරුද්ධව ක්‍රියා කරන්න නොවෙයි: මේ රටේ බෞද්ධ ජනතාවට විරුද්ධවයි. ඒවා නැවත වරක් එළියට ගන්න දූන් සූදානම් වෙනවා. එද අධිරාජ්‍ය වාදීන්ගේ අනුගාමිකයන් වශයෙන් හිටපු පත්තර සමාගම් දෙකක්—මම පිළිගන්නවා "ටයිම්ස් ඔෆ් සිලෝන්" පත්තර සමාගමත්—

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.** (කොට්ටාව)
*(திரு. டீ. பி. ஆர். குணவர்தன—கொட்டாவ)*
(Mr. D. B. R. Gunawardena—Kottawa)
අනික මොකක්ද?

**විලියම් ප්‍රනාන්දු මයා.**
*(திரு. வில்லியம் பெர்ணாண்டோ)*
(Mr. William Fernando)
තමුසෙ කෑ ගහන්නෙ නැතුව ඉන්නව. තමුසෙටත් වාරයක් එනවානේ. ලේක් හවුස් පත්තර සමාගමත් දැන් සම්පූර්ණයෙන්ම සූදානම් කරගෙන වැඩ කරගෙන යනව කතෝලික බලවේගයත් සමග එකතු වෙලා. මේ වෙලාවෙදි වැඩ කරන්නෙ සම්පූර්ණයෙන්ම හාමුදුරුවරුන් ඉස්සරහට දමාගෙනයි. එක පාදිලිකෙනෙක්වත් මේ දවස්වල වේදිකාවට ආවද? සම්පූර්ණයෙන්ම පිට ඉඳගෙනයි වැඩ කරගෙන යන්නෙ. අවසාන මොහොතෙදි මොකක් වේද යන්න ගරුතර මහා සංඝයා වහන්සේටත් ඇතැම් පිරිසකටත් තේරුම් යාවි. මේ රටේ ළඟදී මහා සංඝයා වහන්සේ රැස්වන තැනකදී නිල් කමිස අන්දවපු පිරිසක් දමා—මා මුලින් කී හැටියට හිස මුඩු කරගත් 300ක් දෙනාත් දමා—මහා භයානක අපරාධයක් මේ රටට කරන්න යන්නෙ. මේ ජාතික ප්‍රශ්නයක් වන ඉන්දියානු ප්‍රශ්නය විසඳන්නට යන වෙලාවෙ ප්‍රවෘත්ති පත්‍ර සමාගම් මේ ගැන පිකක් කල්පනා කර බලන්ට ඕනෑ. තමන්ගේ පණ බේරගන්ට ක්‍රියා කරන්නා වගේ නොවෙයි, ජාතිය විනාශ කරන්ට ඉඩ තබන්ට හොඳ නැහැ.

අපේ ජාතික විමුක්ති පෙරමුණට මා කියනවා, කල්පනාවෙන් වැඩ කරන්ට කියා. පත්‍ර කියන හැටියට නැගී රැස්වීම්වල කථා පවත්වා තමන්ගේ ඡායාරූප ප්‍රසිද්ධ කර ගැනීමට ක්‍රියා නොකර ජාතියේ නාමයෙන් ප්‍රශ්න විසඳෙන වෙලාවේදී ඊට ආධාර දෙන්ට ඕනෑ. මා දන්නව, දඹදෙනියේ ගරු මන්ත්‍රීතුමාට (ආර්. ජී. සේනානායක මයා.) ඉන්දියානු ප්‍රශ්නය ගැන විශාල කැක්කුමක් තිබුණු බව. අද පාර්ලිමේන්තුව විවෘත කරන අවස්ථාවේදී අපි තීරණයක් ගත්ත. ජාතියට හිතවත් අය කවුද කියා අපි ඒ අවස්ථාවේදී තීරණය කර ගත්ත. අද අග්‍රාණ්ඩුකාරතුමා රාජාසන කථාව කිය වද්දී මේ ජාති ද්‍රෝහීන් නැගිට යද්දී එතැන රැඳී සිටියේ විරුද්ධ පාර්ශ්වයේ ඉන්දියානු ප්‍රශ්නය ගැන කැක්කුමක් ඇති එකම ශ්‍රේෂ්ඨයයි. දඹදෙනියේ ගරු මන්ත්‍රීතුමා පමණයි හිටියෙ. අනිකුත් ජාති භ්‍රෂ්ඨයෝ අද නැගිට ගියා. බුද්ධාගම බේරගන්ට කියා මොර ගාන්ට මහජනයා වෙත ළඟදී යාවි. ඒ උදවිය මහජනයා ඉදිරිපිටට ආවාම අපි හොඳ පිළිතුරු දෙනවා. මේ විතරක් නොවෙයි; තවත් වැදගත් කරුණු තිබෙනව. අදම ඒ උදවිය නැගිට ගියා. මම කියනව, ඔය විධියට ම තොලොංජි වෙලා යන්ට කියා.

දෙමළ භාෂාවේ තිබෙනව, "තොලොංජි" වෙලා පලයන් කියා වචනයක්. අනික් මැතිවරණයේදී දුප්පත් ජනතාව ඒ තීරණය දෙනවා ඇති. මා දන් කියන්නෙ නැහැ; කවදා හරි මේ ප්‍රශ්න එළිවෙනවා ඇති. එදාට තමුන්නාන්සේලාට ඡන්ද ව්‍යාපාරවලට ගමකට යන්ට හම්බ වෙන්නෙ නැහැ. ගුටි කන්ටයි සිද්ධ වෙන්නෙ. තමුන්නාන්සේලා යම් යම් ක්‍රමවලින් කෝටි ගණන් මුදල් එකතු කළ බව අපි දන්නව. තෙල් සමාගම් වැනි නොයෙකුත් ව්‍යාපාර තමුන්නාන්සේලාට ධනය යොදවා තිබෙනව. පත්‍ර සමාගම් ලක්ෂ ගණන් යොදවා තිබෙනව. ඒ ධෛර්යයෙන් තමයි, තමුන්නාන්සේලා ඉදිරියට යන්නෙ. දවසින් දවස බලයෙන් බලයට පත්වෙමින් ඉදිරියට යන මේ සමාජවාදී ආණ්ඩුවට පහර ගැසීමට දැන් ඉදිරිපත් වී සිටින ධනේශ්වර කණ්ඩායම්වලට, ඇතැම් සමාජවාදීය කියන බල ලෝභී කොටසුත් එකතුවන්ට යෑම නින්දා සහගතයි. ඒකයි මට කනගාටු.

සමහරවිට ජාතික ආණ්ඩුවක් පිහිටුවන්ටද දන්නෙත් නැහැ. 1960 මාර්තු මාසයේ එක්සත් ජාතික පක්ෂයට ආසන කීපයක් ලැබුණු අවස්ථාවේදී ජාතික ආණ්ඩුවක් ගැන අවිස්සාවේල්ලේ ගරු මන්ත්‍රීතුමා කථා කළා. සමහරවිට ඒ ඔස්සේ යනවද දන්නෙ නැහැ. බැරි වෙලාවෙදී යූ. එන්. පී. එකේවත් "සරණං ගච්ඡාමි" කියා හිතනවාද දන්නෙ නැහැ. [බාධා කිරීමක්] ඒ නිසා මේ භයානක

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[විලියම් ප්‍රනාන්දු මයා.]

අවස්ථාවේදී අප ටිකක් කල්පනා කළ යුතුව තිබෙනව. බුද්ධාගමට තැන දෙන්ට යන අවස්ථාවේදී මේ සභාවෙන් නැගිට ගියා, බුද්ධාගම ගැන කැක්කුමක් තිබෙනවාය කියන මේ උදවිය. ඒ මොකද? උන්නැහේලා කතෝලික බලවේගයත් සමග යම්කිසි බැඳීමක් ඇතිව සිටි නිසයි. අද ඒ නිසා එතැන ඉන්ට බැහැ. නාස් ලණුව අදින හැටියටයි, උන්නැහේලා වැඩ කරන්නෙ. වතිකානුවේ සණ්ඨාරයට ඇදිල ගියා. ඒක කියන විට උන්නැහේලා රූංගාලා සභාවෙන් නැගිට යන්ට ගියා. ඒක මහා පුදුමයක් නොවෙයි. මේ කරුණු ජාතිය හොඳ හැටි තේරුම් ගනීවි.

අපි බුද්ධාගමට තැන දෙන්ට යන මේ වෙලාවෙදී, ඒක මහා බොරුවක්ය කියා පත්‍රයක පළ වී තිබීම ගැන මා පුදුම වෙනව. මේ ගැන විශේෂයෙන් සොයා බලන්ට ඕනෑ. මා කියෙව්වෙ "දිනමිණ" පත්‍රයයි. මට ඉංග්‍රීසි පත්‍ර කියවන්ට ලැබුණෙ නැහැ. පත්‍රයේ තිබුණේ මෙසේ යි; "මුකවාඩම් විරෝධි සංඝ සභාවට ආරාධනා: විහාර හා පිරුවන් සැමටම යවති" ඒ ලියුම් ගැන එහෙම සම්පූර්ණයෙන් කියන්ට මට කාලය මදි නිසා මා කියන්ට යන්නෙ නැහැ.

"මුකවාඩම් පනත් පැනවීමෙන් ඒකාධිපති පාලනයකට මඟ පාදාලීම වළකා ගැනීමට මහා සංඝයා වහන්සේ අනුගමනය කළ යුතු ක්‍රියා පිළිවෙල තීරණය කරගැනීම සඳහා ලබන 28 වැනිදා පැවැත්වෙන මහා සංඝ රැස්වීමට එන ලෙස එහි සංවිධායක මණ්ඩලය සැම විහාරස්ථානයකම සහ සැම පිරිවෙනකම භික්ෂූන්ට ආරාධනා යවා ඇත.

මේ පිළිබඳව නා හිමිවරුන් හා හිමිවරුන් විසි දෙනෙකුගෙන් යුත් සංවිධායක මණ්ඩලය විසින් නිකුත් කර ඇති නිවේදනය සම්පූර්ණයෙන් මෙසේ ය.

ශාසනාලයෙන් කෙරෙන ආරාධනයයි. ශාසනය බේරා ගනිමු."

කාගෙන්ද මම දන්නෙ නැහැ.

"මහා සංඝයා වහන්සේ ඉවත් කර දමා පන්සල් රජ්‍යේ පාලනයට ගෙන මුරකාරයින්ට බාර දී ධාතු කරඬුව පවා රාජ්‍ය නිලධාරීන් කැමති තැනකට ගෙනයෑමට බලය දීම තෙක් පණවා ඇති වහල් නීති මගින් බුද්ධ ශාසනය යටත් කොට විහාරස්ථාන රත්නත්‍රයට කැප වූ නිදහස් ආයතන වශයෙන් පවත්වා ගැනීමට අවකාශ නොදී රජය වෙත පවරා ගෙන තිබෙන ඒකාධිකාර බලතල නිසා ශාසන ස්වතන්ත්‍රතාවත් මහා සංඝයා සතු ශාසනික වගකීම හා අයිතියත් සඳහටම නැති වී යන තැනට කටයුතු සැලසී ඇති බැවින් ඒ අසාධාරණ ඒකාධිපති නීතිවලින් බුද්ධ ශාසනය නිදහස් කර ගැනීම;

බුද්ධ ශාසනයේ නිදහස නැති කර දමා මෙතරම් භයානක ඒකාධිකාරයක් රජය වෙත පවරා ගෙන ඇති අතර ගෙයක් ගානේ පවුලේ තැබැරුමක් ඇති කරලීමත් රා වරමක් දීමෙන් ජනතාවත් ආගම ප්‍රතිපත්තිවලින් පිරිහෙලා දමා මහජනයා ලවාම ආගම විනාශ කරවීමත් සඳහා සියුම් උපක්‍රමයෙන් සිදුවන විපත වලක්වා ගැනීම;

ශාසන ස්වතන්ත්‍රතාවත් මහාජන නිදහසත් සුන් කර දමා රජය විසින් කවර නීතියක් පැන වුවත් කවර නීතියක් ක්‍රියාවේ යෙදවුවත් ඒ ගැන කථා කිරීමට ලිවීමට හෝ අදහස් පළ කිරීමට ගිහි පැවිදි කිසිවෙකුටත් අවකාශ නොතබා මුකවාඩම් පණත් පැනවීමෙන් ඒකාධිපති පාලනයකට මඟ පාදලීම වලක ගැනීම;

මේ රටේ ජාතික අධ්‍යාපනයේ පරම සංකේතය වූ පිරිවෙන්වල උසස් තත්ත්වය නැති කර දමා මහා සංඝයා වහන්සේගේ සේවය පහත හෙලීමට අධ්‍යාපන ධවල පත්‍රිකාවෙන් ඉදිරිපත් කර ඇති යෝජනා ක්‍රියාවේ යෙදීමෙන් පිරිවෙන්වලට සිදු වන හානිය වලකා ගැනීම;

යන කරුණු පිළිබඳව පැහැදිලි අවබෝධයක් ඇති කොට ගෙන ශාසනික නිදහස හා ජාතික නිදහසත් පිරිවෙන්වල උසස් තත්ත්වයත් ආරක්ෂා කර ගැනීම පිණිස මහා සංඝයා වහන්සේ අනුගමනය කළ යුතු ක්‍රියා පිළිවෙළ තීරණය කර ගැනීම සඳහා ත්‍රෛනිකායික මහා සංඝයා වහන්සේගේ ඒකාබද්ධ මහා සභා රැස්වීමක් මේ මස 28 වනදා සවස 2 ට කොළඹ නගර සභා මන්දිරය අසල දී පැවැත්වේ.

දිවයිනේ හැම පළාත්වලින්ම දහස් ගණනින් මහා සංඝයා වහන්සේ එක් රැස් වන මේ මහා සභාවට වැඩමවන ලෙස ශාසනාලය පූර්වක මෙත් සිතින් මෙයින් ආරාධනය කරමු."

මේ නිවේදනය පිරිවෙන් සියල්ලටම යවා තිබෙනව. මේ මහා සංඝ සභාවේ නායක හාමුදුරුවරු—[බාධා කිරීමක්] මෙය පළ වී තිබෙන්නේ 1964 නොවැම්බර් මස 18 වැනි දින "දිනමිණ" පත්‍රයේ යි.

මෙහි තිබෙන්නෙ මෙන්න මෙහෙමයි: මේ සංවිධානය මුළු මහත් 15,000 ක් පමණ මහා සංඝ රත්නය වෙනුවෙන් මේ ප්‍රකාශය කර තිබෙන්නෙ කාගේ බලයක් පිටද කියා මා දන්නෙ නැහැ. මේ ආරාධනය යවා තිබෙන්නේ බෙල්ලන්විල සෝමරතන නායක ස්ථවිර, මාලේවන ඤාණිස්සර ස්ථවිර—[බාධා කිරීමක්] හංචාපොල විමලවංශ නායක ස්ථවිර,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මාදම්පිටියේ ජිනානන්ද මහානායක ස්ථවිර, මාදම්පිටියේ ශීලක්ඛන්ධ නායක ස්ථවිර, දාම්පේ රතනසාර ස්ථවිර, කඳුබොඩගම සීලානන්ද නායක ස්ථවිර, පළුවැල්ගාලේ සරණපාල නායක ස්ථවිර, පණ්ඩිත මිරිස්සේ චන්දජෝති ස්ථවිර, දෙමළපෝරුවේ ධීරානන්ද නායක ස්ථවිර, මැදගොඩ ධම්මජෝති නායක ස්ථවිර, පණ්ඩිත කිරිඇල්ලේ ඥානවිමල නායක ස්ථවිර, මාතර විමලතිස්ස නායක ස්ථවිර, දූවමොට්ටාවේ අමරවංශ ස්ථවිර, බෝරුක්ගමුවේ දෙවමිත්ත නායක ස්ථවිර, කරපුටුගල ධම්මවංස නායක ස්ථවිර, දොඩන්දූවේ ධම්මාරාම නායක ස්ථවිර, මිටියාගොඩ ගුණරතන ස්ථවිර—"මිස්ටර් කොඩිකාර" කියනව මෙයාට—කව්ද මම දන්නෙ නැහැ.

**විවියන් ගුණවර්ධන මිය. (පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම්)**

*(திருமதி விவியன் குணவர்தன—உள்ளூராட்சி, உள்நாட்டு விவகார அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)*

(Mrs. Vivienne Goonewardene—Parliamentary Secretary to the Minister of Local Government and Home Affairs)

හේමචන්ද්‍ර කොඩිකාර.

**විලියම් ප්‍රනාන්දු මයා.**

*(திரு. விலியம் பெர்ணாண்டோ)*

(Mr. William Fernando)

ඒක ඉතාම නින්දිත වැඩක්. ගිහියෙකුගේ නමින් ලිපි ලියනව. මහා සංඝයා වෙනුවෙන් නිවේදන නිකුත් කරනව. මීටියාගොඩ ගුණරතන කියන මේ පුද්ගලයා කව්රු හෝ වේවා "දවස" පත්‍රයේ ලේඛකයකු බව මම දන්නව. හේමචන්ද්‍ර කොඩිකාර නමින් පත්‍රයට ලියුම් ලියනව. පසුගිය කාලෙ මේ සංස්කෘතික දෙපාර්තමේන්තුවෙ කැමරාවකට මොකක්ද එකක් කරල කලබලයකුත් කළේ ඔයයි.

ගරු කථානායකතුමනි, ඊළඟට පණ්ඩිත තලල්ලේ ධම්මාලෝක ස්ථවිර, උඩුකාවේ පණ්ඩිත ආනන්ද සාගර ස්ථවිර, දියකඩුවේ ධම්මානන්ද ස්ථවිර, පිටිගල ඥාණරතන, යන මෙන්න මේ ස්වාමීන් වහන්සේලයි මේ නිවේදනය යවා තිබෙන්නෙ. ඉතින් බුද්ධ ශාසනය මේ කාගෙන් බේරා ගන්නද හදන්නෙ කියන ප්‍රශ්නයයි මම අසන්නෙ.

ගරු කථානායකතුමනි, මේ 19 වැනිදා "දවස" පත්‍රයෙත් මුල් පිටුවෙ බොහොම ලක්ෂණට දමා තිබෙන "බුද්ධාගම රජයේ ආගම වෙයිද?" කියා ප්‍රවෘත්තියටයක්. පත්‍රයේ මුල් තැන ඒ ප්‍රවෘත්තියට දී තිබෙනව. ඒ ගැන අපි ස්තුතිවන්ත වෙනව. නමුත් ඒ සමගම මේ පත්‍රයෙ ඇතුල් පිටුවක තවත් ලිපියක් පළ කර තිබෙනව. [පත්‍ර පිටුවක් පෙන්වමින්] මේ බලන්න. දුන්වීමක් මේ තරම් විශාල අත්දමින් පළ කරන්න රුපියල් කී සියයකින් පුළුවන්ද?

ගරු කථානායකතුමනි, ශාසනය බේරා ගන්නය කියා මේ ආකාරයට ස්වාමීන් වහන්සේලා කීප නමක් කියා තිබෙනව. නමුත් ශාසනය සම්බන්ධයෙන් අප මෙන්න මේවා කර තිබෙන බව මා පෙන්වා දෙන්න කැමතියි. බණ්ඩාරනායක ශ්‍රීමතාණන් විශේෂයෙන්ම සංස්කෘතික දෙපාර්තමේන්තුවක් ඇති කළා. පැරණි සිද්ධස්ථාන රාශියක්ම සුද්ධ නගර වශයෙන් ප්‍රතිසංස්කරණය කර කටයුතු කරගෙන යන්නෙ මේ ආණ්ඩුවයි. ඒ සමගම මහා සංඝයා වෙනුවෙන් විශ්ව විද්‍යාල දෙකකුත් ඇති කළ බව මා මතක් කරන්න සතුටුයි. මහා සංඝයා වෙනුවෙන් ළඟදී වෙනමම විශ්ව විද්‍යාලයක් ඇති කිරීමටත් කටයුතු කර ගෙන යනව. ඒ වාගේම ආගම ඉගැන්වීම පිණිස භික්ෂූන් වහන්සේලා දහස් ගණනක් පාසැල්වලට පත් කර තිබෙනව. සෑම තැනම දහම් පාසැල් පිහිටුවා රජයේ මුදල් රුපියල් ලක්ෂ ගණනින් වියදම් කර පොත් පත් මුද්‍රණය කරවා බෙදා දී තිබෙනව. මේ විධියටයි අප කටයුතු කර තිබෙන්නෙ. ඒ වාගේම පෝය දින නිවාඩු දින කිරීමට කටයුතු කරගෙන යනව. සතර පෝය නිවාඩු දින කිරීමත් අපේ ආණ්ඩුවේම වැඩක්. දැන් ඒකට බොහොම දෙනෙක් නෑකම් කියන්නට හදනව. යමක් කෙරෙන විට දුවල ගිහින් කෝච්චියෙ එල්ලෙන්න හදනව. අපේ සහභාග කෝච්චියෙ ආවෙ නැහැ. ඉතින් අපි මොකද කරන්නෙ? ගරු කථානායකතුමනි ඒ වාගේම 1962-63 වර්ෂය සඳහා සංස්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ස්තුති යෝජනාව පිළිබඳ විවාදය

[විලියම් ප්‍රනාන්දු මයා.]
කෘතික කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ තැන විසින් නිකුත් කළ පාලන වාර්තාවේ මෙසේ සඳහන් වෙනවා:

"ලංකා බෞද්ධ මණ්ඩල අරමුදලින් කෙරෙන ඉතා වැදගත් වැඩය නම් ත්‍රිපිටකය සිංහලට පරිවර්තනය කොට පාළි පොතත් සමග මුද්‍රණය කොට පළ කිරීමයි. මේ සඳහා මේ වර්ෂය තුළ වැය වී ඇති මුළු මුදල රුපියල් 1,41,903කි. දැනට මෙම කටයුතු සඳහා වැය වී ඇති මුළු මුදල රුපියල් 10,19,803කි. පරිවර්තනය කළ යුතුව තිබුණේ පොත් 44කි. ඉන් 41ක් පරිවර්තනය කොට හමාරය. ඉතිරි තුන පරිවර්තනය කරගෙන යනු ලැබේ. ......දැනට පහත සඳහන් පොත් ප්‍රකාශයට පමුණුවා තිබේ:—

මහාවග්ගපාළි පළමුවෙනි කාණ්ඩය
මහාවග්ගපාළි දෙවෙනි කාණ්ඩය
පාරාජිකාපාළි
මහානිද්දේසපාළි
සංයුත්ත නිකාය පළමුවෙනි කාණ්ඩය
අංගුත්තර නිකාය පළමුවෙනි කාණ්ඩය
ඛුද්දක නිකාය පළමුවෙනි කාණ්ඩය
අපදානපාළි
අංගුත්තර නිකාය දෙවෙනි කාණ්ඩය
දීඝ නිකාය පළමුවෙනි කාණ්ඩය
සංයුත්ත නිකාය දෙවෙනි කාණ්ඩය
චුල්ලවග්ගපාළි I
මජ්ජිමනිකාය II
ධම්මසංඝනිප්‍රකරණය
අපදානපාළි II

(ආ) ශ්‍රී දළදා මාළිගාව ප්‍රතිසංස්කරණය කිරීම—ශ්‍රී දළදා මාළිගාව ප්‍රතිසංස්කරණය කිරීම සඳහා මෙම අරමුදලෙන් රුපියල් 21,94,360ක් වෙන් කොට තිබේ. ඉන් වර්ෂය අවසාන වන තෙක් රුපියල් 18,14,230ක් වැය කොට ප්‍රතිසංස්කරණවලින් වැඩි හරියක් දැන් නිම කර තිබේ. මේ අවුරුද්දේ කරන ලද ප්‍රතිසංස්කරණ සඳහා රුපියල් 33,974ක් වියදම් කර තිබේ."

ගරු කථානායකතුමනි, මේ ආකාරයට සිද්ධස්ථාන සම්බන්ධයෙනුත් වෙනත් ආගමික කරුණු සම්බන්ධයෙනුත් කරන ලද සේවා ගැන සංස්කෘතික කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ තැනගේ 1962-63 වර්ෂය වෙනුවෙන් නිකුත් කරන ලද පාලන වාර්තාවෙහි වෙන් වශයෙන් සඳහන් කර තිබෙනවා. ඒ හැම එකක් ගැනම මා මේ අවස්ථාවේදී සඳහන් කරන්නට අදහසක් නැහැ. මේ ආණ්ඩුව මේ ආකාරයට වැඩ කරගෙන යතත්, ඇත්තෙන්ම මේ ආණ්ඩුව ආගම විනාශ කරන්නට යනවා යයි ඇතැම් අය චෝදනා කරනවා. මේ විධියට මුදල් වැය කර බුද්ධ ශාසනය විනාශ කරනවාලු. ඉක්මනින්ම මේ ආණ්ඩුව විනාශ කර බුද්ධ ශාසනය බේරා ගන්නලු. බෞද්ධ විශ්ව විද්‍යාල ආදිය ඇති කළ මේ ආණ්ඩුව ශාසනය විනාශ කරනවාලු. මේ ආණ්ඩුව කරන ශාසන විනාශය දැක නිකම් බලාගෙන ඉන්න බැරිලු.

ගරු කථානායකතුමනි, ඇතැම් ස්වාමීන් වහන්සේලා පත්‍ර කාරයන්ගෙන් ලබා ගන්නා ලද කොන්ත්‍රාත්තුවක් අනුව වැඩ කරගෙන යන බවයි, මට නම් පෙනෙන්නේ. කොන්ත්‍රාත්තුව නිසා උන් වහන්සේලා මොනවා හරි කියන්න ඕනෑලු. කෙසේ වෙතත් ශික්ෂාකාමී භික්ෂූන් වහන්සේලා අපේ පැත්තේ බව අප දන්නවා. ජාතියත් ආගමත් බේරා ගැනීමට ඒ භික්ෂූන් වහන්සේලා ඉන්නවා. හැබැයි, විශාල වතු හිමි ධනේශ්වර උන්නාන්සේලා විරුද්ධ පාර්ශවයේ සිටින බවත් අප දන්නවා. උන්නාන්සේලා මේ උත්සාහ කරන්නේ ශාසනය බේරා ගන්නට නොව ධනය බේරා ගන්නටයි. සමසමාජ පක්ෂයේ දෙතුන් දෙනකු ඇමති ධුරවලට පත් කිරීමෙන් පසුවයි, මේ අය කලබල වී සිටින්නේ. අවිස්සාවේල්ලේ ගරු මන්ත්‍රීවරයා මාක්ස්වාදයේ පියා වුණත් දැන් එතුමාත් ඒ හාමුදුරුවරුන්ට හොඳ වෙලා. රට ඉදිරියට ගෙන යෑම සඳහා සභාග ආණ්ඩුව පිහිටුවා කටයුතු කරගෙන යන විටයි, ඇතැම් හාමුදුරුවරුනුත් පත්‍රකාරයනුත් නැති ගැනී ඉන්නේ. ඒ අය ඉස්සර මේ ගරු මන්ත්‍රීවරුන්ට විරුද්ධව නොයෙකුත් චෝදනා එල්ල කළ බව අපි දන්නවා. නමුත් අවසානයේදී අපත් සමග එකතු වී රටට වැඩ කිරීම සඳහා සභාග ආණ්ඩුවක් පිහිටුවා ගතයුතුය කියා ඒ අය තේරුම් ගත්තා.

ඒ කට්ටිය කොයිම පන්සලක්වත් කඩල නැහැ; ගිනි තියලත් නැහැ. ඒ විධියෙ වැඩ කොහේදිවත් කර නැහැ. නමුත් ඒ අයට මඩ ගැසීමෙ අදහසින් වෙනත් අය ඒ විධියෙ වැඩ කරන්න ලැස්තියි. කොයි වේලේ හරි බුද්ධ ප්‍රතිමාවක් කඩා දමාවි, අර පිරිස; අර කුමන්ත්‍රණකාරයො. [බාධා කිරීමක්] අර අද නැගිටල ගියෙ, ඒ කට්ටිය. කොහේ හරි ඩයිනමයිට් එකක් දාල කලබලයක් ඇති කරල "රතු, රතු, රතු" කියා කෑ ගසාවි. සමහර විට ඒ අයගෙ පක්ෂයෙම තරුණයන්ට රතු පාට ඇඳුම් අන්දවා එවාවි. මෙවැනි ආරංචි පත්‍ර මගින් රටේ ජනතාවට දුන්නොත්, ඒව ජාති හිතෛෂී

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පත්‍ර හැටියට හඳුන්වන්න පුළුවනි. ඇත්ත වශයෙන්ම පත්‍ර කන්තෝරුවලින් පැමිණ මෙහි වාර්තා ගන්න මහත්වරු නම් හොඳ අය බව අපි දන්නවා. නමුත් ඒ අය වාර්තා යැවීමට පස්සෙ සේරම ඉවත් කරනවා. ඒ අයගෙ අත්වල ඇඟිලි සහ පැන්සල් ජාතික මමත්වයක් ඇතිව වැඩ කරනවා. නමුත් පත්‍ර කන්තෝරුවල සිටින ලොකු මිනිස්සු එම වැඩ එක පාරටම "ක්‍රිස්, ක්‍රිස්" ගාල කපා දමනවා. ඒ අය ලියනවා, "මේ වැඩ භයානකයි; අද රතු අය රිංගා ගෙන සිටිනවා; මේවා දැන් මෙහෙමයි වෙන්නෙ" යනාදි වශයෙන්. ඒ අය බය වෙලා තියෙන්නෙ අර කට්ටියටයි.

ගරු කථානායකතුමනි, ශාසනයට ඇතු ළත් වන කෙනෙක් ඊට ඇතුළත් කර ගන්නෙ එහි තියෙන පරමාර්ථ නිසියාකාර පිළිගත්තට පසුවයි. එසේ පිළිගත්තට පසු අංගුලිමාල, ආලවක යනාදී මිනී කෑ අය පවා ශාසනයට භාර ගත්ත. එවැනි අය එදා බුද්ධ ශාසනයට භාර ගත්තාය කියා ඔවුන් ඇතුළු වන්නට පෙර ශාසන යට ඇතුළුව සිටි අය පැන ගියාද ?

මධ්‍යම ප්‍රතිපදාව අනුව කෙසේ හෝ සමාජවාදි ගමන යාම සඳහා මේ අය අපට සහාය දීම නිසා ධනවාදී කොටස් සම් පූර්ණයෙන්ම බිය වුණා. ඔවුන් අද තැති ගැනී සිටිනවා. බණ්ඩාරනායක සිරිමතා ණන්ගේ ප්‍රතිපත්ති පිළිගෙන පොදු මිනි සාගේ යුගය උදා කිරීමේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීමට එකඟ වෙලයි, අපේ ආණ්ඩුවට මේ අය ඇතුළු වුණේ. එම සහාය දීම ගැන අපි එතුමන්ලාට ස්තුතිවන්ත වෙනවා. ඒ ගැන අපි ප්‍රීති වෙනවා. නමුත් ධනේශ්වර කට්ටිය එම වැඩ පිළිවෙළට බියේ "රතු උවදුරක්" ගැන කියනවා. මේ අය කොහේවත් පන්සල් කැඩුවෙ නැහැ. කැඩුවොත් කඩන්නෙ ඔය කට්ටියයි. ඔය අයගෙන් පන්සල් බේර ගන්න ඕනැ. එයයි භයානක තත්ත්වය.

පාසැල් රජයට ගන්න අවස්ථාවේදී විරුද්ධ වුණා. ඒවා අසාර්ථක වුණා. 1962 දී ඇති වෙච්ච සිද්ධින්ට සහභාගි වුණු අය අල්ලා එක්තරා තැනකට ගෙනැවිත් අද පරීක්ෂා කර ගෙන යනවා. ඒවයෙ තීරණ ලඟදීම දේවි. අපි දන්නවා, ඒවාට සම්බන්ධ වෙච්ච විශාල පිරිසක් එළියෙ සිටි බව.

ඒවාට පත්‍ර සමාගම්වල සහායයත් ලැබුණා. පුවත් පත් කොමිෂන් සභා වාර්තාවෙ ඒ ගැන සඳහන් වෙනවා. මේ ඔක්කොම එකතු වී දැන් ගෙනියන්නෙ මෙම වැඩ පිළිවෙළයි. හාමුදුරුවරුන් ළඟට ගිහින් මේ අය කියනවා, "අනේ හාමුදුරුවනේ, පන්සල්වලට අයිති ඉඩම් ගන්න යනවා; පිං කැට ටිකත් ගන්න යනවා," යන ආකාරයට. එසේ කියා ලියුම් හදාගෙන ගිහින් අත්සන් ගන්නවා.

වත්තේගම ගරු මන්ත්‍රීතුමාගෙ (ඒ. රත්නායක මයා.) ඉස්සර පෞද්ගලික ලේකම් මේ ටිකේ නුවර පිරිවෙන්වල ඇවිදල තියෙනවා. ලියුම් අරගෙන ස්වාමීන් වහන්සේලා ලවා අත්සන් කරවා ගන්න උත්සාහ දරා තිබෙනවා. [බාධා කිරීමක්] කැමරාත් අරගෙන යනවා, මගෙ පන්සලේ හාමුදුරුවන්ගෙනුත් ලිපියක් ඉල්ලා තියෙනවා; පිංතූරයක් ගන්න ගිහින් තියෙනවා. හාමුදුරුවො කියා තියෙනවා, "අනේ අපි ඒවා දෙන්නෙ නැහැ" කියල. [බාධා කිරීමක්] මට ආරංචියි විජේතුංගද කොහේද කියල [බාධා කිරීමක්] මාත් මේවා ගැන හොයනවා. මටත් බෞද්ධ කැක්කුමක් තියෙනවා. ආගම වෙනුවෙන් ඔයගොල්ලන්ට ඉස්සෙල්ල ජීවිතය පුදන්නෙ මායි. අපේ ආගමට යම්කිසි හානියක් වෙනවා නම්, මායි ජීවිතය පුදන්නෙ. [බාධා කිරීමක්]

උඩුනුවර යූ. එන්. පී. අපේක්ෂකයා මේ ටිකේ නුවර පන්සලක් ගානෙ ගිහින් තියෙනවා. යූ.එන්.පී. එකේ බලවත් කෙනෙක් ඇවිත් කියනවා, "හාමුදුරුවො මේවාට විරුද්ධ වෙන්න; මාක්ස්වාදීන් රජයට ඇතුළු වී සිටිනවා; පන්සල්වලට අයිති වතු ගන්න යනවා; පිං කැටත් සීමා කරන්න යනවා" යනාදී පිළිවෙළට. කාල යක් තිස්සෙ මෙසේ කියල කියල වයෝ වෘද්ධ ස්වාමීන් වහන්සේලාගෙ අත්සන් ලබා ගෙන තිබෙනවා. ඒ විජේතුංග කියන නැනැත්තා පන්සල් පාලුවෙක්.

මේ විධියේ අයගෙන් තමයි ශාසනය ආරක්ෂාකර ගත යුත්තෙ. මේ විධියේ සුළු පිරිසක් ශික්ෂාකාමී මහා සංඝයා වහන් සේට අපහාස වන පිළිවෙළට ක්‍රියා කරනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[විලියම් ප්‍රනාන්දු මයා.]
ඒ නිසා මේ පත්‍රකාරයන් සහ ධනපති කොටස් කරන අපරාධයෙන් අද ලංකාවේ බුද්ධ ශාසනය බේරා ගත යුතුව තිබෙනව. මේ රතු මාක්ස්වාදීන් අපේ ආණ්ඩුවට එකතු වෙලා අපෙන් එක් එක්කෙනා ගිල ගනිවිය කිව්වත් එක් කෙනෙක්වත් ගිල ගෙන නැහැ. ඒ පැත්තෙන් නම් විරුද්ධ පාර්ශ්වයෙන් නම්—අපේ දෙන්නකුව ගිලගෙන තියෙනව. පොදි පිටින් සල්ලි දෙනව. මේ ආණ්ඩුවෙන් බුද්ධ ශාසනයට හානියක් වෙනව නම් ඉස්සෙල්ලම ජීවිතය කැප කරන්නෙ මමයි. මම ඒ ගැන ඇප වෙනව. මේ රටේ සිටින ගුණෝපේත ශික්ෂාකාමී සංඝ රත්නයට මම ආයාචනා කරනව, සම්මේලනයක් පවත්වා මේ පත්‍ර කොමිෂමේ වාර්තාව මුල සිට අග දක්වා කියවා බලා අප කරන්න යන දේ වැරදිද කියා සලකා බලන ලෙස. උන්වහන්සේලාම දුන් සාක්ෂි මේ කොමිෂන් සභා වාර්තාවේ ඇතුළත් කර තිබෙනව. ඒවා කියවා බලා තීරණයක් කරන ලෙස මම උන්වහන්සේලාගෙන් ඉල්ලා සිටිනව. මේ විස්තර සිංහල පත්‍රවල පළ වෙන්නෙ නැහැ. මේ වාර්තාවේ පුදුම විධියේ කරුණු තියෙනව. භික්ෂූන් වහන්සේලා ආරාමයට වී සිටිය යුතුය කී පත්‍රකාරයන් අද උන්වහන්සේලාගේ දෙපා මුලට ගොස් සිටීම ගැන මම පුදුම වෙනව.

පුවත්පත් කොමිසමේ අවසාන වාර්තාවේ 61 වැනි පිටුවේ අංක 106 යටතේ මෙසේ තිබෙනව :

"බෞද්ධ භික්ෂුවකගේ කටයුතු ආරාමයට සීමා විය යුතුයයිද ඔව්හු ප්‍රකාශ කරති. එහෙත් අපේ ඉතිහාසය අනුව බලන විට ජාතිය හා ආගම විපතට පත් සැම විටකම රටත්, බුද්ධ ශාසනයත් රැක ගැනීමට ඉදිරිපත් වූයේ බෞද්ධ භික්ෂුව බව ඔවුනට අමතකය. භික්ෂූන්ගේ කටයුතු ආරාමයට සීමා විණි නම් මුලදී බෞද්ධ රටවල්ව තිබූ මලයා, ජාවා, සුමාත්‍රා සහ පිලිපයින් යන රටවලට සිදු වූවාක් මෙන් මෙම දිවයිනෙහුත් බුදු සමය අත ගැවී යන්නට තිබිණි. මේ රටේ ස්වාධීනත්වය රැක ගැනීමට ආධාර වූ මහානාම, වීදාගම, බුද්ධවංස යන මේ මහ තෙරවරුන්ගේ කීර්ති නාමාවලිය සිංහල බෞද්ධයන්ගේ සිත්වල නොමැකෙන සේ සටහන්ව ඇත. පොදු කටයුතුවලට සහභාගි වන බෞද්ධ "දේශපාලන භික්ෂූන්" යයි ප්‍රවෘත්ති පත්‍රවලින් නමක් පට බැඳ තිබේ. මේ ඊනියා දේශපාලන භික්ෂූන්ගෙන් සමහරකු ජාවාරම් කාරයන් හා නරක මිනිසුන් බව ප්‍රත්‍යක්ෂ වී ඇති බව ඇත්තකි. එහෙත් පොදු යහපත සඳහා ක්‍රියා කරන බහුතර කොට්ඨාශයක් වූ මහා සංඝයා වහන්සේලා අතින් දේශයට හා ආගමට විශිෂ්ට සේවයක් සැලසී තිබේ. යුරෝපයේ හා අමෙරිකාවේ රටවල් රාශියකුත් ආගම් පදනම් කර ගත් දේශපාලන පක්ෂ ඇති බව මේ ප්‍රවෘත්ති පත්‍රවලට අමතකය."

මා මේ කොටස කියෙව්වෙ, බෞද්ධ භික්ෂූන් වහන්සේලා ආරාමයට සීමා වී සිටිය යුතුය කියා එදා මේ පත්‍ර කාරයන් කී බව පෙන්වීමටයි. එදා එහෙම කී අයයි, භික්ෂූන් වහන්සේලා පසු පසින් යමින් අද මේ විධියට කටයුතු කරන්නෙ.

දකුණු වියට්නාමයේ සිදු වූ දේ එදා ලංකාවේ පත්‍ර ඉතා සුළු කොට සැලකුව. මේවා පිළිබඳ සත්‍ය ප්‍රවෘත්ති එළිදරව් වූයේ "දවස" පත්‍රයෙන් පමණයි. මේවා පිළිබඳ ප්‍රවෘත්ති පළ වූ "ලංකාදීප" පත්‍ර ඉවත් කළ බවත්, ඇතැම් ඡායා රූප "ලංකාදීප" පත්‍රවලින් අස් කළ බවත් රහසක් නොවෙයි. එසේ කටයුතු කළ පත්‍ර අද බුඩ ශාසනය රැකගැනීමට ඉදිරි පත් වී මහා සංඝයා වහන්සේත් අවදි කරවාගෙන ඔවුන්ගේ පත්‍ර රැකගැනීමේ ව්‍යාපාරයක් ගෙන යනවා. පුවත්පත් කොමිසමේ අවසාන වාර්තාවේ 35 වන පිටුවේ මේ විදියට සඳහන් වෙනවා :

"ඉංග්‍රීසි ප්‍රවෘත්ති පත්‍ර කතෝලික ආක්‍රමණයෙන් පාලනය වන බව නොරහසකි. ටයිම්ස් පත්‍ර සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂවරුන් දෙදෙනාම උග්‍ර කතෝලිකයෝය. ඔවුන්ගේ පුවත්පත්වල කර්තෘ මණ්ඩලයේ සියලු දෙනද කතෝලිකයෝය. "ඩේලි නිව්ස්" සහ "ඔබ්සර්වර්" පත්‍රවල කර්තෘ මණ්ඩලයේ සිටින ක්‍රිස්තියානි හා කතෝලික පුද්ගලයින්ගේ සංඛ්‍යාව දනිතොත් ඔබ පුදුම වනු නොඅනුමානය.

මා කලින් කීවාක් මෙන් කතෝලික ආක්‍රමණය නිතරම බලා සිටින්නේ රටේ නොසන්සුන් භාව යක් ඇති කිරීමටයි. ප්‍රවෘත්ති පත්‍ර මාර්ගයෙන් මෙය කරනු ලබන්නේ නියම තොරතුරු කණපිට පෙරළා දක්වමින් යම් යම් ආරංචි එක්තරා විශෙෂ ආකාරයකට ඉදිරිපත් කිරීමෙනි.

මේ රටේ පටන්ගත් ජාතික වූ හා ප්‍රගතිශීලී වූ හැම ව්‍යාපාරයකටම ප්‍රවෘත්තිපත්‍රවල අනුබලය ඇතිව කතෝලික පල්ලිය විරෝධය පළ කළේ ය. නිදහස් අධ්‍යාපනයට විරුද්ධ විය. සිංහලය රාජ්‍ය භාෂාව කිරීමට විරුඩ විය. රජයේ පාඨශාලාවල බෞඩ දරුවන්ට බුඩාගම ඉගැන්වීමට විරුද්ධ විය. ජාතික ඇඳුමටත් සුරාසූදු තහනම් ව්‍යාපාරයටත් විරුඩ විය."

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තවත් හුඟක් දේ කියවන්න තිබෙනවා. නමුත් ඒවා සියල්ලම කිය වීමට මම බලාපොරොත්තු වන්නේ නැහැ. මේවා එකම ප්‍රවෘත්තිපත්‍රයකවත් පළ කළේ නැහැ. ඒ වෙනුවට මහජනයා බිය ගැන්වෙන අන්දමේ වාර්තා පමණයි, පළ කළේ. මේවා දුටු සංඝයා වහන්සේලා මහා භයානක දෙයක් වෙන්න යනවායයි බිය වීම එක් අතකින් පුදුමයක් නො වෙයි. පන්සලට ලැබෙන පත්‍රය කියෙව්වාම එවැනි හැඟීමක් ඇති වෙන්න පුළුවනි. ඒ නිසා මම ගරුතර මහා සංඝයා වහන්සේගෙන් ඉතා වුවමනාවෙන් ඉල්ල සිටිනවා, මේ පුවත් පත් කොමිසමේ වාර්තාව කියවා බැලීමෙන් පසුව තීරණයක් ගන්නය කියා. සමස්ත ලෝක බෞද්ධ ජනතාවගේ නාමයෙන්, අවුරුදු 2,500 ක් ආරක්ෂාවූ බුද්ධාගමේ නාමයෙන් මම මහා සංඝයා වහන්සේ ගෙන් ඉල්ලා සිටිනවා මේ පුවත් පත් කොමිසමේ වාර්තාව නොකියවා කිසිත් පියවරක් නොගන්නා ලෙස. කතෝලික බලවේගය සංඝයා වහන් සේලා ලවාම මේ රට විනාශ කිරීමට උත්සාහ කරන බව දැන් පැහැදිලියි. කවද හරි ඉදිරියට මහණ කරන්නේත් කතෝලික දරුවන් විය හැකියි. ඔය නිල් කමිස අන්දවා එවන්නේත් කතෝලික සින්මයි. ඔවුන් මේ අපරාධ කරන්නේ පත්‍රයේ සහයත් ලබාගෙනයි. ඒ නිසා ඔවුන් ගැන මම නැවතත් මහා සංඝයා වහන්සේගේ අවධානය යොමු කරවන්න කැමතියි.

අපට කවදාවත් පුවත්පත්වලින් නියම තැනක් ලැබුනේ නැහැ. මේ පාර්ලිමේන්තු වේ කියන දේ පවා පත්‍රවලින් වහනවා. වේදිකාවලින් කියන දේ නොපිට පෙරළා පළ කරනවා. දැන් මේ රටට සේවයක් කිරීමට සූදානම් පිරිසක් මේ ආණ්ඩුවට එකතු වීම ගැන නොයෙකුත් අභූත දේ පත්‍රයේ පළ කරනවා. එසේ කොට ගල් ගසන අතර මහජනය තුළ බොරු බියක් ඇති කරවනවා. එකම පන්සලකටවත් පූජ්‍ය ස්ථානයකටවත් හානියක් නොකළ මේ අය පිළිබඳව නොයෙකුත් බොරු ප්‍රකාශ පළ කරමින් මහජනයා බිය ගැන් වීමෙන් මේ පුවත්පත් කරන්නේ බලවත් අපරාධයක්.

මේ සභාග ආණ්ඩුවෙන් කරන්න බලා පොරොත්තු වූ දේ නොකඩවා කරගෙන යන බව මේ රාජාසන කථාවෙහි සඳහන් කර තිබෙනවා. ගිය වාරයේ අහෝසි වූ සියලු පණත් නැවත ඉදිරිපත් කරනවා ඇති. ඒ පණත්වලට අකුල් හෙළා පත්‍ර රැක ගැන්මටයි, ඇතැම් අය බලා පොරොත්තු වන්නේ.

මම මෙතෙක් වේලා කථා කළේ රාජාසන කථාව කිරීම ගැන ගරුතර අග්‍රාණ්ඩුකාර උතුමාණන්ට ස්තුති කළ යුතුය යන යෝජනාව අනුවයි. එම යෝජනාවා ඉදිරිපත් කිරීමේ අවස්ථාව මට ලබා දීම ගැන මම අපේ පක්ෂයේ සියලු දෙනාටම මගේ අවංක ස්තුතිය පිරිනමනවා. ශ්‍රෙෂ්ඨ බෞද්ධ කාන්තාවක් වන අපේ ගරු අගමැතිනිය අවශේෂ ආගම්වලට හා අවශේෂ ජාතීන්ට රැක වරණය දෙමින් බහුතර ජනතාවගේ ජාතියටත් ආගමටත් නිසි තැන ලබා දීමට කටයුතු කරමින් ජාතියේ උග්‍ර ප්‍රශ්න විසඳන විට එතුමියට අප කාගේත් සහාය ලැබිය යුතුයි. එහෙත් මෙවැනි වැදගත් දෙයක් වන විට නැගිටලා යන පිරිසක් තමයි අපේ රටේ ඉන්නෙ. මෙවැනි අයට මෙහාට එන්න පුළුවන් වන විධියට කතිරය ගහන අයයි මීට වගකියන්න ඕනෑ. අද ගිය අයගෙ නාම ලේඛනයක් අරන් රටට පෙන්වන්න ඕනෑ. ජාති භ්‍රෂ්ට යෝ, ආගම් භ්‍රෂ්ටයෝ මෙන්න මේ අයය කියා රටට පෙන්නා දෙන්න ඕනෑ. ඒකයි දැන් අපට කරන්න තියෙන්නෙ. ඒ බව මතක් කරන්න කැමතියි.

අවසාන වශයෙන්, ඉන්දු-ලංකා සාකච්ඡාව සාර්ථක ලෙස කරගෙන යෑම ගැන අපගේ අවංක ස්තුතිය අපේ ගරු අගමැතිනියටත්, ඊට සහභාගි වී සහයෝ ගය දුන් අපේ ගරු ඇමතිතුමන්ලා දෙපො ළටත්, නිලධාරි පිරිසටත් පිරිනමන්න ඕනෑ බව ප්‍රකාශ කරන්න කැමතියි. ඒ වගේම ඉන්දියාවේ ගරු අග්‍රාමාත්‍යතුමන් ටත් එතුමාගේ නිලධාරීන්ටත් අපේ කෘතඥතාව අවංකවම පිරිනමන්න ඕනෑ බව ප්‍රකාශ කරන්න කැමතියි. අපේ දෙරට ටත් දෙරටේ ජනතාවටත් සාමය හා සමාදා නය අත්පත් කර ගත හැකි වන අන්දමට ඉදිරි කාලයේදී මේ ප්‍රශ්නය හොඳාකාර නිරාකාරණය කර ගැනීමට සම්පූර්ණ ශක් තිය ලැබේවායි මා ප්‍රාර්ථනා කරනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[විලියම් සිල්වා මයා.]

මගේ කථාව අවසන් කරන්නට මත්තෙන් මා නියෝජනය කරන නුවරඑළිය ඡන්දදායක කොට්ඨාශය ගැනත් වචන කීපයක් කථා කරන්න බලාපොරොත්තු වෙනව. රාජාසන කථාවකට ස්තුති යෝජනාවක් ඉදිරිපත් කරන මෙවැනි අවස්ථාවක ඒ කාර්යය භාර ගත් මන්ත්‍රීවරයාට ලැබෙන විශෙෂ වරප්‍රසාදයක් නම් තමන් නියෝජනය කරන කොට්ඨාශය සම්බන්ධයෙන් කරුණු සඳහන් කර අඩු පාඩුකම් පෙන්වා දීමට ලැබෙන අවසරයයි. මා එයින් ප්‍රයෝජන ගන්න බලාපොරොත්තු වෙනව. ඒ වරය මට ලැබීම ගැන මා සන්තෝෂ වෙනව.

නුවරඑළියේ කඳපොළ මාතෘ නිවාසයක් ඇති කිරීම සම්බන්ධයෙන් කාලයක් තිස්සේ අප අතර බලාපොරොත්තුවක් තිබුණා. තවම ඒ බලාපොරොත්තුව මුදුන් පත් වුණේ නැහැ. මාතෘ නිවාසයක් සඳහා ස්ථානයකුත් අරගත්තා, හිටපු ඇමතිතුමා එක් උත්සවයකදී මේ ගැන පොරොන්දුවකුත් දුන්නා. ඒ වුණාට මාතෘ නිවාසය ලැබුණේ නැහැ. කරුණා කර ඉක්මණින් අපට එය ලබා දෙතොත් හොඳයි. මේ වර්ෂය ඇතුළත ඒ කටයුත්ත අවසන් කර දෙන්නැයි ගරු ඇමතිතුමාගෙන් මා ඉතා ආදරයෙන් ඉල්ලා සිටිනවා.

මගේ ඡන්දදායක කොට්ඨාශයට ජල යෝජනා ක්‍රම කීපයකුත් තිබෙනව. ඒ ගැනත් සඳහන් කරන්න ඕනෑ. බ්ලැක්පූල් ජල යෝජනා ක්‍රමය සාර්ථක කර ගැනීමේ බලාපොරොත්තුවක් අප තුළ තිබෙනව. නානුඔය, තලවකැලේ සහ නුවරඑළිය යන නගරවලට ජලය සැපයීම සඳහා ජල යෝජනා ක්‍රම තිබෙනවා. ඒවා ඉක්මන් කර ක්‍රියාත්මක කරන ලෙස ඉල්ලා සිටිනවා. තලවකැලේ, නානුඔය, බ්ලැක්පූල් යන ජල යෝජනා ක්‍රමත් හැකි තාක් ඉක්මනින් සාර්ථක කර දෙන ලෙස ඉල්ලා සිටිනවා. නුවරඑළිය නගර සභාවේ ජල යෝජනා ක්‍රමයත් ක්‍රියාත්මක කිරීම ඉක්මන් කරන ලෙස ඉල්ලා සිටිනවා.

කිරි පිටි කර්මාන්ත ශාලාවත් හැකි තාක් ඉක්මනින් ආරම්භ කරන ලෙස ගරු ආහාර ඇමතිතුමාගෙන් මා ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. දැනටමත් කිරි නිෂ්පාදනය ශීඝ්‍ර ලෙස වැඩි වේගය එනවා. නුවරඑළිය ආසනයට අයිති ප්‍රදේශයෙන් කිරි පයින්ට් 20,000 ක් පමණ කොළඹ නගරයට ගලා එනවා. ඒ තරම් දුරට දැන් කිරි සම්පාදනය සාර්ථක වී තිබෙන නිසා ඒ ගැන සලකා බැලීමට දැන් කාලය ඇවිත් තිබෙනවා. දැන් ඉතින් කිරි පිටි කර්මාන්ත ශාලාවක් ආරම්භ කරන්න පුළුවනි.

කඩදාසි කර්මාන්තය සඳහාත් උනන්දුවක් දැක්වීමට දැන් කාලය ඇවිත් තිබෙනවා. පත්තර මුද්‍රණය කිරීම සඳහා පාවිච්චියට ගන්න කඩදාසි සෑදීම සඳහා කර්මාන්ත ශාලාවක් ආරම්භ කරන්න ඕනෑ. ඒ සඳහා අවශ්‍ය අමු ද්‍රව්‍යත් තිබෙන නිසා එහි වැඩ ආරම්භ කරන්න දැන් සුදුසු කාලයයි.

නුවරඑළිය දිස්ත්‍රික්කය තුළ තිබෙන ඛනිජ සම්පත් ගැන මා මීට පෙරත් මේ ගරු සභාවේදී වරින්වර සඳහන් කර තිබෙනවා. ඒ ගැනත් පරීක්ෂා කර බලා ඒවායින් නියම ප්‍රයෝජන ගැනීමට වැඩ පිළිවෙලක් සකස් කරන ලෙස ඉල්ලා සිටිනවා. මේ රටේ ඛනිජ ද්‍රව්‍ය රාශියක් තිබෙනවා. නුවරඑළිය ඒ අතින් ඉතා හොඳ ප්‍රදේශයක් නිසා ඒ ගැන පරීක්ෂා කර බලා ඒ අනුව සුදුසු කර්මාන්ත ආරම්භ කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

ගුවන් තොටුපොළක් ගැන මීට පෙර කී කරුණු කෙරෙහි නැවතත් මා මතක් කරන්න කැමතියි. ගුවන් තොටු පොළක් පැවති ස්ථානයක් හැටියට නුවරඑළිය ලෝකයේ බොහෝ කාලයක ඉඳල ප්‍රසිද්ධියක් උසුලනව. එහෙත් වර්තමාන කාලයේ නුවරඑළියට ගුවන් තොටුපොළක් නැති වීම ගැන කනගාටු වෙන්න ඕනෑ. ඈත අතීතයේ රාවණ යුගයේදී දඬු මොනර යන්ත්‍රවලිනුත් ගමන් කරල තියෙනව. ඒ හා සම්බන්ධ ස්ථානයක් තමයි නුවරඑළිය. එවැනි නගරයක් වන නුවරඑළියට තව දුරටත් ගුවන් තොටු පොළක් නොදීම කනගාටුදායකයි. ඒ ගැන සලකා බලා ක්‍රියාකරන මෙන් ඉල්ලනවා.

ආහාර ද්‍රව්‍ය ගබඩා කර තැබීම සඳහා ගබඩාවක් නුවරඑළියේ ඇති කරනු ඇතැයි අපි බලාපොරොත්තු වෙනව. ආහාර කටයුතු භාර ගරු ඇමතිතුමාගේ සැලකිල්ල ඒ කාරණය කෙරෙහි යොමු කරවන්න කැමතියි. වටිනා ආහාර ගබඩාවක් ඒ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ස්තුති යෝජනාව පිළිබඳ විවාදය

ප්‍රදේශයට ලබා දෙන ලෙස ඉල්ලනවා. ගමනාගමන කටයුතු අවහිර වන අවස්ථාවල් සමහර විට ඇති වෙනවා. මෙය මහා කඳු වැටි සහිත ප්‍රදේශයක් නිසා බිම් ගෙවල් අස්සෙනුයි ගමන් කරන්නෙ. කඳු ආදිය කඩා වැටීම නිසා අපේ පළාත්වල මහා පාරවල් බොහෝවිට අවහිර වෙනව. එවැනි අවස්ථාවලදී අපේ දිස්ත්‍රික්කයට ආහාර ලබා ගැනීම අපහසුයි. එම නිසා ඒ ප්‍රදේශයේ ආහාර ගබඩාවක් පිහිටුවන ලෙස ඉල්ලමින්, අද දින මේ අවස්ථාව ලබා දීම ගැන හා මගේ කථාවට සවන් දීම ගැන ඔබ සැමට ස්තුති කරමින්, අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේට ස්තුති කිරීමේ යෝජනාව මා මෙම සභාව ඉදිරියේ තැබුවේ ප්‍රීතියෙන් බව මතක් කරමින්, මගේ කථාව නවත්වනව.

අ. භා. 3.26

**ස්ටැන්ලි තිලකරත්න මයා.** (කෝට්ටේ)
*(திரு. ஸ்டான்லி திலக்கரத்ன—கோட்டே)*
(Stanley Tillekeratne—Kotte)

ගරු කථානායකතුමනි, සිරිමා බණ්ඩාරනායක රජයේ හයවැනි රාජසන කථාව පිළිබඳව අප ලක්සුරුතුමාට ස්තුති කිරීම සඳහා ගරු නුවරඑළියේ මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කළ යෝජනාව මේ සභාග රජයේ මන්ත්‍රීවරයෙකු වශයෙනුත්, කෝට්ටේ මන්ත්‍රීවරයා වශයෙනුත්, මා ඉතා සාදරයෙන් සහ සන්තෝෂයෙන් ස්ථිර කරන බව මතක් කරනව.

ගරු කථානායකතුමනි, මා පෙනී සිටින්නේ ඓතිහාසික ඡන්ද කොට්ඨාශයක් වෙනුවෙනුයි. කෝට්ටේ ශ්‍රී ජයවර්ධන පුරය ලංකා ඉතිහාසයේ ඉතා වැදගත් ස්ථානයක් දරණ නගරයක්. දැනට ශත වර්ෂ ගණනාවකට ප්‍රථමයෙන් තමයි, කෝට්ටේ නගරය ගැන තොටගමුවේ ශ්‍රී රාහුල හිමියෝ සැළලිහිණි සංදේශයේ මෙසේ සඳහන් කළේ. "එම්බල, සැළලිහිණිය, තොප පලයව්, කෝට්ටේ ශ්‍රී ජයවර්ධන පුරයට." එය කොයි ආකාර පුරයක්දැයි උන්වහන්සේ මෙසේ කවියෙන් සඳහන් කළා:

"පෝසත් දන ඇති තුණුරුවන බැති පෙමා
මුළු වද්දන සුරපුර පිරි සිරින් හැමා
ජයවද්දන කෙරුමෙන් සුසැදි තම නමා
ජයවර්ධන පුරවර දනු මිතුරු තුමා

ජය පිට ජය අත්පත් කර ගනිමින්, ලන්දේසි, ඕලන්දක්කාර, බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදී බල බිඳිමින්, සිංහල ඉතිහාසය අනර්ඝ කළ, සිංහල, බෞද්ධ නාමය ආරක්ෂා කළ, ඡන්ද කොට්ඨාශයක් නියෝජනය කරන්ට ලැබීම ගන පමණක් නොව සිරිමා බණ්ඩාරනායක සභාග රජයෙන් මේ ඉදිරිපත් කර තිබෙන ලක්සුරුට ස්තුති කිරීමේ යෝජනාව ස්ථිර කරන්ට ඉඩ ප්‍රස්තාවක් ලැබීම ගැනත් මා සන්තෝෂ වෙනව.

කථානායකතුමනි, 1956 අවුරුද්දේ මේ රටේ ප්‍රතිගාමී බලවේග සියල්ලක්ම බිඳ දමා මේ රටේ පොදු ජනයාගේ යුගයක් උදා කළ දිවංගත අගමැතිතුමා ප්‍රකාශ කළ වචන ස්වල්පයක් මේ අවස්ථාවේදී මෙනෙහි කළ යුතුව තිබෙනව. එනම්, "ගඟක් ඉදිරියට ගලනවා මිස ආපසු ගලන්නේ නැත" කියන එතුමාගේ ප්‍රකාශය ඉතා වැදගත්. 1956 දී ඉදිරියට ගලන්ට පටන් ගත් මේ රටේ සමාජවාදී ගංගාව නොයෙක් බාධකයන් මධ්‍යයේ ගලා ගොස්—අගමැතිතුමාගේ ඒ ඛේදජනක මරණයෙන් මොහොතකට තාවකාලිකව නතර වුණත්—1960 ජූලි මාසයේ සිරිමා බණ්ඩාරනායක අගමැතිනියගේ වීරෝදාර නායකත්වය යටතේ නැවතත් ගලන්ට පටන්ගෙන පසුගිය ජූනි 11 වැනිදා සභාග රජයකට පරිවර්තනය වෙමින් සමාජවාදය ස්ථාවර කරන්ට යන අවසථාවක තමයි, මේ හයවෙනි රාජාසන කථාව මේ සභාව ඉදිරියේ තබා තිබෙන්නෙ.

කථානායකතුමනි, අපි ජීවත් වෙන්නෙ පරිවර්තන යුගයකයි. පරිවර්තනය බොහොම ඉක්මනින් සිදුවෙන යුගයකයි. 1960 පටන් මේ රට බොහොම ඉක්මනට ගමන් කර තිබෙනව. 1956 දී දිවංගත අගමැති බණ්ඩාරනායක මැතිතුමා මේ රටේ සඟ, වෙද, ගුරු, ගොවි, කම්කරු කියන පංච මහා බලවේගයට නායකත්වය දෙමින් ඔහුට එරෙහිව ඉදිරිපත් වූ ප්‍රතිගාමී බලවේගයන්ට මුහුණ පාමින් ඒ ප්‍රතිගාමී බලවේගයන් සැහෙන ප්‍රමාණයට මෙල්ල කරමින්, නොයෙකුත් ප්‍රගතිශීලි කාර්යභාරයන් රාශියක් ඉටු කළ බව ඉතා ආඩම්බරයෙන් කියන්ට පුළුවන්. අපට ලැබී තිබුණු වහල් නිදහස එතුමා පරිපූර්ණ නිදහසකට පරිවර්තනය කළා. මේ රටේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ස්ටැන්ලි තිලකරත්න මයා.]

ගුවන් තොටුපොළවල් හා නාවික කඳවුරු බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන්ට භාර දී අප ලබා ගත් වහල් නිදහස පරිපූර්ණ කිරීමට එවැනි ගිවිසුම් බොහෝදුරට අවලංගු කර දැමුවා. එයින් අපේ රටේ ස්වාධීනත්වය ආරක්ෂා කරන්ට පුළුවන් වුණා. ඒ විතරක් නොවෙයි, මේ රටේ බස් ව්‍යාපාර මහජන සතු කරමින්, වරායවල් මහජනසතු කරමින් මුළු මහත් ප්‍රගතිශීලී ව්‍යාපාරයට ධෛර්‍ය දෙමින් එතුමා ගිය ගමන මොහොතකට අඩපණ වන්ටත් හේතු ඇති වුණා. දිවංගත බණ්ඩාරනායක අගමැතිතුමාගේ මරණයෙන් පසු සමහර අය විශ්වාස කළා, මේ රටේ නායකත්වයක් දීමට සුදුසු පුද්ගලයෙක් නැති වේවි කියා.

පෙරේදා හැන්දෑවේ බ්‍රිතාන්‍යයේ පළ වූ පත්තරයක නොක්ස් කියන [illegible]වරයෙකු විසින් ලියූ ලිපියක් කියවා බැලූ විට නොක්ස්ගේ අදහස් රාශියක් මට පෙනී ගියා. නොක්ස් කියනවා: මෙවැනි සවාමි පුරුෂයෙක් නැති ස්ත්‍රියක් ලොකු අනුකම්පාවක් ඇතිව මහජනයාගේ සහයෝගයෙන් අගමැතිනිය වුණාය කියා. නමුත් අද මේ අගමැතිනිය එදා වගේ නොවෙයි. She has turned out to be a tough political customer. බොහොම එඩිතරව තමාට විරුද්ධව එන බලවේගයන් හා පොර බදන්නට ශක්තියක් ඇති, එඩිතරව, ඍජුව මේ රට ඉදිරියට ගෙන යන්නට ශක්තියක් ඇති නායිකාවක් වශයෙන් අද මේ රට ඉදිරියේ පෙනී සිටිනවාය කියා අපේ විරුද්ධකාරයෝ පවා පිළිගන්නා අවස්ථාවක තමයි, මේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේත් ලංකා සමසමාජ පක්ෂයේත් සහභාගී රජයේ 6 වැනි සැසිවාරයට ඉතා ආඩම්බරයෙන් පා තබන්නේ.

අද උදේ අප සැසි වාරය පටන් ගත්තේ මේ රටට, මේ ජාතියට, බෞද්ධාගමට, මේ රටේ ජනතාවට ආදී සියළු දෙනාටමත් ඉතා වැදගත් අවස්ථාවක් සලසා දෙමිනුයි. ඇත්ත වශයෙන්ම කථානායකතුමනි, මේ රාජාසන කථාව අපට කොටස් තුනකට බෙදන්න පුළුවන්. රාජාසන කථාව කොටස් තුනකට බෙදන විට, බහුතර ජනතාවගේ ආගම වූ බෞද්ධාගමට මේ රටේ හිමි තත්ත්වය සලසා දීමට කට යුතු කරන බව මේ රාජාසන කථාවේ සඳහන් කර තිබෙනවා පමණක් නොවෙයි, වත්මන් රජයෙන් ගනු ලැබූ පියවරවලට අමතරව බෞද්ධාගමට යෝග්‍ය මෙම තත්ත්වය සහතික වශයෙන් ලබා දෙන ව්‍යවස්ථාවන් ඔබ හමුවේ තැබීමට මාගේ ආණ්ඩුව අදහස් කරයි කියා අද ලකිසුරු තුමාගේ ප්‍රකාශනයෙන් ඉදිරිපත් කළා.

දෙවැනි කාරණාව මෙයයි: ඉන්දියානුවන්ගෙන් පැවත එන්නන් සම්බන්ධ ප්‍රශ්නය පිළිබඳවත් ලංකාවත් ඉන්දියාවත් අතර ඇති සම්බන්ධකම මොහොතකටවත් දුර්වල නොකොට, ලාංකික ජනතාවට හිතවත් ආකාරයට ඉන්දීය ප්‍රශ්නය විසඳීම ගැන දෙවැනි ප්‍රකාශය කර තිබෙනව.

තුන් වැනි එක බොහොම වැදගත්. "එම අදහස් පෙරදැරි කොට—" ඒ කියන්නෙ මොන අදහස්ද? 1956 දිවංගත එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක අගමැතිතුමා ගත් පියවරවල්, එමෙන්ම සිරිමාවෝ බණ්ඩාරනායක රජය 1960 ජූලි මාසයේ ගත් පියවරවල්, එමෙන්ම, සහාග රජය ජූනි මාසයේ 11 වැනිදා ගත් පියවරවල් තව ඉදිරියටත් පෙරදැරි කොට ගෙන යෑම සඳහා අහෝසි වූ ව්‍යවස්ථා කෙටුම්පත් සහ අවශ්‍ය අනිකුත් ප්‍රගතිශීලී වැඩ සටහන් ඔබ හමුවේ තබනව ඇති.

ගරු කථානායකතුමනි, රහසක් නොවෙයි, මේ සැසි වාරයේදි අප ඉදිරියට තවත් වැදගත් පනත් දෙකක් එන බව අප දන්නව. ඒ පනත් දෙක තමයි, පත්තර පිළිබඳ පනත් දෙක. ඒ පනත් දෙකෙන් එක පනතක් පත්තර පිළිබඳ කවුන්සලයකුත් විනිශ්චය මණ්ඩලයකුත් ඇති කිරීමේ පනතක්. අනික් පනත තමයි, පත්තර සංයුක්ත මණ්ඩලයක් ඇති කරමින් ජනසම්මත පත්තර ව්‍යාපාරයක් රජයෙන් ගෙනයෑමත්, ඒකාධිකාරී ලේක් හවුස් බලය බිඳ දමමින් රටේ ජනසම්මත වාදී සමාජවාදී ගමනත් ආරක්ෂා කර ගන්නා අදහසින් ඉදිරිපත් කරන්නාවූ දෙවැනි පනත. සමහරවිට මේ පනත් දෙක එක විට උඩ තට්ටුවෙත් පහළ තට්ටුවෙත් ඉදිරිපත් වී එතනින් හා මෙතනින් දෙකටම සම්මතය අරගෙන, ලකිසුරුතුමාට ඉදිරිපත් කර මේ රටේ නීති ව්‍යවස්ථාවට, නීති මාලාවට අඩංගු කරන එක සපිරයි කියා මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අද උදේ බෞද්ධ ශාසනය ගැනත්, බෞද්ධ ජනතාව ගැනත්, ලාංකික ජනතාව ගැනත් කථා කරන විට විරුද්ධ පාර්ශ්වයේ නායකවරුන්—අපේ විරුද්ධ පාර්ශ්වයේ ප්‍රධාන නායක දැදිගම මන්ත්‍රීතුමාත්, ජාතික විමුක්ති පෙරමුණේ නායක කේ. එම්. පී. රාජරත්න මහතා සහ එම මැතිණියත් (දෙවැනි එකත් අමතක කරන්න බැහැ) එමෙන්ම අවිස්සාවේල්ලෙ ගරු මන්ත්‍රීතුමත්, ටිකක් මුරණ්ඩු වුණත් සමහර විට කීකරු කරන්නට පුළුවන් කොට්ටාවේ ගරු මන්ත්‍රීතුමත් ඇතුළු මේ කොටස්—ෆේඩරල්වාදීන් සමග එකතු වී සභා ගර්භයෙන් පිට වුණා. මේ කොටස් ෆේඩරල් වාදීන් සමග එකතු වී සභා ගර්භයෙන් පිට වී ගියත්—ගාල්ලේ ගරු මන්ත්‍රීතුමා (ආචාර්ය ඩබ්ලිව්. දහනායක) සැමදම පරක්කුයි බස් එක වැරදිල—මේ කොටස් පිට වී ගියත් දඹදෙණියේ ගරු මන්ත්‍රීතුමා, ගෝඨාභය සේනානායක මන්ත්‍රීතුමා, අප සමග සිටීම ගැන මා ස්තුතිවන්ත වෙනව. ඒ මහත්මයාගේ දුන් ඉතිරි වී තිබෙන්නෙ බස්තම පමණයි; කමක් නැහැ. [බාධා කිරීමක්]—ටිකක් බලාගෙන තමයි වැඩ කරන්න ඕනැ. ඒ නිසා තමයි එයා ගැන වැඩි වර්ණනාවක් ඉදිරිපත් කරන්නට මා අදහස් කරන්නෙ නැත්තෙ.

කෙසේ හෝ වේවා, මේ රජය ඉදිරියටම ගමන් කර තිබෙනවා. මේ ප්‍රශ්නය ගැන විරුද්ධ පාර්ශ්වයේ කණ්ඩායම් මහජනයා ඉදිරියට ගොස් කොයි ආකාරයට කියාවිද කියා මා දන්නෙ නැහැ. නමුත් දැනටම සංඛ්‍යා ලේඛන අතර ලොකු මතභේදයක් තිබෙනව. 9,25,000ක ඉන්දියානු ජනගහනයක් ලංකාවේ සිටින බව ආණ්ඩුවේ සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් නිකුත් කළ වාර්තාවක තිබෙනව. නමුත් ගම්පොල රැස්වීමකදී සංඛ්‍යා ලේඛන පරස්පර විරෝධතාවක් ඇති වී තිබෙනව. වැලිමඩ ගරු මන්ත්‍රීතුමා (කේ. එම්. පී. රාජරත්න මයා.) 11,00,000ක් සිටිනවාය කියා ප්‍රකාශයක් කර තිබෙනව. අවිස්සාවේල්ලේ ගරු මන්ත්‍රීතුමා (ඩී. පී. ආර්. ගුණවර්ධන මයා.) 16,00,000ක් සිටිනවාය කියා ප්‍රකාශයක් කර තිබෙනව. මේවා සම්බන්ධයෙන් මා මේ අවස්ථාවේදී විස්තර සහිතව කථා කරන්නට අදහස් නොකරන්නේ වී නමුත් එක් විශේෂ කාරණයක් ගැන මතක් කළ යුතුව තිබෙනව.

මේ රට ක්‍රමානුකූලව ඉදිරියට ගමන් කළ නමුත්, 1960 මාර්තු වන විට ප්‍රගතිශීලී බලවේග ඉතාමත් නරක අන්දමට බෙදී සිටි බව අප දන්නව. මා මේ පාඩම් කියන්නෙ සමහර උදවියගෙ ඇස් ඇරේවිය යන බලාපොරොත්තුවෙන්. 1960 මාර්තු මාසයේදී ශ්‍රී ලංකා නිදහස් පක්ෂය වෙනමත්, ලංකා සමසමාජ පක්ෂය වෙනමත්, කොමියුනිස්ට් පක්ෂය වෙනමත්, අවිස්සාවේල්ලේ ගරු මන්ත්‍රීතුමාගේ නායකත්වයෙන් යුත් මහජන එක්සත් පෙරමුණ වෙනමත් ඡන්ද සටනකට ගියා, ප්‍රගතිශීලී ඡන්දය බෙදා ගන්න. ඒ අවස්ථාවේදී, අපේ බෙදීම් මැදින්, අපේ අසමගිය මැදින්, ප්‍රගතිශීලී ඡන්ද බෙදුණු නිසා, තමන්ට නැවත වරක් බලයට පත් වීමට පුළුවන් වේවිය කියා එක්සත් ජාතික පක්ෂය කල්පනා කළා. නමුත් ආසන කීයද දිනා ගත්තෙ? ඒ මක්නිසාද? 1956 ජයග්‍රහණයෙන් ක්‍රමානුකූලව විමුක්තිය කරා ගමන් කරන ජනතාවත්, වැඩ කරන ජනතාවත්, මේ රටේ ගුරු වෙද පරම්පරාවත්, නියම බෞද්ධ ප්‍රතිපත්තීන් ආරක්ෂා කරන මහා සංඝයා වහන්සේලාත් 1956ට ප්‍රථමයෙන් තිබුණු තත්ත්වය නැවතත් ඇති කරන්නට සූදානම් නොවූ නිසයි. ඒ නිසයි 1960 දීම නැවතත් එක්සත් ජාතික පක්ෂය පරාජය කරන්නට පුළුවන් වුණේ. ඇත්ත වශයෙන්ම 1960 දී පැවති තත්ත්වය නැවත වරක් උදවන්නට ඉඩ තිබෙනව.

1960 මාර්තු මාසයේ එවකට පැවති එක්සත් ජාතික පක්ෂය ඉදිරිපත් කළ රාජාසන කථාවට සංශෝධනයක් ඉදිරිපත් වූ අවස්ථාවේදී තමයි අවිස්සාවේල්ලේ ගරු මන්ත්‍රීතුමාගේ දේශපාලන ඉලක්කය සම්පූර්ණයෙන්ම වැරදුනේ. සිරිමාවෝ බණ්ඩාරනායක රජය සමග තිබෙන කේන්තියක් පිරිමසා ගැනීම සඳහාත්, ප්‍රගතිය කරා ගමන් කිරීම වැළැක්වීම සඳහාත් ඔහු විසින් මධ්‍යස්ථව සිටීමට ඒ අවස්ථාවේදී ගත් තීරණය නිසා ඔහුගේ කණ්ඩායම සම්පූර්ණයෙන්ම නැතිවුණා පමණක් නොව, ඔවුන්ගේ ආසන සංඛ්‍යාවත් තුනකට බැස්සා. එපමණකුත් නොවෙයි, අන්තිමට ජූලි මාසයේ මැතිවරණයෙනුත් පක්ෂය අන්ත පරාජයකට පත් වූයේ නැත කියා එතුමාට කියන්නට බැහැ. ඒ මක්නිසාද? මේ රටේ මහජනතාව ප්‍රගතිය යන වචනයෙහි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ස්ටැන්ලි තිලකරත්න මයා.]

අර්ථය දූනගෙන අවසානයි. එමනිසා ඒ අවස්ථාවේදී අවිස්සාවේල්ලේ ගරු මන්ත්‍රීතුමා ජාතක ආණ්ඩුවක්ය කියා යම් සටන් පාඨයක් ඉදිරිපත් කළා නම්, ඒ ජාතික ආණ්ඩුවේ පළමුවැනි විළිරුදුව 11 වැනිදා නගර ශාලා භූමියේදී අප දුටු බව මේ අවස්ථාවේදී මා කනගාටුවෙන් ප්‍රකාශ කරන්නට ඕනෑ. මෙදා මල්ලිත් ගියා. වෙනද හැමදාම අය්ය කියන්නෙ මේ මොඩ මල්ලිගෙ මෝඩ වැඩ කියලයි. එදා 11 වැනිදා, ඒ වේදිකාවේ ජයග්‍රාහක ලීලාවෙන්, ආඩම්බරයෙන්, කථා කරන්නට යම්කිසි පුද්ගලයකුට ශක්තියක් තිබුණා නම් ඒ පුද්ගලයා මේ එක්සත් ජාතික පක්ෂයේ නායක, දැදිගම ගරු මන්ත්‍රී ඩඩ්ලි සේනානායක මහත්මයාය කියා මා මේ අවස්ථාවේදී කියන්නට සතුටුයි.

අවිස්සාවේල්ලේ ගරු මන්ත්‍රීතුමත් දූන් ඒ වැඩවලට සම්බන්ධ වෙලා. එපමණක් නොව, කවදාවත් කට වසන්න බැරි වැලිමඩ ගරු මන්ත්‍රීතුමාගේත් කට වසන්නට එක්සත් ජාතික පක්ෂයට පුළුවන් වුණා. වැලිමඩ ගරු මන්ත්‍රීතුමාගේ කට බැඳ මහ පාර දිගේ ගෙන ගියා. හැබැයි, එතුමාගේ මැතිණියගේ නම් කට වහන්න පුළුවන් වී නැහැ. එතුමිය එදා පෙරහැරේ හිටියේ නැහැ. කොට්ටාවේ ගරු මන්ත්‍රීතුමාත් එක්සත් ජාතික පක්ෂයේ වේදිකාව වෙත ගෙන ගොස් එහි රැස්ව සිටි ජනතාවට එතුමා ලවා කථාවක් කරවන්නට සැලැස්සුවා. මේ රැස්වීමෙන් ප්‍රකාශ වුණේ අවිස්සාවේල්ලේ ගරු මන්ත්‍රීතුමාගේ හෝ වැලිමඩ ගරු මන්ත්‍රීතුමාගේ හෝ බලවේගය නොව එක්සත් ජාතික පක්ෂයේ බලවේගයයි. එදා ඒ රැස්වීමේ සිටි සේනාවෙන් සියයට 99ක්ම බලාපොරොත්තු වන්නට ඇත්තේ එක්සත් ජාතික පක්ෂයේ නායක ඩඩ්ලි සේනානායක මහතා නැවත වරක් මේ රටේ අගමැති පදවියට පත් කර ගැනීමයි. අවිස්සාවේල්ලේ ගරු මන්ත්‍රීතුමාත්, වැලිමඩ ගරු මන්ත්‍රීතුමාත් තමන්ගේ වාසිය සඳහා යොදවාගෙන ප්‍රගතිශීලි ව්‍යාපාරය බිඳ හෙලා නැවත වතාවක් එක්සත් ජාතික පක්ෂයට බලය ලබාගැනීම සඳහා එම පක්ෂයේ නියම නිර්මාණ ශිල්පියා වූ දකුණු කොළඹ පළමුවැනි ගරු මන්ත්‍රීතුමා අදහස් කළ කරුණුයි, එදා 11 වැනිදා කොළඹ නගර සභා භූමියේ තිබුණු වේදිකාවෙන් පෙනී ගියේ. යකඩෙන් සහ ලෙයින් එක්සත් ජාතික පක්ෂය ගොඩ නඟන්නට දකුණු කොළඹ පළමුවැනි ගරු මන්ත්‍රීතුමාගේ ක්‍රියා මාර්ගය ඒ වේදිකාවෙන් පෙනී ගියා.

ගරු කථානායකතුමනි, 1946 දී මා පාඨශාලා ශිෂ්‍යයකු වශයෙන් සිටියදී මට අවිස්සාවේල්ලේ ගරු මන්ත්‍රීතුමා ආශ්‍රය කරන්නට අවස්ථාව ලැබුණා. එතුමා විසින් එක්සත් ජාතික පක්ෂයටත්, අධිරාජ්‍යවාදීන්ටත් විරුද්ධව ගෙන ගිය සටන ගැන ශිෂ්‍යයකුව සිටියදී දැනගත් මා එතුමා සමග ආශ්‍රය කළා. නමුත් එදා එතුමා සමඟ සිටි ජනතාව අද එතුමා සමග නැති බව පැහැදිලිව පෙනී යනවා. මොලේ අතින් පමණක් නොව, ශරීරය අතින්ද යෝධයකු වූ රෙජී පෙරේරා මහත්මයා අද එතුමා අතහැර ගොස් සිටිනවා. ඒ වගේම ප්‍රින්ස් ගුණසේකර මහත්මයාත්, විලියම් ද සිල්වා මහත්මයාත්, තෙන්නකෝන් මහත්මයාත් දැන් මහජන එක්සත් පෙරමුණෙන් අස් වී සිටිනවා. ඒ වගේ කොටස් ආණ්ඩුව පැත්තට සහයෝගය දෙන්නට එන විට අපේ පැත්තෙනුත් මොල්ලි ගොඩක් ඒ පැත්තට යන එක පුදුමයක් නොවෙයි.

ගරු කථානායකතුමනි, පැහැදිලි ලෙස දූන් ලංකාව දේශපාලන වශයෙන් දෙකට බෙදී යන බව පෙනෙන්නට තිබෙනවා. මේ විධියේ අවස්ථාවක මේ විධියේ රාජාසන කථාවක් ගැන මේ විධියට මා කථා කරන්නේ අවිස්සාවේල්ලේ ගරු මන්ත්‍රීතුමාටත්, වැලිමඩ ගරු මන්ත්‍රීතුමාටත් විරුද්ධව යම් යම් කරුණු ප්‍රකාශ කිරීමේ බලාපොරොත්තුවෙන් නොවෙයි. නමුත් දූන් මේ ගරු මන්ත්‍රීන් දෙපල එක්සත් ජාතික පක්ෂයේ ආයුධ බවට පත් වී තිබෙන බව පෙනී යන කාරණයක්. අනාගතයක් නැති එක්සත් ජාතික පක්ෂය පිදුරු ගහක දෙකක එල්ලී පණ බේරා ගන්නට හදනවා. මේ අවස්ථාවේදී අවිස්සාවේල්ලේ ගරු මන්ත්‍රීතුමාටත්, වැලිමඩ ගරු මන්ත්‍රීතුමාටත් එක කාරණයක් මතක් කර දෙන්නට කැමතියි. ඉතිහාසය ලියන කාලයක ඒ ගරු මන්ත්‍රීවරුන් විසින් මේ රටට කරන ලද සේවය ගැන ලියා අවසාන වනවාත් සමගම ඒ ගරු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මන්ත්‍රීවරුන් මේ රටේ ප්‍රගතිශීලී ව්‍යාපාරයට හතුරු වුණායයි සඳහන් කරන්නට ඉඩ නොතබන්නට ඒ ගරු මන්ත්‍රීවරුන් මතක තබා ගන්නවා නම් හොඳයි.

එදා 1960 වර්ෂයේදී මේ රටේ උද්ගත වී තිබුණු තත්ත්වය අවබෝධ කර ගත් ගරු සිරිමාවෝ බණ්ඩාරනායක අගමැතිනිය ජූලි මාසයේ පැවැත්වුණු මහා මැතිවරණය සඳහා ලංකා සමසමාජ පක්ෂය සමගත්, කොමියුනිස්ට් පක්‍ෂය සමගත් තරඟ වැළැක්වීමේ ගිවිසුමක් ඇතිව මැතිවරණ සටන ගෙන ගියා. මහජනයා ඉදිරිපිටට ආවා. 1960 ජූලි මැතිවරණයේදී ප්‍රගතිශීලීන්ගේ වාසියට රෝදය කැරකුණා. ඒ මැතිවරණයේදී අපට විරුද්ධව සිටි බලවේග පසුගිය 11 වැනිදා නගර සභා භූමියේ වේදිකාවේදීත් පැහැදිලිව පෙනී ගියා. එම බලවේග මිස වෙන දෙයක් ඇත්තෙ නැහැ. නමුත් 1960 ජූලි මාසෙ, අවිස්සාවේල්ලෙ ගරු මන්ත්‍රීතුමාගෙ (ඩී. පී. ආර්. ගුණවර්ධන මයා.) අඥානකම නිසාත්, වැලිමඩ ගරු මන්ත්‍රීතුමාගෙ (කේ. එම්. පී. රාජරත්න මයා.) අනිකුත් වැරදි නිසාත්—[බාධා කිරීමක්]—දැන් ඒ අය දේශපාලන භූමියෙන් බොහෝ දුරට ඈත් වෙලා. අන්තිමට හිටපු මල්ලිත් පැනල ගියා. දැන් මල්ලී වාමාංශික එක්සත් පෙරමුණේ එකම සාමාජිකයා සහ එකම නායකයා වශයෙන් කටයුතු කරනව. මා කනගාටු වෙනව, අද මගේ කොට්ටාවෙ මිත්‍රයා මා ළඟ නැති එක ගැන. මෙපමණ කලක් කොට්ටාව සහ කෝට්ටේ දේශ සීමා ඉතා මිත්‍ර දේශ සීමා වශයෙනුයි, නිශ්ශබ්ද දේශ සීමා වශයෙනුයි තිබුණේ. අද හැන්දෑවෙ මට ඒ මන්ත්‍රීතුමා මතක් කළා, තමා යුද්ධ ප්‍රකාශ කරන්න සූදානම්ව සිටිනවාය කියා, මගේ කොට්ඨාශයට විරුද්ධව. මගේ කොට්ඨාශයට හෝ වේවා, මට යාබද කැස්බෑව කොට්ඨාශයට හෝ වේවා, දෙහිවල-ගල්කිස්ස කොට්ඨාශයට හෝ වේවා, බොරැල්ල කොට්ඨාශයට හෝ වේවා, පැන්න එකාට තඩි බාන එකයි, ඉදිරියට කරන ක්‍රියා කලාපය කියා මේ අවසථාවේදී භය නැතුව ප්‍රකාශ කරනව. මේක, තීරණාත්මක සටනක්. ආලය කිරීමේදී සහ යුද්ධ කිරීමේදී සෑම නිතියකටම ඉඩකඩ තියෙනව. All is fair in love and war. මේකෙදී කඳවුරු දෙකකට බෙදී අවසානයි. අපේ ගරු අගමැතිනිය මෙම කාල සීමාව තුළදී මීට වඩා සාර්ථක ලෙස අධිරාජ්‍ය විරෝධී වැඩ පිළිවෙළ ගෙන යන්න සූදානම් වෙනව.

ගරු කථානායකතුමනි, වැදගත් කරුණු කීපයක් ගත වුණු කාල සීමාවේ සිදු වුණා. ඉන් එක් කරුණක් සම්බන්ධයෙන් කර්මාන්ත ඇමතිතුමා ඇතුළු ඇමති මණ්ඩලයට—අපි එම අවස්ථාවෙ සභාග ආණ්ඩුව තුළ නොසිටියත්—ස්තුතිවන්ත වෙන්න ඕනෑ. මා එම සිද්ධිය ගැන කියන්න කැමතියි. අද අපි සටන් කරන්නෙ, පත්‍ර ඒකාධිකාරයට විරුද්ධවයි. මීට අවුරුද්දකට තරම ප්‍රථම මේ ආණ්ඩුව තෙල් ඒකාධිකාරයට විරුද්ධව ලොකු සටනක් ගෙන ගියා. මේ රටේ සිටින ඇමෙරිකන් තෙල් ඒකාධිකාරයන්ට විරුද්ධව සටන් ගෙන යන විට තමයි, අපේ ගරු අගමැතිනිය තීන්දුවක් ගත්තෙ, " අපි බනිස් කාල වහල් වෙනවද ? බනිස් නොකා නිදහස් වෙනවද ? " යන ප්‍රශ්නය පිළිබඳව. එවැනි අවස්ථාවකදී පාර්ලිමේන්තුවෙන් සම්මත කළ නීතියෙ ස්වෛරී බලය ආරක්‍ෂා කිරීම සඳහාත්, අපේ රටේ ජනතාවගෙ ජාත්‍යාලය ආරක්‍ෂා කිරීම සඳහාත්, සිරිමා බණ්ඩාරනායක රජය ගන්නා ලද තීන්දුව උඩ මේ රටේ ජාතික ගරුත්වය ආරක්ෂා කිරීමේ පරමාර්ථයෙන්, ජාතික සංවර්ධනය ඇති කිරීමේ පරමාර්ථයෙන් අධිරාජ්‍යවාදී බල වේගයන්ට විරුද්ධව ඉදිරියේදී සටන් කරන්න සූදානම්ය කියා ගරු අගමැතිනිය එම අවස්ථාවේදී ප්‍රකාශ කළා. " විලිස් බනිස් අපට එපා " කියමින් එම සටන ගෙනිච්ච විතරක් නොවෙයි, සියලු දෙනාම බලාපොරොත්තු වුණු කඩා වැටෙන ආණ්ඩුව, සියලු දෙනාම බලාපොරොත්තු වුණු අහිංසක ස්ත්‍රියගෙ ආණ්ඩුව, සියලු දෙනාම බලාපොරොත්තු වුණු නිවට ආණ්ඩුව, ස්ථිර වශයෙන්ම අධිරාජ්‍යවාදීන්ට විරුද්ධව ගොඩ නගවා විතරක් නොවෙයි, එම අවස්ථාවේ යම් තත්ත්වයක් ඇති වුණා නම් ඒ තත්ත්වයට මුහුණ පාන්න ශක්තියක් ඇතිවයි ක්‍රියා කළේ.

මේ රටේ ඉන්ෂුවරන්ස් ව්‍යාපාර—රක්‍ෂණ ව්‍යාපාර—ජනසතු කළා. ජාතික වශයෙන් පංචශීල ප්‍රතිපත්තිය පදනම් කර ගෙන,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ස්ටැන්ලි තිලකරත්න මයා.]

බලගතු කඳවුරු අතර පවා මධ්‍යස්ථ ප්‍රතිපත්තිය ආරක්ෂා කිරීම සඳහා, මේ රජය පියවර රාශියක් අරගත්තා. එසේ කොට ජාත්‍යන්තර විෂයයෙහි අපේ ජාතිය පිළිබඳ කීර්තිය නගා ලීම සඳහා ශක්තියක් සහ වාසනාවක් ගරු අගමැතිනියට ලැබුණා. මේ අනුව අප මුහුණ පාන ඉදිරි කාල පරිච්ඡේදය ඉතා වැදගත්.

1960 ජූලි මාසයේ ඉදිරියට ගිය ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ රජයට මෙම වර්ෂයෙ අප්‍රේල්වලදී ඉතා වැදගත් තීන්දුවක් ගන්න සිදු වුණා. මෙම වර්ෂයෙ අප්‍රේල් වල ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙ විධායක කාරක සභා අවස්ථාවෙදී, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙත්, ලංකා සමසමාජ පක්ෂයෙත් සභාග ආණ්ඩුවක් පිහිටුවා මේ රට දියුණුවට ගෙන ඒම පිණිස ගරු අගමැතිනියත්, ගරු ඇමතිවරුත් බලය අරගෙන, ඉතිහාසගත වන කතාවක් ගරු අගමැතිනිය නුවරඑළියේදී මහජනයට ප්‍රකාශ කළා. නුවරඑළියේදී ගරු අගමැතිනිය කළ කථාව ලංකා ඉතිහාසයේ ප්‍රගතිශීලී ව්‍යාපාරය සම්බන්ධයෙන් ඉතා වැදගත් කථාවක්. ගරු අගමැතිනිය එදා කීවෙ මොකක්ද? 1956 දී දිවංගත අගමැතිතුමා මේ රට ප්‍රගතිය කරා ගෙන යාමට යම් කිසි ගමනක් ආරම්භ කළාද ඒ ගමන තව දුරටත් යාමටත්, මේ රටේ ප්‍රගතිශීලී ව්‍යාපාරය ශක්තිමත් කිරීමටත්, මේ රටේ අධිරාජ්‍ය විරෝධී සහ යූ. එන්. පී. විරෝධී බල වේගයන් ශක්තිමත් කරමින් මේ රටේ ජාතික, සාමාජික හා ආර්ථික කාර්යභාරයන් හරියාකාර ඉටු කිරීමටත් මම ප්‍රගතිශීලීන්ගේ සහය බලා පොරොත්තු වෙනවාය කියන වැදගත් ප්‍රකාශය ගරු අගමැතිනිය කළා. මට පත්‍රයේ වාර්තා වී තිබුණු එක කරුණක් මතකයි. අපේ කර්මාන්ත ඇමතිතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ කාරක සභා රැස්වීමකදී කියා තිබෙනව, අපි සන්ධිස්ථානයකට ඇවිත් සිටිනවය, මේ සන්ධිස්ථානයේදී දකුණට හැරිල යනවද, වමට හැරිල පෙරට යනවද කියන ප්‍රශ්නය අප ඉදිරිපිට තිබෙනව නම් වමට හැරී පෙරට යනවා මිස දකුණට හැරී යන්නෙ නැත කියා. ඒ අදහස් රාශියම එකට ගොනු වීමෙන් පසුගිය ජූනි 11 වැනිදා, අප ඉදිරියේ අද පෙනෙන, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේත්, සමසමාජ පක්ෂයේත් සභාග ආණ්ඩුව මේ රටේ ඇති කරන්න අපට පුළුවන් වුණා.

මේ සභාග රජය ඇති වූ දා පටන්ම අපට බොහොසෙයින් සතුරන් ඇති වන්නට පටන් ගත්තා. මම අවිස්සාවේල්ලෙ ගරු මන්ත්‍රීතුමාට එකක් කියන්න ඕනෑ. මේ රජයට ඇතුළු වීමට ඔහුට කිසිම දොරක් වහල තිබුණෙ නැහැ. මේ රජයේ ක්‍රියාකාරී සාමාජිකයකු වශයෙන් කටයුතු කිරීම සඳහා මේ රජයට ඇතුළු වීමට කිසිම ඉබ්බෙක් දාල කිසිම දොරක් එතුමී වහල තිබුනෙ නැහැ. නමුත් ඔහුගේ වැරදි වලින්ම—පසුගිය මැයි පළමු වැනිදා ඔහු කළ කථාවෙන්ම—ඔහුට තිබුණු මාර්ගය ඔහුම වසා ගැනීම ගැන මම කනගාටු වෙනව. මා අවිස්සාවේල්ලෙ ගරු මන්ත්‍රීතුමාගේ දේශපාලන ජීවිතය ගැන බොහොම හොඳින් කල්පනා කර තිබෙන කෙනෙක්. මගේ කෙස් නම් ඒ තරම් පැහිල නැති වුණත් එතුමාගේ දේශපාලන ක්‍රියා මාර්ගය ගැන මම හොඳින් කල්පනා කර තිබෙනව. එතුමා ඓතිහාසික තීරණයන් ගත් අවස්ථාවලින් අවස්ථා 5 කදී හරියට තීරණයන් ගත්තා නම් අවස්ථා 15 කදීම වැරදියට තීරණයන් ගත්තාය කියන්න පුළුවන්. ඒ විධියට තීරණයන් ගැනීමේ ගතියක් එතුමා තුළ තිබෙනව. 1956 වර්ෂයේදී එතුමා ගත්ත තීරණය හරි. 1956 දී බණ්ඩාරනායක ආණ්ඩුවට ඇතුළු වී එතුමා ගෙන ගිය වැඩ පිළිවෙළ හරි. නමුත් පසුගිය මැයි මස 1 වැනිදා ඔහු ගත්ත ක්‍රියා මාර්ගය හරිද කියා ඔහුගේ දේශපාලන හෘදය සාක්ෂියක් තිබෙනව නම් එය හොඳින් විමසා නැවත වරක් ඒ ගැන කල්පනා කළ යුතුයි. ඒ අවස්ථාවේදී ඔහු විසින් ප්‍රසිද්ධියේම ගරු අගමැතිනියට චෝදනා එල්ල කිරීමෙන් ලංකා සමසමාජ පක්ෂයටත්, ඒ ලංකා සමසමාජ පක්ෂයත් සමග සම්බන්ධ වී වාමාංශික එක්සත් පෙරමුණට අයිති වී සිටි කොමියුනිස්ට් පක්ෂයටත් ඔහු කළේ යුතුකමක්ද කියා ඔහුගෙන්ම සමාජවාදි ව්‍යාපාරය ගැන ඉගෙන ගත් ශිෂ්‍යයකු වශයෙන් ඔහුගෙන්ම මම අහනව. ගුරුන්නාන්සේ මේ කළ ක්‍රියාව හරිද කියා මම අහනව. ගුරුන්නාන්සේ මොනවද කළොත් ගෝලයන් එය දූව දූව කරනවය කියා සිංහල කථාවක් තියෙනව.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කොටියා හැම තිස්සෙම බළලට ගහට යන්න ඉඩ දීල බැස්ස හැටියෙ ඌව මැරී මෙ සිරිතක් තියෙනව. මරල වදිනව. ගුරුනාන්සේ, ඔබ මට ගහට යන්න පුරුදු කළත් ගහෙන් බහින්න පුරුදු කළේ නැත, ඒ නිසා මරණවය, නගින්න පුරුදු කළ නිසා වදිනවය කියනව. ඒ වගේම බහින්න පුරුදු කළේ නැති නිසා දේශ පාලන වශයෙන් මරන්න ඕනෑ. මේ ශාස්ත්‍රය මුලින් ඉගැන්නුවට මෙන්න වදිනව කියන එකයි, මට අවිස්සාවෙල්ලෙ ගරු මන්ත්‍රීතුමාට කියන්න තියෙන්නෙ. වෙන දෙයක් මට එතුමාට කියන්න නැහැ. ඔහු හිතනව ඇති, අපි ඔහුගේ බෙල්ල කපන්නට ලැස්ති වෙනවය කියා. ඔහු මේ රටේ ප්‍රගතිශීලී ව්‍යාපාරයේ බෙල්ල කපන්න ලැස්ති වෙනවා නම්—ගරු සිරිමාවෝ බණ්ඩාරනායක රජය පෙරළා දමා මේ රටේ ප්‍රතිගාමීන් නැවත වතාවක් බලයට පත් කරන්න ලැස්ති වෙනවා නම්—රටේ මහජනතාව ආරක්ෂා කිරීම ඔහු ආරක්ෂා කිරීමට වඩා වැදගත් දෙයක් බව මම කියන්න ඕනෑ.

මේ අවස්ථාවේදී මතක් කළ යුතු දේ රාශියක් තියෙනව. අද රාජාසනයේ කථාව පවත්වන වේලාවේදී ගරු දඹදෙනියේ මන්ත්‍රීතුමා නැවතී සිටිම ඉතා වැදගත් දෙයක් බව එතුමා මේ ගරු සභාවේ නැති අවස්ථාවේදී මම කීවා. මම ඒ ගරු මන්ත්‍රීතුමා වර්ණනා කරන්න ලැස්ති නැහැ. ඔහුගේ ක්‍රියා කලාපයේ අනික් හරිය බලන්නෙ නැතිව මට ඔහු වර්ණනා කරන්න බැහැ. ඒ නිසා ඒ මන්ත්‍රීතුමා ගන්නා සෑම පියවරකදීම ඒ ගන්නා පිය වරේ ප්‍රමාණයට අපි ඒ මන්ත්‍රීතුමාට මල් පොකුරු විසි කරන්න සූදානම් බව ප්‍රකාශ කරන්න කැමතියි.

මේ රාජාසන කථාව බොහෝ දෙනෙක් බලාපොරොත්තු වූ විදියට නොවෙයි, කර තිබෙන්නේ. මේ රටේ බෞද්ධ බලවේගයේ කට අරවා, ජාතික බලවේගයේ කට අරවා, පත්‍රකාරයින්ගේ ප්‍රකාශ ඒවා තුළින් ප්‍රකාශ කිරීමට නේද, පත්‍රකාරයින් දැන් මහන්සි ගන්නේ? නිකාය දෙකේ ස්වාමීන් වහන්සේලාගේ ප්‍රකාශ ලිව්වේ කවුද? ලේක්හවුස් සමාගම නේද? අද පත්‍ර සංයුක්ත මණ්ඩල පණතට විරුද්ධව රැස්වීම් සංවිධානය කරන්නේ ලේක්හවුස් සමාගමයි. ස්වාමීන් වහන්සේලාගේ රැස්වීම් සංවිධානය කරන්නේත් ලේක්හවුස් සමාගමයි; එක්සත් ජාතික පක්ෂයයි. ගිය ඉරිදා එක්සත් ජාතික පක්ෂයට අවිස්සාවේල්ලේ ගරු මන්ත්‍රීතුමාගෙනුත් වැලිමඩ ගරු මන්ත්‍රීතුමාගෙනුත් හොඳ කණුවක් වැටුණා. හාමුදුරුවරු කැදෙව්වා. අවිස්සාවේල්ලේ මන්ත්‍රීතුමාත් වැලිමඩ මන්ත්‍රීතුමාත් පමණයි කථා කළේ. එක්සත් ජාතික පක්ෂයට තත්ත්වයක් දුන්නේ නැහැ. එදායින් පස්සෙ ඩඩ්ලි සේනානායක මහත්මයත් ටිකක් බය වෙලා. [බාධාකිරීමක්.]

ගිය ඉරිදා මහා සංඝයා වහන්සේ කොළඹට වැඩම කෙරෙව්වා, ටොරිංටන් චතුරශ්‍රයේ පැවැත්වූ අපේ රැස්වීම පරාජය කිරීමට. කවුද, ආවේ? ස්වාමීන් වහන්සේලා 400 ක් පමණ ලේක්හවුස් ආධාර ඇතිව ආවා. ඒ විදියට ගමන් ගාස්තු දී ගෙනවුත් පින්තූරත් දමන්න ලැස්ති කළා. කවුද, එම වේදිකාවේ කථා කළේ? අවිස්සාවේල්ලේ ගරු මන්ත්‍රීතුමාත් වැලිමඩ මන්ත්‍රීතුමාත්. යූ. එන්. පී. එකට ටිකක් හෙමින් පස්සට බහින්න සිද්ධ වුණා. දැන් ඇතුළේ හැප්පීම්. දැන් කොහොමද, පෙඩරල් පක්ෂයත් සමඟ වැලිමඩ මන්ත්‍රීතුමා කරට අත දා ගෙන යන්නේ? ඒ දෙගොල්ල තාවකාලිකව කරට අත දමා ගෙන යනවා. [බාධාකිරීමක්.]

මේ රටේ බුද්ධාගමට මේ රජය මුල් තැනක් දී තිබෙනවා. මේ පිළිබඳව මිහින්තලේ ගරු මන්ත්‍රීතුමා (පී. එම්. කේ. තෙන්නකෝන් මයා.) විසින් සාදන ලද කවියක් මට කියන්න සිතුනා.

"බුද්ධාගමත් කහ සිවුරත් පරම රම"

**කථානායකතුමා**

*(சபாநாயகர்)*

(Mr. Speaker)

මම හිතනවා, කවි තාලයට කීම හරි නැත කියා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ස්ටැන්ලි තිලකරත්න මයා.**
*(திரு. ஸ்டான்லி திலகரத்ன)*
(Mr. Stanley Tillekeratne)

I am sorry. That was a Ruling of a former Speaker. I thought you will give a better Ruling than that.

There was a Speaker who occupied that Chair. To him Sinhala was against all what he stood for. So, when the hon. Member for Moratuwa recited *kavi* in the *kavi* form, he ruled that Sinhala *kavi* must be recited in in the *kavi* form. If you are capable of giving bold and forthright Rulings, I think on this matter you must rule that Sinhala *kavi* must be recited in the Sinhala way. Of course, if you tell me that it must be recited in the verse style in the English verse, yes.

"බුද්ධාගමත් කහ සිවුරත් පරම රම
පිහිටෙන් දියුණ ලැබගත් අගලකම හැම
ඉංදි සයුරෙ මුතු ඇටයකි කියන නම
මතකයි ලබාගත් හැටි මේ සිහල බිම."

1956න් පසු මේ රටේ කිසිම කෙනෙකුට චෝදනාවක් කරන්න පුළුවන්කමක් නැහැ, දිවංගත බණ්ඩාරනායක අගමැතිතුමාගේ ආණ්ඩුවෙන්වත්, වත්මන් ආණ්ඩුවෙන්වත්, මේ සභාග ආණ්ඩුවෙන්වත් බුද්ධාගමට හෝ සංඝයා වහන්සේට විරුද්ධව කටයුතු කළාය කියා. නුවර එළියේ ගරු මන්ත්‍රීතුමා මතක් කළා, මේ රටේ බෞද්ධ විද්‍යා පීඨයන් දෙකක් වන විද්‍යාලංකාර පිරිවෙනත්, විද්‍යොදය පිරිවෙනත් විශ්ව විද්‍යාල තත්ත්වයට නැංවූයේ බණ්ඩාරනායක රජයෙන් බව. දැන් අනුරාධපුරයේ බෞද්ධ භික්ෂු විශ්ව විද්‍යාලයක් පිහිටුවීමටත්, අපට සැම අවස්ථාවකම සහාය දෙන කතරගම දෙවියන්ගේ වාස භවනය වන කතරගම කෝවිල පිහිටි භූමිය ශුද්ධ නගරයකට පරිවර්තනය කිරීමටත්, ගරු අගමැතිනිය ඊයේ සැන්දෑවේ මා සමඟ සාකච්ඡා කළ පරිදි කෝට්ටේ රජ මහා විහාරය පිහිටි ප්‍රදේශය පූජා භූමියකට පරිවර්තනය කිරීමටත් යථා කාලයේදී කටයුතු කරනවා ඇති.

ගරු කථානායකතුමනි, මේ වාගේ කාරණාවල් රාශියකට අප විසින් දැන් වැඩ කටයුතු සලසා තිබෙනවා. එපමණක් නොව, මේ රටේ ආධාර ලබන පාඨශාලා නමින් තිබුණු අධ්‍යාපන ආයතන සහ ගුරු අභ්‍යාස විද්‍යාලත් රජයට පවරා ගැනීමේ පණත් මගින් මේ රටේ අධ්‍යාපන විෂයයෙහි ලා ඉතා වැදගත් වෙනස්වීම් රාශියක් වර්තමාන ආණ්ඩුව විසින් ඇති කර තිබෙන නිසා මේ රටේ බහුතර ජනතාව වන බෞඩ ජනතාවගේ අදහස් හුඟක් දුරට සාර්ථක කර දී ඒ අය බලාපොරොත්තු වූ කාරණා රාශියක් හරියාකාර ඉෂ්ට කර දෙන්න අපට පුළුවන් වෙලා තිබෙනවා.

මේ රාජාසන කථාවේ අඩංගු වී තිබෙන දෙවැනි කාරණය ඉන්දු-ලංකා සම්මුතියයි. ඒ ගැන නුවරඑළියේ ගරු මන්ත්‍රීතුමා (විලියම් ප්‍රනාන්දු මයා.) විසින් කරුණු පැහැදිලි කර දෙන්න යෙදුණා.

රාජාසන කථාවේ එන තුන්වැනි වැදගත් කාරණය මෙයයි: පසුගිය සැසි වාරයේ ක්‍රියාත්මක කිරීම සඳහා රාජාසන කථාවේ ඒ අවස්ථාවේ සඳහන් වී තිබුණු කරුණුවලින් ඒ සැසි වාරයේදී ඉදිරිපත් කර ක්‍රියාත්මක කරන්නට බැරි වූ නීතිමය හා පාලනමය වූ වැඩ කොටස් මෙම සැසි වාරය තුළදීද කරගෙන යාමට ආණ්ඩුව අදහස් කරන බවයි. එම අදහස් පෙරදැරි කොට, පසුගිය සැසි වාරයේදී අහෝසි වූ ව්‍යවස්ථා කෙටුම්පත් සහ අවශ්‍ය අනිකුත් ප්‍රගතිශීලි වැඩ සටහන් ඔබ හමුවේ තබනු ඇත, කියාත් ඊළඟට සඳහන් වෙනවා. ඒ කියන්නෙ මේ සැසි වාරයේදී පත්තර පණත් දෙකම අප විසින් ඉදිරිපත් කරනු ඇත යන්නයි.

තව දුරටත් ලොකු ව්‍යාපාරයක් ගෙන යන්න සූදානම් වෙනවා. මේ පත්තර පණත් දෙක ඇවිල්ලා මේ රටේ බෞද්ධාගම නැති කරන්න ඉදිරිපත් කර තිබෙන පණත් දෙකක්ය කියා රටට පෙන්වන්න ලොකු ව්‍යාපාරයක් ගෙන යන්න පටන් අරන් තිබෙනවා. ඒ කොයි හැටි වෙතත්, දැන් මම මේ පත්තර කොමිෂන් සභා වාර්තාවෙන් බොහොම ටිකක් තැනින් තැන උපුටා මේ ගරු සභාවට පෙන්වන්න බලාපොරොත්තු වෙනව. එයින් සෑහෙන තරම් කරුණු වටහා ගන්න පුළුවන් වේ යයි මා විශ්වාස කරනව. මේ රටේ අපේ මහානායක සවාමීන් වහන්සේ නමක් වන අමුණුගම විපස්සි මල්වත්ත පාර්ශ්වයේ මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සේත්, දිවංගත එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක අගමැතිතුමාත්, ඒ වගේම විජයවර්ධන පවුලේ කෙනෙකුත් විසින් කරන ලද ප්‍රකාශ සහ ස්වදේශ පත්තර කාර්යාලයේ ප්‍රධාන කර්තෘ මහත්මයා වන ධනපාල මහත්මයත් විසින් කරන ලද ප්‍රකාශයන් හතරක් ඔබතුමා හමුවේ තබා, ඉන් පසු අද මේ පත්තර මේ රටේ බෞඩ විරෝධි වැඩ කටයුතු කරගෙන යන බව අතිගරු අමුණුගම රාජගුරු විපස්සි මහනායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ මුවිනුත් එල්. එච්. මෙත්තානන්ද මහත්මයාගේ කටිනුත්, විජේවර්ධන පවුලේ කෙනෙකුගේ කටිනුත් ඒවා එසේ බව ඔප්පු කරල ඉවර වෙලා, මේ පත්තර පිළිබඳ රජයේ කටයුතු සාර්ථක කර ගැනීමට වැඩ පිළිවෙළ ඉදිරිපත් කරමින් මගේ කථාව මිනිත්තු පහළොවකින් පමණ අවසන් කරන්න මා බලාපොරොත්තු වෙනව.

ගරු කථානායකතුමනි, විශේෂයෙන්ම මතක් කළ යුතු වැදගත් දේ ගණනාවක් පුවත්පත් කොමිසමේ අවසන් වාර්තාවේ තිබෙනවා. එහි 18 වන ඡේදය ගැන ටිකක් කල්පනා කර බලමු. මම දැන් එය ඉංග්‍රීසියෙන් කියවා, නැවත සිංහල භාෂාවට පරිවර්තනය කර දෙන්නම්. මෙන්න ඒ කොටස :

"18. We regret to observe that the Press of this country, almost as a whole, has not conformed to the general principles of journalism followed in democratic countries. The witnesses who appeared before us charged the Press with the publication of news which was slanted, distorted or fabricated in order to serve the masters who own these newspapers. Two additional charges which we have referred to in our Interim Report, were also levelled against the Press. Those charges are somewhat unusual and can seldom be framed against the Press in other democratic countries. These two charges are that our newspapers have conducted themselves in a manner hostile to the interests of the country and Buddhism, the religion professed by the vast majority of the permanent population."

Then, Mr. Speaker, I refer to paragraph 19 :

"The Bauddha Jatika Balavegaya (hereinafter referred to as the B. J. B.) very vehemently brought these two charges against the Press."

And their leader, Mr. L. H. Mettananda, an educationist of great eminence, gave evidence before this Commission. What more support against this press ?

එහි සිංහල පරිවර්තනය මෙසේයි :

"වෙනත් ප්‍රජාතන්ත්‍රවාදී රටවල පුවත්පත් කලාව පිළිබඳව පවත්නා සාමාන්‍ය මූලධර්ම පවා මෙරට පුවත්පත් විසින් සහමුලින්ම වාගේ උල්ලංඝනය කොට ඇති බැව් දක්නට ලැබීම සංවේගයට කරුණකි. පුවත්පත් හිමියන්ගේ මනදොළ පුරවනු සඳහා ප්‍රවෘත්ති එක් පැත්තකට බර කොට විකෘති කොට නැතහොත් අමුතුවෙන් ගොතා පළ කෙරෙතියි අප ඉදිරියට පැමිණි බොහෝ සාක්ෂ්‍යකරුවෝ පුවත්පත්වලට චෝදනා කළහ. අපගේ අතුරු වාර්තාවෙහි පළ වූ අතිරේක චෝදනා දෙක ද එල්ල වූයේ පුවත්පත් කෙරෙහිම ය. 'අපේ පුවත්පත් රටටත්, රටේ ස්ථිර පදිංචිකාර බහුතර ජනතාවගේ ආගම වූ බෞද්ධාගමටත් හානිකර අන්දමින් ක්‍රියා කොට ඇත' යනුවෙන් නැගෙන තරමක් අසාමාන්‍ය තත්ත්වයෙක වූ එම චෝදනා වූ කලී වෙනත් ප්‍රජාතන්ත්‍රවාදී රටවල පුවත්පත් කෙරෙහි නම් ආරෝපණය කළ හැක්කේ ඉතා කලාතුරකිනි."

ගරු කථානායකතුමනි, එහි 19 වැනි ඡේදයේ මෙසේ සඳහන් කර තිබෙනවා :

"පූර්වෝක්ත චෝදනා දෙක පුවත්පත් කෙරෙහි ඉතා තියුණු ලෙස එල්ල කරන ලද්දේ බෞද්ධ ජාතික බලවේගය විසිනි. ඉන් අනතුරුව සාක්ෂිදුන් බොහෝ දෙනෙක්ද බෞද්ධ ජාතික බලවේගයෙන් නැගුණු මෙම චෝදනා දෙක අනුමත කළහ."

මේ කරුණු ඉදිරිපත් කරල තියෙන්නෙ බෞද්ධ ජාතික බලවේගයේ නායක එල්. එච්. මෙත්තානන්ද මහත්මයයි.

ගරු කථානායකතුමනි, පුවත්පත් කොමිෂන් සභා වාර්තාවේ 23 වැනි ඡේදය ඉතා වැදගත්. දූත් පත්‍රකාරයන් කියාගෙන යනව, අපේ දිවංගත අගමැතිතුමා පත්‍රවල තත්ත්වය ගැන මෙවැනි ප්‍රකාශයක් කර නැත කියා. අද අපේ ගරු අගමැතිනිය ආඥාදායකත්වයක් ගොඩ නඟන්ට යනවා යයි චෝදනා ඉදිරිපත් වෙන මෙවැනි අවස්ථාවක, හදිසි නීති මාර්ගයෙන් රට පාලනය කරන්ට යනවා යයි එතුමියට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ස්ටැන්ලි තිලකරත්න මයා.]

චෝදනා එල්ල කරන අවස්ථාවක, දිවංගත අගමැතිතුමාගේ ඉතා වැදගත් ප්‍රකාශයක් වන මෙය ගරු සභාව ඉදිරියේ තබනව:

"23. The conduct of the Press came in for caustic comment, in our opinion justifiable comment, by the late Prime Minister, Mr. S. W. R. D. Bandaranaike in his address to the Press Association of Ceylon on January 10, 1959. He said: 'The Chairman referred to the responsibilities of the Press—the responsibilities of the Press in guiding public opinion and in reflecting public opinion. Very true, that responsibility is particularly important in a country like this where we have something approaching a press monopoly.—"

The late Prime Minister knew that the press was reaching 'the concentration of a heavily weighted monopoly——

"—One of the most unhealthy features in this democracy of Sri Lanka—"

The late Prime Minister felt that the monopolistic press was a most unhealthy feature in the democratic set-up of Sri Lanka——

"—is this existence of what in fact amounts to press dictatorship, a press monopoly. I cannot help being amused at times when the Press, or certain sections of it, accuse me of dictatorial tendencies, dictatorial action, shout out and scream out their adherence to the principle of democracy—"

They are doing this even today against the Coalition Government of Madam Sirimavo Bandaranaike——

"I cannot help being amused at times when the Press, or certain sections of it, accuse me of dictatorial tendencies, dictatorial action, shout out and scream out their adherence to the principle of democracy when, as a matter of fact, their own position provides one of the most pernicious and vicious dictatorships the world, particularly the democratic world, can possibly know. That is a dictatorship of the Press. It is one of the worst types of dictatorship. He proceeded to state further: 'But in a newspaper, by various methods of omission, of commission, of a slight twist here, a slight distortion there, by letters addressed to the Press usually under the title 'pro bono publico' generally manufactured in the Press office itself, by various articles and by various editorial stratagems, a wrong impression can be created in the minds of the public'."

The last paragraph is important.

During the last few weeks the press of this country has been manufacturing articles; the press of this country has been issuing statements and getting certain priests to sign them. Reading the statement issued by the hon. Member for Nivitigala (Mr. Stanley Molligoda), who crossed over to the other side, knowing his vocabulary too well, I thought for myself that it was really another statement prepared by Lake House to be published in his name for the consumption of the public.

I have now quoted to you Mr. Mettananda's views on the anti-Buddhist activities of this press—this press which we are going to democratize—and I have quoted to you the views of the late Mr. Bandaranaike and his views on this press.

ගරු කථානායකතුමනි, මා එහි සිංහල අනුවාදය කියවන්නම්. පුවත්පත් කොමිෂන් සභා වාර්තාවේ 23 වැනි ඡේදය මෙසේ යි:

"දිවංගත අගමැති ඇස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක මහතා 1959 ජනවාරි 10 වෙනි දින පැවැත්වුණු ලංකා පුවත් පත් සම්මේලනය ඉදිරියේ කළ දේශනයේ දී මෙරට පුවත්පත්වල ක්‍රියා කලාපය ඉතා කර්කෂවූත්, අපගේ මතය අනුව සැබවින්ම සාධාරණවූත් විවේචනයට භාජන කරමින් මෙසේ පැවසීය. 'ප්‍රවෘත්ති පත්‍රයේ වගකීම හෙවත් මහජන මතය නිසි මග යැවීම හා මහජන මතය පිළිබිඹු කිරීම පිළිබඳ වගකීම ගැන සභාපතිතුමා සිය කථාවේදී සඳහන් කළා. ඇත්තෙන්ම පුවත්පත් ඒකාධිකාරයක් වැනි යමක් වැඩෙමින් පවත්නා අපේ වැනි රටක පුවත්පත් එබඳු වගකීමක් ගැන සැලකිලිමත් වීම ඉතාම වැදගත් කරුණක්. මේ ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදයෙහි ප්‍රකටව දක්නට ලැබෙන ඉතා අසුභ ලකුණු වලින් එකක් නම් මෙන්න මේ අන්දමේ ප්‍රවෘත්ති පත්‍ර ඒකාධිපතිත්වයකට නෑකම් කියන ප්‍රවෘත්ති පත්‍ර ඒකාධිකාරයයි."

දිවංගත අගමැතිතුමා එදා කියා සිටියා, මේක තමයි, නියම ඒකාධිකාරිය කියා.

"'ඒ එසේ වුවත් මේ පුවත්පත්ම ඇතැම්විට මා ඒකාධිපතියකු වීමට වෑයම් කරතියි, ඒකාධිපතියකු ලෙස ක්‍රියා කරතියි චෝදනා කරමින් තමන් ප්‍රජාතන්ත්‍රවාදයේ මුර දේවතාවන් බව මහ හඬින් කියා ඝෝෂා කිරීම විහිළුවක්!"

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අද පුවත්පත් ඒකාධිකාරීන් මොකද කියන්නෙ? දිවංගත අගමැතිතුමා ජන සම්මත වාදියෙක්ය, සිරිමා බණ්ඩාරනායක අගමැතිනිය මේ සභාග රජයත් සමග ඒකාධිපතිත්වයක් කරා ගමන් කරනවා යයි අද කියන අයට එදා බණ්ඩාරනායක අගමැතිතුමා කිව්ව, "මටත් උඹල ඔය චෝදනාව එල්ල කළාය, එහෙත් නියම ඒකාධිපතිත්වයක් තිබෙන්නේ උඹලාටය" කියා. ඇයි මේ පුවත්පත් කොමිෂන් සභා වාර්තාව ප්‍රවෘත්ති පත්‍ර මගින් ප්‍රසිද්ධ නොකරන්නෙ? මේ පත්‍ර සමාගම් වෙනත් කොමිෂන් සභාවල වාර්තා නම් ප්‍රසිද්ධ කරනව. ඇයි මේක විතරක් ප්‍රසිඬ නොකරන්නේ? බණ්ඩාරනායක අගමැතිතුමාගේ කථාවේ තව දුරටත් මෙසේ සඳහන් වෙනව:

"ප්‍රජාතන්ත්‍රවාදී ලෝකයක ඇති විය හැකි භයානකම දෙය පුවත්පත් ඒකාධිපතිත්වයක්. ඒකාධිපතිත්වයක් අතුරිනුත් දරුණුම එක තමා පුවත් පත් ඒකාධිපතිත්වය.' තව දුරටත් විවේචනයෙහි යෙදුණු එතුමා මෙසේ ද පවසා ඇත: 'එපමණක් ද නොව නොයෙක් අන්දමේ අමතකවීම්, අතපසු වීම් ස්වරූපයෙනුත්, තැනක සුළු වෙනසක් කොට, තවත් තැනක යන්තමින් විකෘත කොට ලිවීමෙනුත්, වැඩි වශයෙන්ම පුවත්පත් කාර්යාලයේ දීම පිළිසිඳී පොදු හිත කැමැත්තෙක්' යනාදි වූ ව්‍යාජ නාමයකින් පළ කෙරෙන කතීෘට ලැබෙන ලියුම් මගිනුත් එසේම නොයෙක් විශේෂ ලිපි හා කුට කතු වැකි මගිනුත් පුවත්පතකට කැමති පරිදි මහ ජනයා තුළ වැරදි හැඟීම් ඇති කර විය හැකිය.'"

ගරු කථානායකතුමනි, දිවංගත අගමැතිතුමා කිව්ව දේ තමයි ඒ. ලේක්හවුස් එක සම්බන්ධයෙන් විජේවර්ධන කෙනෙකුත් කිව්ව දෙයක් කියා කථාව අවසන් කරන්ටයි, මා බලාපොරොත්තු වෙන්නෙ. "රිවෝල්ට් ඉන් ද ටෙම්පල්" කියන පොත ලිව්වෙ ලේක්හවුස් එක අයිති ඩී. ආර්. විජේවර්ධන මහත්මයාගේ සහෝදරයෙක්. ඔහුගේ පොතේ මෙසේ සඳහන් වී තිබෙනව:

"The compiler of the "Revolt in the Temple" who, we understand, was a brother of the late Mr. D. R. Wijewardene, advocated the establishment of a "People's Press" in Ceylon——

He advocated a People's Press in Ceylon——

He said: "If one of the main functions of the Press is to mould the character of a nation, a privately owned Press is notoriously incompetent to perform this function; and even if competent, it would be the wrong body to do it. The motives which must direct a privately owned Press, run for profit, do not permit it to function as an uplifting agent for the national character".

ගරු කථානායකතුමනි, කරුණා කර මෙයටත් සවන් දෙන්න.

Revolt in the Temple හෙවත් 'බෝමැඩ විප්ලවය' නමැති කෘතියෙහි කතුවරයා ලංකාවෙහි 'මහජන පුවත්පතක්' තිබීමේ වැදගත් බව පෙන්වා දී තිබේ. මේ කතුවරයා මියගිය ඩී. ආර්. විජේවර්ධන මහතාගේ සොහොයුරෙකැයි අපට දැන ගන්නට ලැබී ඇත. එම කෘතියෙහි එක් තැනෙක මෙසේ සඳහන් වෙයි. 'පුවත්පතක ප්‍රධාන කාර්යයන් එකක් ජාතික චරිතය හැඩ ගැස්වීම නම්, එම කාර්යය ඉටු කිරීමට පෞද්ගලික පුවත්පතක් කිසිසේත්ම සුදුසු නොවේ. සුදුසු වුවද, එය ඉටු කළ යුතු යෝග්‍යතම ආයතනය එය නොවේ. පෞද්ගලික පුවත්පත් පැවැත්වෙන්නේ ලාභ ලැබීමේ චේතනාව පෙරදැරි කොට ගෙනය. එබඳු පුවත්පතකට ජාතික චරිතය දියුණු කිරීමේ කාර්යය ඉටු කළ නොහැකිය."

අන්න එහෙමයි ප්‍රකාශ කර තිබෙන්නෙ.

අන්තිමට අපේ අමුණුගම විපස්සී නායක සවමීන් වහන්සේගේ දේශනයකින් පසුව තමයි මා ඒ අංශය අවසාන කරන්න අදහස් කරන්නෙ. ගරු කථානායකතුමනි, මේ පුවත්පත් කොමිෂන් සභා වාර්තාවේ 117 වැනි ඡේදය බලන්න. එය ඉතා වැදගත්. අද අපට විරුද්ධ සංඝයා වහන්සේලා බෞද්ධ ශාසනය ආරක්‍ෂා කිරීමට කැඳවන මල්වතු පාර්ශ්වයේ මහා නායක ස්වාමීන් වහන්සේ විසින් කර තිබෙන ප්‍රකාශනය ඉතා වැදගත්. මෙය මල්වත්තෙ නායක ස්වාමීන් වහන්සේ නැවත වරක් කියවා බැලීම ඉතා වැදගත් යයි කියා මා ප්‍රකාශ කරනව.

"In regard to the attitude of the press towards the Buddhist religion it is relevant to recapitulate the observations made by the Ven. Amunugama Sri Vipassi when he made a statement to the Secretary of this Commission on June 3, 1964. In the course of that statement he said"——

මෙන්න මෙහෙමයි කිව්වෙ:

"පුවත්පත් වලින් සෑම විටම බෞද්ධ කටයුතු, බෞද්ධ විහාරවලට අපහාස වන අන්දමේ පුවත් පළ කරනු ලැබේ. පන්සලක් ළඟ කෝලාහලයක් ඇති වුවත් ඒ පන්සල හා සම්බන්ධ එකක් හෝ පන්සලේ දායක මහතුන් සම්බන්ධ වූවක් ලෙස ප්‍රසිද්ධ කරනු ලැබේ. පල්ලියක් අසල හෝ පල්ලිය සම්බන්ධව එයට දරුණු දෙයක් වුවද කිසි දිනක පළ කරනු නොලැබේ."

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ස්ටැන්ලි තිලකරත්න මයා.]

ගරු කථානායකතුමනි, ඒ විතරක් නොවෙයි, තව දුරටත් ඉංග්‍රීසියෙන් මෙසේ සඳහන් කර තිබෙනවා—

" meaning, the newspapers always publish news items of an insulting nature regarding Buddhist activities and Buddhist places of worship. Even if a disturbance takes place close to a temple, it is given publicity as something which has a connection with the temple or with its dayakayas. The newspapers never publish news relating to incidents of a very serious nature which occur near churches or in connection with them. The Ven. Sri Vipassi is the Mahanayaka of the Malwatte Chapter. He is the highest prelate of the Siam Nikaya which is the oldest and the largest sect of Buddhist monks, in this country."

ගරු කථානායකතුමනි, එපමණක් නොවෙයි. ගරු විපස්සි නායක හාමුදුරුවෝ කී දෙයක්—වචනයක්—මෙහි තිබෙනවා. ඒ වචනයට සමා වන්න. මා කියවන්නෙ වාර්තාවෙන්. එය මා පාවිච්චි කළ වචනයක් නොවෙයි. විපස්සි නායක හාමුදුරුවන්ගේ සඟ මුඛයෙන්, නායක මුඛයෙන්, පිට්සුණු දෙයක්. 190 වැනි ඡේදයේ එය තිබෙන්නෙ. මෙය ඉතා වැදගත්. මෙය වැදගත් සඟ මුඛයකින් පළ වූ දෙයක්—

" පුවත් පත්වල පළ කරන දැන්වීම් නිසා බොහෝ දෙනා නොමඟ යනවා. ඒවා දුශ්චරිත වලට බෙහෙවින් තුඩු දෙන ඒවායි."

ඔන්න බලන්න කථානායකතුමනි. වැදගත් හරිය මේකයි. මේ කියන්නෙ මල්වත්තෙ මහා නායක හාමුදුරුවෝයි—

" විශේෂයෙන්ම ලිංගික දුර්වලතා පිළිබඳව පළ වන දැන්වීම් වලින් විශේෂයෙන්ම පාසැල් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ චරිතය දූෂණය වෙනවා. පුවත්පත් වල මිනී මැරුම්, අපරාධ, ස්ත්‍රී දූෂණ ආදිය විශේෂයෙන් හුවා දැක්වීමෙන් ශිෂ්ඨ අදහස් පහත හෙළා ඇත. ලංකාවේ පුවත්පත් තමන්ගේ වගකීම් සිහි තබා ගෙන කටයුතු කරනවා නම්, රටට විශාල සේවයක් සිදු වන බව කිව යුතුව ඇත."

අත්සන් කර තිබෙන්නෙ, අමුණුගම ශ්‍රී විපස්සි මහා නායක ස්වාමිපාදෝත්තමයාණන් වහන්සේ, 3.6.64 දින මල්වත්තේ දීයි.

" The newspapers have helped to bring down moral standards by giving great prominence to murder, crime and rape. If the newspapers act with the responsibility that is expected of them it will be a great service to the country."

ගරු කථානායකතුමනි, අවසන් වශයෙන් මම එකක් පත්‍රයෙන් පෙන්වන්නම්. මෙය දීම ගැන මා වලපනේ ගරු මන්ත්‍රීතුමාට (පී. බී. එම්. හේරත් මයා.) ස්තුතිවන්ත වෙනවා. ගිය ඉරිදා "සිළුමිණ" පත්‍රයෙ කෙටි කථාවක් තිබෙනවා (පත්‍රයක් පෙන්වමින්) මේ බලන්න මෙහි කියා තිබෙන දෙය: "ජන නායකයන්ගේ මරු ජන නායකයන් මැරූ පිස්සෝය." This is a call to those who are at the helm of the State's affairs.

1964 නොවැම්බර් 15 වැනි ඉරිදා "සිළුමිණ" යි මේ:

" බොහෝ රාජ්‍ය පාලකයන්ගේ ජීවිත නිතරම අවදානම් තත්ත්වයක පවතී. සමහරු උමතු භාවය නිසාද තව සමහරු ප්‍රසිද්ධිය තකාද රාජ්‍ය පාලකයන් මැරීමට ඉදිරිපත් වෙයි. මේ ලිපියෙන් කියවෙන්නේ එවැනි කථා කීපයකි. මධු සමය ගත කරන රජ යුවල යන විට වෙඩි තැබීමකි."

වෙන කථාවක් කියමින් දමා තිබෙන මේ මාතෘකාව අනුව භයානක ලෙස ජනතාවට කැඳවීමක් කරනවා, රාජ්‍ය පාලකයන්ට වෙඩි තැබීමට ඉදිරිපත් වෙන්නය කියා. පත්‍රවලට මා කියනවා මෙදා නම් ඒ අය නරක විධියට වලිගය පාගා ගත්තාය කියා. මේ රජයට විරුද්ධව කැරළි ගැසීමට, මේ රටේ සාමයට බාධාවන අන්දමට ක්‍රියා කිරීමට, ඉදිරිපත් වන විරුද්ධ පක්ෂයේ ඕනෑම කණ්ඩායමක් නොවෙයි, පත්‍ර ඒකාධිකාරී බල වේගයන් වුවත් අපේ ජන සම්මත බලය යොදා ඒවා සියල්ලම පොළවට මට්ටම් කිරීම සිරිමාවෝ බණ්ඩාරනායක රජය විසින් ස්ථිර වශයෙන්ම කරන බව මා මේ අවස්ථාවේදී කියන්නට ඕනෑ. ගරු කථානායකතුමනි, සොහොන් වල ගෙවල් හදන්නෙ යකුන්ට බයේ නොවෙයි. මේ කාලය තුළ සිරිමාවෝ බණ්ඩාරනායක රජය ඉදිරියට ගමන් කර තිබෙන්නෙත් මේවාට භයේ නොවෙයි. භය නම් අපි මේවා අත්හැර යන්න ඕනෑ. ඒ නිසා තමයි, බ්‍රිතාන්‍ය පත්‍ර වාර්තාකරුවකු කියා තිබෙන්නේ අපේ සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය ඉතාමත් එඩිතර තද ගැහැණියක්ය කියා. ඒක ඇත්ත. තද ගතිය පෙන්වන්න ඕනෑ. ඉස්සරහට තැබූ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අඩිය පස්සට ගැනීමට අප සූදානම් වන්නෙ නැහැ. ඔය එක්කෙනෙක් දෙන්නෙක් මේ පැත්තට බඩ ගාන්න පුළුවන්. ඒ වාගේම තවත් කීප දෙනෙක් මේ පැත්තට එන්න පුළුවන්.

සභාග රජය පිහිටුවූවාට පසුව දෙහිඹිවිටදී ගරු අගමැතිණිය කළ වැදගත් ප්‍රකාශයක් මා මේ අවස්ථාවේදී මතක් කරන්නට සතුටුයි. මේ ලංකාවේ අද කඳවුරු දෙකක් තිබෙනවා, පෑගෙන්නන්ගේ කඳවුරය, පාගන්නන්ගේ කඳවුරය කියා. පෑගනේනන්ගේ කඳවුරේත්, පෑගී සිටින අයගේ කඳවුරේත්, ධනවාදයට විරුද්ධ කඳවුරේත්, සමාජවාදී කඳවුරේත් එකම නායිකාව මේ ගරු සිරිමාවෝ බණ්ඩාරනායක අගමැතිනියය කියා මා ඉමහත් ප්‍රීතියෙන් මේ ගරු සභාවේ ප්‍රකාශ කරන්නට ඕනෑ. ප්‍රතිගාමී කඳවුරේ නායකයා කව්ද? ඩඩ්ලි සේනානායක මැතිතුමායි. අවිස්සාවේල්ලේ ගරු මන්ත්‍රීතුමාත්, වැලිමඩ ගරු මන්ත්‍රීතුමාත් තමන්ගේ සහාය කරුවන් කරගෙන, ඒ කඳවුර තර කරගන්නට අද ඔහුට පුළුවන් වී තිබෙනව. එක කාරණයක් ගැන මා කියන්නට ඕනෑ. සටන තියෙන්නෙ මේ රටේ සිටින අගමැතිත් සෙවණැලි අගමැතිත් අතරයි— the living Prime Minister and the shadow Prime Minister— මේ සටන තිබෙන අතර වෙන කෙනෙකු අගමැතිකම බලාපොරොත්තු වෙනවා නම් ඒ බොරැල්ලේ "ටිප්ටොප්" කාරයා වැනි අගමැති කෙනෙක් තමයි. ගරු කථානායකතුමනි, බොරැල්ලෙ "ටිප්ටොප්' කාරයා දැක තිබෙනවාද කියා මා දන්නෙ නැහැ. "මම තමයි, අගමැති, මම තමයි දියසේන" කියා ඒ " ටිප්ටොප් " කාරය කියනව. එබඳු "ටිප්ටොප්" අගමැති කෙනෙකු මේ සභා ගර්භය තුළත් සිටිනවා නම් මා ඔහුට කියන්නට සතුටුයි, රටේ ජනතාව පිල් දෙකකට බෙදී ගෙන යන සටනකදී එවැනි "ටිප්ටොප්" අගමැතිවරයකු ඇති නොවන බව.

අද කඳවුරු හරියාකාර බෙදී ගෙන එනව. අගමැතිනියගේ දෙහිඹිවිට කථාවෙන් එය ස්ථිර වී තිබෙනව. මේ පැත්තෙන් දෙන්නෙක් යන විට අනික් පැත්තෙන් විලියම් සිල්වා, ප්‍රින්ස් ගුණසේකර තව තව අය එනව. ආර්. ජී. සේනානායක මන්ත්‍රීතුමා පවා අද සභා ගර්භයෙන් නැගිට යන්න සූදානම් වුණේ නැහැ. ඒ නිසා මා දීර්ඝ වශයෙන් කථා කරන්නට අදහස් කරන්නෙ නැහැ. විශේෂයෙන්ම ප්‍රගතිශීලී බල වේගයන් බෙදී සිටින මේ අවස්ථාවේදී මා එක් කාරණයක් මතක් කරන්ට සතුටුයි. සෑම අවස්ථාවකදීම අපේ ප්‍රගතිශීලී ගමනට ආධාර දුන් ලංකා කොමියුනිස්ට් පක්ෂයට රජයේ ස්තුතිය මා මේ අවස්ථාවේදී පුද කරනවා. ලංකා කොමියුනිස්ට් පක්ෂය පත්‍ර පනතෙදීත් අප සමගයි. 1956 දී බණ්ඩාරනායක මැතිතුමා ආණ්ඩුව පිහිටෙව් දා සිට ලංකා කොමියුනිස්ට් පක්ෂය මේ රටේ ප්‍රගතිශීලී ඉදිරිගමනට ආධාර කළා. කොමියුනිස්ට් පක්ෂයට ස්තුතිවන්ත වන අතරම, පසුගිය 11 වැනිදා පවත්වන ලද එක්සත් ජාතික පක්ෂයේ සභාග රැස්වීමට විරුද්ධව රැස්වීමක් හා පෙළපාළියක් පවත්වා සිරිමා බණ්ඩාරනායක රජයට අනුකූලතාව දැක්වූ වෘත්තීය සමිතිවලටත් අප ස්තුතිවන්ත වෙනවා. ඒ වෘත්තීය සමිති දෙන සහයෝගය ප්‍රගතිය කරා ගමන් කිරීම පිණිස දෙන සහයෝගයක් බව, සිරිමා බණ්ඩාරනායක රජයට මේ රටේ පොදු ජන යුගයක් බිහි කිරීම සඳහා දෙන සහයෝගයක් බව, අප දන්නා නිසා ඇත්තෙන්ම අප ඒ අයට කෘතඥ වෙනවා.

මේ සමගම කිව යුතු කාරණයක් තිබෙනවා. විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා යුද්ධ හමුදාවට නොයෙකුත් නියෝග දෙන්නට ලෑස්තිව ඉන්න බව පේනවා. නමුත් අප ඒවාට භය නැහැ. දැන් මේ රටේ තිබෙන්නේ ජාතික යුද්ධ හමුදවක් බව කියන්නට කැමතියි. පෙරළිකාර විජාතික යුද්ධ හමුදාව දැන් ශුද්ධ කරල ඉවරයි. එම නිසා මේ රට කළහකාරී තත්ත්වයකට පරිවර්තනය කරන්නට, ප්‍රජාතන්ත්‍රවාදය නැති කර අයුතු මාර්ගවලින් ජන සම්මත රජයක් පෙරළන්නට හදන අයට ඒ හමුදාව ඉඩ දෙන එකක් නැහැ. හිරභාරයට ගන්නලු. නමුත් හිරගේ ළඟට ආවත් ගන්න එකක් නැහැ. මේ විධියට මේ අය වීරයන් වන්නට හදනවා. නමුත් අප මුළු ජන සම්මත බලය යොදවා මේ රටේ පොදු මහජනයාගේ ජයග්‍රහණය 1956 දී බණ්ඩාරනායක මැතිතුමා ඇරඹූ ව්‍යාපාරය රැක ගන්නා බව මතක් කරන ගමන්ම ශාස්ති. නසාර්. සුකර්ණෝ. බෙන්බෙලා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ස්ටැන්ලි තිලකරත්න මයා.]

සිරිමා බණ්ඩාරනායක යනාදී මධ්‍යස්ථ නායකයන් ලෝකයට සාමයේ මාවත පෙන්වන මේ අවස්ථාවේදී, බලගතු කඳ වුරුවලින් වෙන්ව නිදහස් ලෝකයක් ගොඩ නංවන අවස්ථාවේදී, සිරිමා බණ්ඩාර නායක රජය බෞද්ධ ජනතාවගේත්, වැඩ කරන ජනතාවගේත් යහපත තකා වැඩ කරන අවස්ථාවේදී, මගේත් අගමැතිනිය වූ—මම කියනව මගේත් අගමැතිනිය කියල—අපේ අගමැතිනිය විසින් මේ රාජාසන කථාව පිළිබඳ ස්තුති යෝජනාව සපිර කිරීමට මට පැවරීම ගැන එතුමියට අවංක වම ස්තුතිවන්ත වෙමින්ද, මෙම යෝජනාව ඉදිරිපත් කළ නුවරඑළියේ ගරු මන්ත්‍රීතුමාට ස්තුති කරමින්ද, ලකිසුරු තුමාටත්, අපේ අගමැතිනියටත්, කථානායකතුමාටත් මේ ගරු සභාවේ සිටින සියලුම දෙනාටත් සිරිමා බණ්ඩාරනායක රජය යටතේ වාසනාවන්ත ජීවිත ගත කිරීමට හේතු වාසනා වේවායි ප්‍රාර්ථනා කරමින් ද මගේ කථාව අවසන් කරනවා.

**ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.**

வினா எடுத்தியம்பப்பெற்றது.

*Question proposed.*

**මතු පළවන යෝජනාව සභාසම්මත විය :**

"විවාදය දැන් කල් තැබිය යුතුය."—[ගරු ද සොයිසා සිරිවර්ධන].

**ඊට අනුකූලව විවාදය කල් තබන ලදී. එතැන් සිට විවාදය 1964 නොවැම්බර් 26 වන බ්‍රහස්පතින්ද පවත්වනු ලැබේ.**

அதன்படி விவாதம் ஒத்திவைக்கப்பெற்றது. விவாதம், 1964, நவம்பர் 26, வியாழக்கிழமை ஆரம்பமாகும்.

*Debate to be resumed on Thursday, 26th November 1964.*

**කථානායකතුමා**

*(சபாநாயகர்)*

(Mr. Speaker)

Any amendments to the Address of Thanks should be received by the Clerk by 12 noon on Monday, 23rd November, 1964.



## කල් තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**යෝජනාව ඉදිරිපත් කරන ලදින් ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදි :**

"මන්ත්‍රී මණ්ඩලය දැන් කල් තැබිය යුතුය."—[ගරු ද සොයිසා සිරිවර්ධන].

"சபை இப்பொழுது ஒத்திவைக்கப்பெறுமாக" எனும் பிரேரணை பிரேரிக்கப்பட்டு, வினா எடுத்தியம்பப்பெற்றது [கௌரவ டி சொய்சா சிறிவர்த்தன].

*Motion made, and Question proposed,* "That the House do now adjourn".—[Hon. de Zoysa Siriwardene].

අ. භා. 4.25

**කේ. එම්. පී. රාජරත්න මයා.** (වැලිමඩ)

*(திரு. கே. எம். பீ. ராஜரத்ன—வெலிமடை)*

(Mr. K. M. P. Rajaratna—Welimada)

ගරු කථානායකතුමනි, මට ප්‍රශ්න දෙකක් අසන්නට තිබෙනවා. පළමුවැනි ප්‍රශ්නය අසන්නට තිබෙන්නේ ආරක්ෂක කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම් තුමාගෙනුයි. පුවත්පත් පනතට විරුද්ධ තුමාගෙනුයි. පුවත්පත් පනතට විරුඬවත් රා වරමට විරුද්ධවත් දැනට මාස වහන්සේ පිරිසකුත්, බෞද්ධ ගිහි පිං වතුන් පිරිසකුත් කතරගම දක්වා පෙරහැර කින් ගමන් කරද්දී දාමරික පිරිසක් විසින් තලල්ලේදී ඒ පෙරහැරට ගල්මුල් වලින් පහර දෙන්නට යෙදුණා, අඩන් තේට්ටම් කරන්නට යෙදුණා. එම පෙර හැරේ ගමන් ගත් රථවාහනවල තිබුණු බෞද්ධ කොඩි ගලවා දමා, ඒවා පාගා දමා, නින්දා අපහාස වන අන්දමට ඒ මහා සංඝ රත්නයට පරිභව කර නොයෙකුත් අඩන්තේට්ටම් කරන්ට යෙදුණ. ඒ බව එම පෙරහැරේ කරදර වින්ද ස්වාමීන් වහන්සේලාත්, ගිහියෝත් දික්වැල්ලේ පොලීසියට දැනුම් දුන්න. ඊට ටික දිනකට පසු, එදා ඒ අන්දමට අඩන්තේට්ටම් විඳ ගුටි කෑ, ගල් පහරවලින් තුවාල ලැබූ භික්ෂූන් වහන්සේලාට දින ගණනාවක් රෝහල්වල නැවතී ප්‍රතිකාර ගන්නට සිදු වුණා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඒ ගමනෙදිම රෝහල්වලට නොගියත්, තමන් බලාපොරොත්තු වුණු කර්තව්‍යය ඉටු වුණාට පසු අර අන්දමට තුවාල ලැබූ භික්ෂූන් වහන්සේලා රෝහල්වල සිටියා. ඒ ගැන පරීක්ෂණයක් කරනවා වෙනුවට ටික දිනකට පසු—මා සිතනව, එම අවස්ථාවෙ රාජ්‍යාරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමතිගෙ පාර්ලිමේන්තු ලේකම් තුමා ලංකාවෙ සිටියෙ නැත කියා—ආණ්ඩුවෙන් පත්‍රවලට නිවේදනයක් නිකුත් කර තිබුණ, "ඒ අන්දමට බෞද්ධ කොඩියක් ගලවා පෑගුවේ නැත, ස්පිරිතාලයෙ කවුරු වත් හිටියෙ නැත, භික්ෂූන් වහන්සේලාට ගැසුවාය කියා ප්‍රකාශයක් කළේ නැත; කෙටියෙන් කියනව නම් එවැනි සිද්ධියක් වුණේ නැත" කියා. නමුත් ඊට පසු එම භික්ෂූන් වහන්සේලාගේ සහ බෞද්ධ මහජනයාගේ උද්ඝෝෂණය නිසා උප පොලිස්පතිවරයා අම්බලංගොඩට ගිය අවස්ථාවේදී ගුටි බැට කෑ භික්ෂූන් වහන්සේලා නැවත වතාවක් ඇවිත් පළාත භාර පොලිස්පතිවරයාට කරුණු ප්‍රකාශ කර තිබෙනව. තමන් ලැබූ තුවාල පෙන්වා තිබෙනව.

එම සිද්ධිය වුණු අවස්ථාවෙදි භික්ෂූන් වහන්සේලාට වෙඩි තියන්න තුවක්කුවක් එල්ල කළාය කියා චෝදනාවක් තියෙනව. ඒ විධියෙ කරුණු ගණනාවක් පැහැදිලි කර දී තිබෙනව. එම සිද්ධිය පිළිබඳව ඊට පසු කුමක් සිදු වුණාද කියන්න දන්නෙ නැහැ.

**එකල්හි වේලාව අ. භා. 4.30 වූයෙන්, ප්‍රශ්නය නොවිමසන ලදුව මන්ත්‍රී මණ්ඩලය කල් තැබීමේ යෝජනාව අහෝසි විය.**

**යෝජනාව යළිත් ඉදිරිපත් කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී :**

"මන්ත්‍රී මණ්ඩලය දැන් කල් තැබිය යුතුය."—[ගරු ද සොයිසා සිරිවර්ධන.]

*பி. ப. 4.30 மணியாகிவிடவே, சபையின் ஒத்திவைப் பிற்கான பிரேரணை, வினா விடுக்கப்படாமலே காலாவதி யாயிற்று.*

*பிரேரணை பிரேரிக்கப்பட்டு வினா மீண்டும் எடுத் தியம்பப்பெற்றது.*

"சபை இப்பொழுது ஒத்திவைக்கப்பெறுமாக"—[கௌரவ டி சொய்சா சிறிவர்த்தன.]

*It being 4.30 p.m., the Motion for the adjournment of the House lapsed without Question put.*

*Motion made and Question again proposed.*

'That this House do now adjourn."—[Hon. de Zoysa Siriwardena.]

**කේ. එම්. පී. රාජරත්න මයා.**

*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*

(Mr. K. M. P. Rajaratna)

ඊට පසු මෙම සිද්ධිය ගැන යම් කිසි පරීක්ෂණයක් පැවැත්තුවාද දන්නෙ නැහැ. මෙසේ අඩන්තේට්ටම් කළ දාමරික පිරිස අල්ලාගෙන දඬුවම් දීම සඳහා වැඩ පිළිවෙළක් යෙදුවදා නැද්ද යන්න අප කවුරුත් දන්නෙ නැහැ.

පාරේ ගමන් කරන්න නිදහස මේ රටේ තියෙන්න ඕනෑ. බුඩාගමට යෝග්‍ය නැත දෙනවාය කියා මේ ආණ්ඩුව කියනවා. එසේ යෝග්‍ය නැත දෙනවාය කියන්නෙ මහා සංඝ රත්නයට ගල් ගැසීමද? යෝග්‍ය නැත දෙනවාය කියන්නෙ, මහා සංඝ රත්නයට නින්දා අපහාස ලැබෙන තාල යට පරිභව කරන එකද? මෙය කර තිබෙන්නෙ ආණ්ඩුව විසින්ය කියා බෞද්ධ ජනතාවගෙ සැකයක් තියෙනව. එසේ කළ නිසයි, ආණ්ඩුව නිශ්ශබ්දව සිටින්නෙ. අහිංසකව පාරේ ගමන් ගත් භික්ෂූන් වහන්සේලා පිරිසකට විශේෂ යෙන් තුවක්කුවකුත් එල්ල කොට වෙඩි තියන්න තැත් කළ අවස්ථාවක, දාමරික වැඩක් කරන්න සූදානම් වුණු අවස්ථාවක —දැන් මෙම සිද්ධිය වෙලා මාසයකට කිට්ටුයි—පොලීසිය මාර්ගයෙන් නිසි අන්දමේ වැඩ පිළිවෙළක් ගන්න මේ ආණ්ඩුවට බැරි වුණා. එම ප්‍රදේශයට ගොස් මේ සම්බන්ධයෙන් ඉතා පුළුල්, ප්‍රසිද්ධ පරීක්ෂණයක් පවත්වනවාද කියා රාජ්‍යා රක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ගරු ඇමතිගෙ පාර්ලිමේන්තු ලේකම්තුමාගෙන් දැන ගන්න කැමතියි. ඒ ආකාරයට ගුටි බැට කෑ, නින්දා අපහාස වින්ද ස්වාමීන් වහන්සේලා එම කරුණු ඉදිරිපත් කරන්න නැවත වතාවක් ඉදිරිපත් වෙන්න කැමතියි. එම නිසා මේ කරුණු ගැන විධිමත් පරීක්ෂණයක් පවත්වා මෙසේ අශීලාචාර වැඩ කළ එම දුෂ්ට දුර් දාන්ත දාමරික පිරිස නීතියේ රැහැනට අඩංගු කරන්න වැඩ කටයුතු කරනවද, නැද්ද කියා රාජ්‍යාරක්ෂක හා විදේශ කට යුතු පිළිබඳ ගරු ඇමතිගෙ පාර්ලිමේන්තු ලේකම්තුමාගෙන් මා ප්‍රශ්න කරනව.

ඊ ළඟට ගරු ඉඩම් ඇමතිතුමාගෙන් ප්‍රශ්නයක් අහන්න තියෙනව. සිංහලයන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කල් තැබීම

[කේ. එම්. පි. රාජරත්න මයා.]

වතුවල වැඩට පුහුණු කරවීම පිණිස නුවර එළිය දිස්ත්‍රික්කයේ තිබෙන එස්. තොන්ඩමන් මහත්මයට අයිති වැවන්ඩන් වත්ත රජයට ගෙන එම වත්තේ මධ්‍යස්ථානයක් ඇති කළ යුතුය කියා යෝජනාවක් තිබුනා. මේ අනුව නුවර එළියේ කච්චේරියෙනුත් මහනුවර කච්චේරියෙනුත් වාර්තා ඉදිරිපත් කර තිබෙනව, මේ කටයුත්තට ඉතාම සුදුසු වත්ත මේ වත්තය කියා. එසේ තිබියදී ඒ යෝජනාව ඉවත් කර ගරු අගමැතිනියට වුවමනා හැටියට—ගරු අගමැතිනියගේ උපදෙස් පරිදි—ඩොනල්ඩ් රණවීර මහත්මයට අයිති මස්කෙළිය ප්‍රදේශයේ තිබෙන වත්තක් රජයට ගැනීමට දැන් වැඩ කට යුතු කරගෙන යනවලු.

ගරු කථානායකතුමනි, ඩොනල්ඩ් රණවීර මහත්මය එක වතාවක් එක්සත් ජාතික පක්ෂයේ අපේක්ෂකයකු වශයෙන් මස්කෙළිය ආසනයට ඉදිරිපත් වූ කෙනකු බව කව්රුත් දන්නව. මේ විධියට ඒ මහත්මයාගෙ වත්ත ගැනීමෙ ඇති සාධාරණකම කුමක්ද කියා මම දැන ගැනීමට කැමතියි. ඇයි ඩොනල්ඩ් රණවීර මහත්මයාගෙ වත්ත ගන්න යන්නෙ? ඔහු තමාගෙ දේශපාලන විරුඬකාරයකු නිසදා? ඒ මහත්මයා මේ රටේ පාරම්පරික පුරවැසියෙක්; සිංහලයෙක්. මේ ආණ්ඩුවේ ප්‍රතිපත්තිය මේ රටේ පාරම්පරික පුරවැසියනට අයිති වී තිබෙන ආයතන සියල්ලක්ම ආණ්ඩුවට ගෙන ඒවා විනාශ කර දමා විදේශිකයන්ට අයිතිව තිබෙන හැම දෙයක්ම සදාකාලිකවම ඒ විධියට තිබෙන්නට ඉඩ හැරීමද? විදේශිකයන්ගේ වස්තු ආරක්ෂා කරමින් සිංහලයන්ගේ—පාරම්පරික පුරවැසියන්ගේ—වස්තු ආණ්ඩුවට ගැනීමද මේ ආණ්ඩුවේ ප්‍රතිපත්තිය. කියා මම අහන්න කැමතියි. ඩොනල්ඩ් රණවීර මහත්මයාගේ වත්ත ගන්න තියෙන හේතුව මොකක්ද? මේ සඳහා සුදුසුම වත්ත තොන්ඩමන් මහත්මයට අයිති වැවන්ඩන් වත්තය කියා ඒ අමාත්‍යාංශයට වාර්තා එවා තිබෙනව. තොන්ඩමන් මහත්මයට දේශපාලන අල්ලසක් දීමක් හැටියට—තොන්ඩමන් මහත්මයට පිට යන්න නොදී තමා ළඟම රඳවා ගැනීමේ අදහසින්—තොන්ඩමන් මහත්මයගෙ වත්ත අත්හැරල ඩොනල්ඩ් රණවීර මහත්මයට අයිති වත්ත අරගෙන ඒ මහත්මයට පහර ගහන්නද මේ ආණ්ඩුව උත්සාහ කරන්නෙ?

මේ ආණ්ඩුවේ ප්‍රතිපත්තිය ලාංකිකයන්ට—සිංහලයන්ට—අයිති දේ නැති කිරීමටයි. දැන් සිංහලයන්ට අයිති ලේක් හවුස් ආයතනය ආණ්ඩුවට ගන්න යනව. විදේශිකයන්ට අයිති ආයතන ගණනාවක්ම තියෙනව. මුදල් ඇමතිතුමා එංගලන්තයේ ආණ්ඩුවටත් අධිරාජ්‍යවාදී වෙළඳ ව්‍යාපාරිකයන්ටත් ප්‍රතිඥා දෙනව, ඔවුන්ගේ අයිතිවාසිකම් එකකටවත් පහර ගසන්නේ නැත කියා. අධිරාජ්‍යවාදී අයිතිවාසිකම් ආරක්ෂා කරනවය කියා මුදල් ඇමතිතුමා ලන්ඩන් නුවරදී කියා තිබෙනවා. තරඟ වෙන්න එපාය, විනිමය අමාරු නිසා සුළු වශයෙන් යම් යම් දේ කරන්නට අපට සිදු වුණාය, හෙට අනිද්දා ඒකත් ඉවත් කරනවය කියා මුදල් ඇමතිතුමා සුද්දන්ට ප්‍රතිඥා දෙනව. ලංකාවේ ආණ්ඩුව කරන්නේ මොකක්ද? සිංහලයකුට අයිති යම් කිසි ආයතනයක් තියෙනව නම් ඒ ආයතනය තමයි රජයේ පරම හතුරා හැටියට සලකන්නෙ. ලේක්හවුස් ආයතනය හෝ වේවා, ඩොනල්ඩ් රණවීර මහත්මයට අයිති වත්ත හෝ වේවා, වෙනත් දෙයක් හෝ වේවා, සිංහලයාට අයිතිව තිබීම තමයි, මේ ආණ්ඩුවට පෙනෙන්නට බැරි දේ. එය විනාශ කර කාබාසිනියා කර දැම්මටයි, මේ ආණ්ඩුව උත්සාහ කරන්නෙ. ඒ අතර ඉන්දියානු ජාතිකයා හෝ වේවා, අධිරාජ්‍යවාදී සුද්දා හෝ වේවා, අමෙරිකානුවා හෝ වේවා, මේ රටේ ධනය සූරා කා කෙතරම් ධනස්කන්ධයක් පිටරට ගෙන ගියත් ඔවුන්ට විරුද්ධව කිසිම දෙයක් කරන්නෙ නැහැ. ඔවුන්ට වැඳුම් පිදුම් කරමින්, ඔවුන්ගේ පය ලෙව කමින්, ඔවුන්ගේ සුවච කීකරු ගෝලයන් හැටියට මේ ආණ්ඩුව වැඩ කටයුතු කරනව. ඒ නිසා ඩොනල්ඩ් රණවීර මහත්මයාගේ මේ වත්ත රජයට පවරා ගැනීමේ යෝජනාව වහාම අත්හරිනවද නැද්ද කියා මම ගරු ඇමතිතුමාගෙන් දැන ගන්න කැමතියි. ඒ යෝජනාව අතහැරිය යුතුයි. එසේ නොකළොත් ලොකු කරදරයකට මුහුණ පාන්නට සිද්ධ වන බව මම ඉඩම් ඇමතිතුමාට කියන්න කැමතියි. මේ රටේ විදේශික ව්‍යාපාර තිබෙන තුරු, අධිරාජ්‍යවාදී සුද්දන්ගේ හෝ ඉන්දියානුකාරයින්ගේ හෝ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ව්‍යාපාර මේ රටේ තිබෙන තුරු, මේ රටේ පාරම්පරික සිංහලයින්ට අයත් ව්‍යාපාර ගැනීමට අපි ඉඩ නොදෙන බව මේ අවස්ථා වේදී ප්‍රකාශ කරන්න කැමතියි. ඒ නිසා ඩොනල්ඩ් රණවීර මහත්මයා සතු ව්‍යාපාරය ගන්නේ නැතිව, වැවන්ඩන් වත්ත ගැනීමට වැඩ කටයුතු යොදනවාද කියා මම දැනගන්න කැමතියි.

අ. භා. 4.38

**රාසමාණික්කම් මයා.**
*(திரு. இராசமாணிக்கம்)*
(Mr. Rasamanickam)

I have a question to be addressed to the Minister of Industries, but, unfortunately, he is not here. There is a great shortage of cement in the country. The price of cement is so high in the market that even by paying Rs. 10 more than the normal price of a bag—the price of cement obtained through the normal channels—one cannot obtain cement. I believe this shortage is due to the restrictions that have been placed on the import of cement by the Government. As the local supply is inadequate the market price has gone up considerably.

Something has to be done by the Government to solve this problem as not only are house builders and contractors inconvenienced but even government work is being held up by this shortage of cement. Construction work generally in this country is going at a snail's pace. The "black-market" price of cement is Rs. 10 or Rs. 12 a bag higher than the price fixed by the Cement Corporation. Unless something is done to save the situation, I am afraid quite a lot of private construction work and even government work will be held up. I hope the Minister of Industries will look into this matter and see that something is done to remedy the situation.

Even where cement quotas are given to co-operative unions and the C. W. E., the actual supply of cement is much less than what is allocated to them monthly on paper. What is allocated is a fictitious paper figure and the full quota is never given in practice. I want the Hon. the Minister to go into this question seriously and see whether something could be done to relieve the situation.

I wish to bring another matter to the notice of the Hon. Minister of Food. It is with regard to the shortage of onions in the Batticaloa District. I am told that there is a shortage even in Colombo. I believe the price in Colombo is about 80 cents a pound ; in places like Batticaloa it is as much as Re. 1 a pound.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

A fine chance to grow onions !

**ඩී. පී. ආර්. ගුණවර්ධන මයා.** (අවිස්සාවේල්ල)
*(திரு. டீ. பீ. ஆர். குணவர்தன—அவிசாவலை)*
(Mr. D. P. R. Gunawardena — Avissawella)

Like growing *bathala* at Ratmalana !

**රාසමාණික්කම් මයා.**
*(திரு. இராசமாணிக்கம்)*
(Mr. Rasamanickam)

I would like the Hon. Minister to see that some supplies are rushed to the outstations.

අ. භා. 4.42

**ඩී. පී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பீ. ஆர். குணவர்தன)*
(Mr. D. P. R. Gunawardena)

ගරු කථානායකතුමනි, ඉඩම්, වාරිමාර්ග හා විදුලි බලය පිළිබඳ ගරු ඇමතිතුමා ගෙන් ප්‍රශ්නයක් අහන්න තිබෙනවා. අවිස්සාවේල්ල නගරය දියුණු කිරීම සඳහා ආණ්ඩුවට අයත් ඉඩම් කීපයක් නගරයට අවශ්‍ය වී තිබෙනවා. ඒ පිළිබඳව නගර සභාවේ සභාපතිතුමා කීප වරක්ම ඉඩම් කොමසාරිස්තුමාට දන්වා තිබෙනවා. පළාත් පාලන කොමසාරිස්වරයාත් ඒ ඉඩම් නගර සභාවට පවරා දීම යුතුයයි කියා තිබෙනවා. ඒ අනුව බස්නාහිර පළාතේ දිසාපතිතුමා නිර්දේශ කර තිබෙනවා, ඉක්ම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩී. පී. ආර්. ගුණවර්ධන මයා.]

නිත්ම එය දිය යුතුය කියා. මාත් බස්නාහිර පළාතේ දිසාපතිතුමාට මේ පිළිබඳව කීප වරක්ම මතක් කළා. මට ආරංචි හැටියට මේ කඩදාසි සියල්ලක්ම දැන් ඇමති කාර්යාලයේ ගොඩ ගැසී තිබෙනවා. ඇමතිතුමා ඒවා අත්සන් කර දෙන්නේ නැත කියා අවිස්සාවේල්ල නගරයේ කීප දෙනකු ගෙන්ම මට අසන්න ලැබුණා. මේ පිළිබඳව යම් අතපසුවීමක් තිබෙනවා නම් කරුණා කර ඒ කඩදාසි ගෙන්වා ඒ නගරය දියුණු කිරීමට බාධා නොකර ඉක්මනින්ම අත්සන් කර දෙන මෙන් මම ඉල්ලා සිටිනවා.

අ. භා. 4.43

**ගරු එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක (කෘෂිකර්ම, ආහාර හා ධීවර කටයුතු පිළිබඳ ඇමති සහ රාජ්‍යාරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)**

*(கௌரவ எப். ஆர். டயஸ் பண்டாரநாயக்க—விவசாய, உணவு, கடற்றொழில் அமைச்சரும் பாதுகாப்பு, வெளிவிவகார அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசியும்)*

(The Hon. F. R. Dias Bandaranaike—Minister of Agriculture, Food and Fisheries and Parliamentary Secretary to the Minister of Defence and External Affairs)

Two matters have been raised by two hon. Members to which I should like to give replies. The first one was by the hon. Member for Welimada (Mr. K. M. P. Rajaratna) and I am afraid it is a question of which notice should have been given in order to be able to give a complete and effective answer. I, therefore, wish to say that I will take this opportunity to go into the facts of the case and make a complete statement on a subsequent Adjournment Motion on the matter.

The Hon. Leader of the House tells me that the incident refers to one that took place at a time when I was out of the Island during the period of the Cairo Conference and negotiations with India on the Indo-Ceylon Pact. In the circumstances, the Hon. Leader of the House tells me, he made a statement in the form of a communique relating to the incident on the material which had been made available at that time and according to the information he had then no one had been admitted to hospital in connection with that incident. I shall, however, go into the matter more fully because the hon. Member for Welimada has stated that the facts were not correct. [*Interruption*]. I, therefore, propose, as stated earlier, to go into the matter fully and to make a statement on a subsequent Adjournment Motion.

Then the hon. Member for Paddiruppu (Mr. S. M. Rasamanickam) raised the question relating to the present shortage of Bombay onions. He is quite right in stating that there is, at the present moment, a distinct shortage of Bombay onions in this country and also of red onions arising as a consequence of a shortage of Bombay onions. In other words, these two items are in short supply. I suppose, to some extent, the supply and demand factors depend upon the availability of both these items, so naturally when one item is in acute short supply there is a run on the other variety and to that extent, therefore, it is correct. The reason for the shortage itself, I should like to indicate to the hon. Members is due to a failure of the crop in South India which is our traditional source of supply at this time of the year.

Immediate and urgent action has been taken by the Food Department and the C. W. E. to ensure an alternative source of supply being had in order to obtain the necessary supplies of Bombay onions in the shortest possible time and I expect, according to my estimation, that either by about the first ten days or the first two weeks of December to see that the problem of the short supply is completely resolved according to the arrangements already made. Meanwhile, action has been taken through the Food Department, on any information received that stocks of Bombay onions are being hoarded by any traders, to requisition such stocks immediately and to make them available to the general public for distribution through the C. W. E. As it happens, while these instructions

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

have gone out and adjustments have been made by means of Price Control Orders to ensure that the problem of short supply as a whole will not continue, I am sorry to inform the House that this position will go on for a few days longer and I must ask the hon. Members to bear with me and bring to my notice any case of actual hoarding by traders that they are aware of so that appropriate action may be taken through the Food Department by exercising the powers given to me under the Food Control Ordinance.

අ. භා. 4.47

ගරු සී. පී.ද සිල්වා
(கௌரவ சி. பி. டி சில்வா)
(The Hon. C. P. de Silva)

I am not aware of the acquisition of Wavendon estate or Maskeliya estate. In fact, when the hon. Member spoke to me I said that I was not aware of it. However, about the question of estates changing hands I wish to tell him that the necessary action will be taken in regard to that. I have already submitted a Cabinet paper recommending the acquisition of certain high grown tea estates. A number of them seems to have changed hands recently and I have recommended that they be acquired so that they may be run as plantations for training Ceylonese in estate work in that part of the country.

About Maskeliya Estate, I do not know the facts about it. I only heard it may be acquired by the Inland Revenue Department for reasons of their own.

ඩී. පී. ආර්. ගුණවර්ධන මයා.
(திரு. டீ. பி. ஆர். குணவர்தன)
(Mr. D. P. R. Gunawardena)

Is it true that the Government is unwilling to acquire Mr. Thondaman's estates ?

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சி. பி. டி சில்வா)
(The Hon. C. P. de Silva)

As far as I am concerned, I do not know anything about that.

කේ. එම්. පී. රාජරත්න මයා.
(திரு. கே. எம். பீ. ராஜரத்ன)
(Mr. K. M. P. Rajaratna)

මට එන්ට පුළුවනි. අවොත් මට කඩදාසි —ලිපිගොනු—පෙන්වනවද ?

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சி. பி. டி சில்வா)
(The Hon. C. P. de Silva)

එන්න.

කේ. එම්. පී. රාජරත්න මයා.
(திரு. கே. எம். பீ. ராஜரத்ன)
(Mr. K. M. P. Rajaratna)

මට එන්ට පුළුවනි. ආවම ලිපි ගොනු පෙන්වනවය කියල මට පොරොන්දු වෙනවද ?

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சி. பி. டி சில்வா)
(The Hon. C. P. de Silva)

ඉස්සර වෙලා මම කඩදාසි බලන්න ඕනෑ.

කේ. එම්. පී. රාජරත්න මයා.
(திரு. கே. எம். பீ. ராஜரத்ன)
(Mr. K. M. P. Rajaratna)

මට කඩදාසි පෙන්වන්න පුළුවන්ද කිය ලයි මම ඇහැව්වෙ.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சி. பி. டி சில்வா)
(The Hon. C. P. de Silva)

කොහොමද කියන්නෙ ? කඩදාසි බලාල කියන්නම්.

කේ. එම්. පී. රාජරත්න මයා.
(திரு. கே. எம். பீ. ராஜரத்ன)
(Mr. K. M. P. Rajaratna)

සිංහලයා මරන්න.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු සී. පී. ද සිල්වා

*(கௌரவ சி. பீ. டி சில்வா)*

(The Hon. C. P. de Silva)

In regard to the Question raised by the hon. Member for Avissawella (Mr. D. P. R. Gunawardena) I am not aware of what has been mentioned, but I shall look into the papers.

In regard to the question raised by the hon. Member for Paddiruppu (Mr. Rasamanickam) about cement, I shall bring it to the notice of the Minister of Industries.

**ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.**

*வினா விடுக்கப்பெற்று ஏற்றுக்கொள்ளப்பட்டது.*

***Question put, and agreed to.***

**මන්ත්‍රී මණ්ඩලය ඊට අනුකූලව අ. භා. 4.50ට අද දින සභාසම්මතිය අනුව, 1964 නොවැම්බර් 26 වන බ්‍රහස්පතින්ද අ. භා. 2 වන තෙක් කල් ගියේ ය.**

*அதன்படி சபை, அதனது இன்றைய தீர்மானத்துக்கிணங்க, பி. ப. 4.50 மணிக்கு 1964 நவம்பர் 26 ஆம் தேதி வியாழக்கிழமை பி. ப. 2 மணிவரை ஒத்திவைக்கப்பெற்றது.*

*Adjourned accordingly at 4.50 p.m. until 2 p.m. on Thursday, 26th November 1964, pursuant to the Resolution of the House this Day.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දායක මුදල් : මුදල් ගෙවන දිනෙන් පසුව ඇරඹෙන මාසයේ සිට මාස 12ක් සඳහා රු. 32.00යි. අශෝධිත පිටපත් සඳහා නම් රු. 35.00යි. මාස 6කට ගාස්තුවෙන් අඩකි. පිටපතක් ශත 30යි. තැපෑලෙන් ශත 45යි. මුදල්, කොළඹ, ගාලු මුවදොර මහ ලේකම් කාර්යාලයේ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කලින් එවිය යුතුය.

சந்தா பணம் கொடுத்த தேதியை யடுத்துவரும் மாதம தொடக்கம் 12 மாதத்துக்கு ரூபா 32.00 (திருத்தப்படாத பிரதிகள் ரூபா 35.00). 6 மாதத்துக்கு அரைக்கட்டணம் | தனிப்பிரதி சதம் 30. தபால்மூலம் 45 சதம். முற்பணமாக அரசாங்க வெளியீட்டு அலுவலக அத்தியட்சரிடம் (த. பெ. 500, அரசாங்க கருமகம், கொழும்பு 1) செலுத்தலாம்

**Subscriptions : 12 months commencing from month following date of payment Rs. 32.00 (uncorrected copies Rs. 35.00) Half rates for 6 months. Each part 30 cents, by post 45 cents, payable in advance to the Superintendent, Government Publications Bureau, P. O. Box 500, Colombo 1**

---

ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රිතයි

இலங்கை, வாழைச்சேனை ஈஸ்டேர்ண் பேப்பர் மில்ஸ் கோப்பரேஷனுல் உற்பத்தி செய்யப்பட்ட காகிதத்தில், இலங்கை அரசாங்க அச்சகத்திற் பதிப்பிக்கப்பெற்றது

Printed at the Government Press, Ceyion, on paper manufacoured at the Eastern Paper Mills Corporation, Valaichchenai, Ceylon.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org